සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை

Employees' Trust Fund Board

# Persistent COMMITMENT

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2023

# නිබඳ කැපවීම

වැඩකරන සුවහසක් මානව සම්පතට, සුවිශේෂී මෙහෙවරක් සැපයිමේ අදිටනින් ස්ථාපිත **සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**, ගුණාත්මක මෙන්ම ධනාත්මක සිතිවිලි වලින් අනූන සේවක පිරිසකගේ අතිමහත් කැපවීම මෙන්ම නව්‍යකරණය හරහා දැනුම මෙහෙයවීම, නව ආකල්පවලට ඉඩකඩ ලබා දිම මෙම වේගවත් සාර්ථක ගමන් මගට මහත් අත්වැලක්වූ බව නොරහසකි.

මණ්ඩලයේ කාර්ය භාරය, ගෞරවනීය මෙන්ම, අමිලවු මෙහෙවරක්ය යන අරමුණ පෙරදැරිව, සේව්‍ය සේවක දෙපාර්ශයේම විශ්වාසය සුරකිමින් සුවිශේෂ සංධිස්ථානයකට ළඟාවිමේ තෘප්තිය අප සතුව ඇත.

දැඩි විනයකින් යුතු මූල්‍ය පාලනය හා අයෝජනය, මණ්ඩලයේ ගමනට ශක්තියක් වූවා මෙන්ම, එය අපගේ දැක්මට අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්කරමින් "**නිබඳ කැපවීම**" හමුවේ විවිධ අභියෝග ජයගනිමින් නොනවත්වා ඉදිරියම බලා ගමන් කරමින් සිටී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2023

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

19 - 23 මහළ, "මෙහෙවර පියෙස"
තැ.පෙ. 807, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011 7747201 | ෆැක්ස්: 011 2503917
ඊමේල්: finance@etfb.lk
වෙබ් අඩවිය: www.etfb.lk

# අන්තර්ගතය


| | |
|---|---|
| වාර්තාවේ අන්තර්ගතය | 05 |
| අප කවුරුන්ද යන වග | 06 |
| ප්‍රධාන මූල්‍ය තත්ත්වයන් | 07 |
| ප්‍රධාන සන්ධිස්ථාන | 08 |
| අගය නිර්මාණය කිරීමේ මාදිලිය | 10 |
| මණ්ඩලයේ කොට්ඨාශ/ අංශ/ ඒකකවල කාර්යයන් | 12 |
| කාර්ය සාධන සමාලෝචනය | 14 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 16 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 20 |
| කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය | 23 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 46 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 58 |
| කළමනාකාරිත්ව කණ්ඩායම | 65 |
| ආයතනික පාලනය | 67 |
| අනු කමිටු | 73 |
| අවදානම් කළමනාකරණය | 79 |
| **මූල්‍ය තොරතුරු** | |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 89 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 91 |
| ස්කන්ධ වෙනස්වීම් පිළිබද ප්‍රකාශය | 92 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 94 |
| භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙදපොල අගය | 95 |
| ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙදපොල අගය | 97 |
| ස්කන්ධ ආයෝජන ප්‍රකාශය | 98 |
| මූල්‍ය ප්‍රකාශ සදහා සටහන් හා වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති | 102 |
| **අතිරේක තොරතුරු** | |
| විගණකාධිපති වාර්තාව 2023 | 141 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලීය නිරීක්ෂණ | 154 |
| දස වසරක සංක්ෂිප්තය | 469 |
| මූල්‍ය තත්වය පිළිබද ප්‍රකාශය | 470 |
| සංඛ්‍යා ලේඛණ ඇමුණුම් | 471 |
| අපේ ළගාවීම් | 474 |

# වාර්තාවේ **අන්තර්ගතය**

මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 43 වන වාර්ෂික වාර්තාව වන අතර, මෙමගින් ආයතනය 2023 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි.

2023 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර, ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් සංවර්ධනය කර ඇත.

## වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමඟ කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනම වටිනාකම් නිර්මානය කිරීමේ අද්විතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර, එහි මූල්‍ය කාර්ය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසැඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාවද මෙම වාර්තාව තුළ ඇත.

## වාර්තාවේ අනුකූලතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආචාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමඟ ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

## උපාය මාර්ගික දිශානතිය

වසර පුරා කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, මෙම වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ගේ අභිවෘධිය සඳහා මණ්ඩලයේ වත්මන් සහ අනාගත කාර්යයන් පිළිබද අවබෝධයක් ලබාදෙයි.


**විමසීම් කලයුතු නිලධාරීවරයා**

**එම්.ඒ.කේ. අළුත්ගමගේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්) වැ.බ.

**කේ.ඩී.ඒ.පී. කරුණාරත්න**
සහකාර සාමාන්‍යාධිකාරී
(මුදල්)

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
දුරකථන: +94 11 7747250
ෆැක්ස්: +94 11 7747209
විද්‍යුත් ලිපිනය: finance@etfb.lk

# අප කවුරුන්ද යන වග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොපාන සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර, එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

## මණ්ඩලයේ අරමුණු

(1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 07 වගන්තිය අනුව)

(අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධි විධාන සැලැස්වීම: සහ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

## අපගේ වගකිම්හි ප්‍රස්තුතය

### දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශ්වකරුවන් සඳහා වූ ක්‍රියාශීලි හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

### මෙහෙවර

සාමාජිකයින් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ට සේවාවක් සලසන සුහදශීලි හා විචක්ෂණශීලී භාරයක් වීම.

### වටිනාකම්

- නිර්මාණශීලි, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශීලී සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ට ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය
- තෘප්තිමත් පාරිභෝගිකයින්

# ප්‍රධාන මූල්‍ය තත්වයන්

| | 2023 | 2022 | වෙනස |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | % |
| **මෙහෙයුම්** | | | |
| මුළු ආදායම | 67,792,678 | 46,121,938 | 46.99% |
| මුළු පොළී ආදායම | 64,380,505 | 46,316,209 | 39% |
| මුළු වියදම | 2,833,648 | 2,694,206 | (5.18%) |
| මෙහෙයුම් වියදම් | 1,640,882 | 1,648,344 | 0.45% |
| බදුවලට පෙර ලාභය | 64,959,030 | 43,427,732 | 49.58% |
| බදු වියදම | 9,016,645 | 6,449,427 | (39.81%) |
| බදුවලට පසු ලාභය | 55,942,384 | 36,978,305 | 51.28% |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 898,585 | 584,266 | 53.80% |
| FVTPL හි මූල්‍ය වත්කම් | 4,463,977 | 2,887,168 | 54.61% |
| FVTOCI හි මූල්‍ය වත්කම් | 10,764,966 | 8,646,578 | 24.50% |
| ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් | 499,504,778 | 444,308,492 | 12.42% |
| සාමාජික අරමුදල් සහ සංචිත | 518,804,839 | 460,561,415 | 12.65% |
| **සාමාජික දෘෂ්ටි කෝණය** | | | |
| සාමාජික අරමුදල | 504,434,709 | 459,630,606 | 9.75% |
| පොළී සහ ලාභාංශ | 45,861,319 | 36,981,107 | 24.01% |
| පොළී හා ලාභාංශ ප්‍රතිශතය (%) | 10% | 8.75% | 1.25% |
| සාමාජික ප්‍රතිලාභ | 549,153 | 477,055 | 15.11% |
| ආයෝජන මත ප්‍රතිලාභ | 13.82% | 10.01% | 3.81% |
| ස්කන්ධ මත ප්‍රතිලාභ | 11.61% | 8.05% | 3.56% |
| වත්කම් මත ප්‍රතිලාභ | 11.31% | 7.95% | 3.36% |

**මුළු වත්කම**
(රු. මිලියන)
**524,511**
464,997 (2022)

**වර්ෂයේ ලාභය**
(රු. මිලියන)
**55,942**
36,978 (2022)

**සාමාජික අරමුදල**
(රු. මිලියන)
**504,435**
459,631 (2022)

# ප්‍රධාන **සන්ධිස්ථාන**

**1986**

මරණ ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය
රු.100,000

**1989**

මරණ ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය:
නිත්‍ය දුබලතා
ප්‍රතිලාභ යෝජනා
ක්‍රමය රු.200,000

**1991**

මරණ ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා
ප්‍රතිලාභ යෝජනා
ක්‍රමය
හදවත් සැත්කම්
සඳහා මූල්‍යාධාරය
රු.300,000

**1992**

මරණ ප්‍රතිලාභ යෝජනා
ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා
මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂි කාච
බද්ධ කිරීමේ වියදම්
ප්‍රතිපූර්ණය රු.18,000

**1994**

මරණ ප්‍රතිලාභ යෝජනා
ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා
මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂි කාච
බද්ධ කිරීමේ වියදම්
ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව
සමත් දූදරුවන් 9,000 ක්
සඳහා රු. 15,000/=
බැගින් මූල්‍යාධාර

**1997**

මරණ ප්‍රතිලාභ යෝජනා
ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා
මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ
කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත්
දූදරුවන් සඳහා මූල්‍යාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය
රක්ෂණ යෝජනා ක්‍රමය
වසරකට රු.25,000 බැගින්
රු.50,000 ක් උපරිමයක්
දක්වා මුළු සේවාකාලය
තුළදී

**2002**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුලාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
**"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය**

**2006**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුලාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
**වකුගඩු බද්ධ කිරීමේ සඳහා මුලාධාරː රු.300,000**

**2010**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුලාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීමේ සඳහා මුලාධාර
**අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මුලාධාර රු.12,000 බැගින් ශිෂ්‍යත්ව 5,000**

**2016**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුලාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීමේ සඳහා මුලාධාර
අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මුලාධාර
**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රු.30,000 ක් දක්වා වැඩි කරන ලදි**

**2022**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මුලාධාර
**හදවත් සැත්කම් සඳහා මුලාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදි**
**වකුගඩු බද්ධ කිරීම සඳහා මුලාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදි**

**2023**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුලාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලාධාර
ශ්‍රමසුව රැකවරණ
රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීමේ සඳහා මුලාධාර
**අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දුදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මුලාධාරය "නිපුනතා සවිය" රු.50,000**

# අගය නිර්මාණය කිරීමේ මාදිලිය

## අගයන් සබලකාරක (ආදාන)

### ආයෝජන ප්‍රාග්ධනය

- සාමාජික අරමුදල - බිලියන 460

### සාමාජික ප්‍රාග්ධනය

- මුළු සේවායෝජකයන් 75,485
- මුළු සක්‍රිය සාමාජික ගිණුම් මිලියන 2.5
- ස්වයං රැකියා හා සංක්‍රමික සේවා 42,753 සේවකයින්

### සේවක ප්‍රාග්ධනය

- මුළු කාර්ය මණ්ඩලය 882
- කාර්ය මණ්ඩලයෙන් 40% වැඩි පිරිසකට මණ්ඩලය සමඟ වසර 20 කට වැඩි පළපුරුද්ද ඇත
- දක්ෂ, පුහුණු සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

### හවුල්කාර ප්‍රාග්ධනය

- මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- සේවක අර්ථසාධක අරමුදල (EPF)
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

### සමාජ සහ ප්‍රජා ප්‍රාග්ධනය

- වැඩකරන පුද්ගලයින්

## අගය නිර්මාණය (ක්‍රියාවලි)

### දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### ඉලක්ක හා අරමුණු

### උපාය මාර්ග සහ කටයුතු

### මූලික කටයුතු

- දායක මුදල් රැස්කිරීම්
- ක්‍රියාත්මක කිරීම්
- සේව්‍ය සම්බන්ධතා
- සාමාජික සේවා
- ආයෝජන

### ද්විතීය කටයුතු

- මූල්‍ය
- තොරතුරු තාක්ෂණය
- මානව සම්පත්
- අභ්‍යන්තර විගණන
- සංඛ්‍යා ලේඛණ

### 1980 අංක 46 දරණ පනත

- ආයතනික යහපාලනය
- ආයතනික අවදානම් කළමනාකරණය

## නිර්මාණය කල වටිනානම (නිමැවුම්)

### අයෝජකයන්

- සාමාජික අරමුදල — බිලියන 504
- අයෝජන මත ප්‍රතිලාභ — 13.82%

### සාමාජිකයන්

- පොළිය — 3%
- ලාභාංශ — 7%

### සේවකයින්

- පුද්ගල වියදම් — බිලියන 1.3
- පුහුණු හා සංවර්ධන පිරිවැය — මිලියන 6.2
- සේවක පිරිවැටුම — 5% ට අඩු

### ප්‍රජාව

- හිමිකම් ගෙවීම (පොළි හා ලාභාංශ ඇතුළුව) — බිලියන 38
- හෘද සැත්කම් — මිලියන 142
- මරණ ප්‍රතිලාභ — මිලියන 157
- වසර 5 ශිෂ්‍යත්වය — මිලියන 193
- උසස් අධ්‍යාපනික දීමනාව — මිලියන 74
- ශ්‍රම සුව යෝජනා ක්‍රමය — මිලියන 20
- නිත්‍ය දුබලතා — මිලියන 23
- වකුගඩු බද්ධ කිරීම් — මිලියන 5
- අභ්‍යන්තර අක්ෂි කාච — මිලියන 7

# මණ්ඩලයේ
# **ප්‍රධාන ක්‍රියාකාරකම්**

01

## දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවකයන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

## ආයෝජන

02

ආයෝජන අංශය යනු, මණ්ඩලයේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනය සතු ප්‍රධාන ව්‍යාපාරික ඒකක වලින් එකකි. මෙම ඒකකයේ ප්‍රධාන අරමුණු වන්නේ ආයෝජනවල ආරක්ෂාව සහතික කිරීම, ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම සහ ප්‍රශස්ත ප්‍රතිලාභ ඉපයීම යන කාර්ය භාරයයි. ආයෝජන තීරණ ගැනීම සඳහා වූ මාර්ගෝපදේශයක් ලෙස පුළුල් ආයෝජන ප්‍රතිපත්තියක් ආයතනය සතුව පවතී.

03

## සාමාජික සේවා

මෙම කොට්ඨාශය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හීලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තර්ගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

## මුදල්

04

මුදල් කොට්ඨාශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හීලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙළ කිරීම.

05

## පරිපාලන හා මානව සම්පත්

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදිනු ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබා දීම සඳහාත් විවිධ මුල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

## තොරතුරු තාක්ෂණ

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කොට්ඨාශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

06

07

## අභ්‍යන්තර විගණන

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්, එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වරයා වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායි මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය. රජයේ විගණන කටයුතු සම්බන්ධිකරණය කිරිමේ කටයුතුද අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ මගින් සිදුකරනු ලැබේ.

## නීති

මණ්ඩලයට අදාළ වන්නාවූ සියළුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ නීති අංශය ක්‍රියාත්මක වේ.

08




# කාර්ය සාධන සමාලෝචනය

## අගය එකතු කිරීමේ ප්‍රකාශය

මණ්ඩලයේ අගය නිර්මාණය පිළිබඳ විශ්ලේෂණයක් සහ සමූහයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර වෙන්කිරීම පහතින් දැක්වේ.

| | 2023<br>රු.මිලියන | 2022<br>රු.මිලියන | වෙනස<br>% |
|---|---|---|---|
| **එකතුකල වටිනාකම** | | | |
| ප්‍රධාන ව්‍යාපාරවලින් උපයන ලද ආදායම | 67,118.20 | 45,677.35 | 46.94 |
| සේවා පිරිවැය | (357.33) | (292.05) | (22.35) |
| **ප්‍රධාන ව්‍යාපාරවලින් එකතුකල වටිනාකම** | **66,760.87** | **45,385.29** | **47.10** |
| වෙනත් ආදායම් | 674.48 | 444.59 | 51.71 |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | (51.45) | 76.82 | 166.97 |
| **වටිනාකම එකතුකිරීම** | **67,383.90** | **45,906.70** | **46.78** |
| | | | |
| **වටිනාකම වෙන්කිරීම සේවකයන්ට** | | | |
| වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ | 1,392.11 | 1,392.35 | 0.02 |
| | | | |
| **සාමාජිකයන්ට** | | | |
| සාමාජිකයන්ට ගෙවූ පොළිය | 13,758.50 | 12,679.22 | (8.51) |
| සාමාජිකයන්ට ගෙවූ ලාභාංශ | 32,102.82 | 24,301.89 | (32.10) |
| | | | |
| **රජයට** | | | |
| බදු වියදම් | 9,016.65 | 6,449.43 | (39.81) |

| | 2023 | 2022 | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| **ප්‍රජාවට** | | | |
| සාමාජික ප්‍රතිලාභ | 549.15 | 477.05 | (15.11) |
| | | | |
| **ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා** | | | |
| රඳවාගත් ලාභ | 210.12 | 570.70 | (63.18) |
| ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය | 40.55 | 36.06 | (12.45) |
| ලාභාංශ සමකිරීමේ සංචිතය | 10,314 | - | 100 |
| | | | |
| **වෙන්කළ මුළු වටිනාකම** | **67,383.90** | **45,906.70** | **46.78** |

## එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. එකතුකළ ආර්ථික වටිනාකම යනු සැලැකිය යුතු අවදානමට කොටස් හිමියන් සඳහා අවශ්‍ය අවම ප්‍රතිලාභ ඉක්මවා යන හෝ අඩුකරන ඉපයීම් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවයි.

| | 2023 | 2022 |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| **ආයෝජිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය සාමාජික අරමුදල | 482,032.66 | 432,959.75 |
| එකතුකළා: ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | 35.02 | 86.47 |
| | **482,067.68** | **433,046.22** |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ** | | |
| බදුකරණය පසු ලාභය | 55,942.38 | 36,978.31 |
| එකතුකළ ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | (51.45) | 76.82 |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය** | **55,890.93** | **37,055.13** |
| | | |
| අයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය | (79,824.61) | (108,218.25) |
| **එකතුකළ ආර්ථික වටිනාකම්** | **(23,933.68)** | **(71,163.12)** |

*2023 සාමාන්‍ය බරතබන ලද - 16.56% මාස 12 භාණ්ඩාගාර බිල්පත් මත පදනම් වී ගණනය කරන ලදී (2022 - 24.99%)



# සභාපතිවරයාගේ සමාලෝචනය

අහිතකර ආර්ථික හා සාමාජීය තත්වය හමුවේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙන කවරදාකටත් වඩා ශක්තිමත් භාවයක් සහ වඩා ඔරොත්තු දීමේ හැකියාවක් මතු කර ගනිමින්, එහි නොසැලෙන ශක්තිය ඔප්පු කර පෙන්වා ඇත. පසුගිය වසරේ අත්දුටු අතීත අඳුරු සේයා පිළිබඳව මෙනෙහි කරන විට, අප එසේ කරන්නේ, අපගේ පාර්ශවකරුවන්ගෙන් ලද නොසැලෙන සහයෝගයෙන් සවිමත් වූ ශුභවාදී හැඟීම් පෙරදැරි කර ගනිමිනි. ස්ථාවරත්වය, සෞභාග්‍යය සහ තිරසර සාර්ථකත්වය මගින් නිර්වචනය කරන ලද අනාගතයක් කරා වූ ගමන් මාර්ගයක් සනිටුහන් කෙරෙන අනාගත අභියෝග වෙත අප සැම එක්ව ගමන් කළ යුතු වන්නෙමු.

## හිතවත් පාර්ශවකරුවනි,

2023 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් ප්‍රීතිය දනවන කරුණකි. ආර්ථිකය තවදුරටත් යථා තත්ත්වයට පත්වෙමින් ඇති අවස්ථාවක, අභියෝගාත්මක පසුබිමක් මත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අත් කර ගන්නා ලද ප්‍රශංසනීය මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කිරීමට ලැබීම ගැන මම ඉතා සතුටු වෙමි.

පෙර නොවූ විරූ ආර්ථික කැළඹීම් හමුවේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය නොසැලෙන කැපවීමකින් සිය කාර්ය මෙහෙවර ඉටු කරමින් ඊට ශක්තිමත්ව ඔරොත්තු දෙමින් කටයුතු කළේ ය. කැළඹිලි සහිත වූ භූ දර්ශනය හමුවේ එල්ල වූ බලවත් බාධා මධ්‍යයේ වුව ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සාමාජිකයින් කෙරෙහි සහ පුළුල් ආර්ථික බලපෑම විෂයයෙහි වූ ස්වකීය කැපවීම හා බැඳියාව තව දුරටත් ස්ථාවරව පවත්වා ගත්තේ ය.

## ආර්ථික කැළඹීම තරණය කිරීම

2023 වර්ෂය, ජාතියේ මූල්‍ය භූ දර්ශනය ඉදිරියේ අවිනිශ්චිත තාවයේ සෙවනැලි වල සේයා අතුරමින් අසමසම ආර්ථික අභියෝග ඒ කරා ගෙන ආවේ ය. එක් පසෙකින්, උද්ධමනය ඉහළ ගිය අතර අනෙක් පසින්, පොලී අනුපාත ඉහළ ගියේය. රුපියල සීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම ආර්ථිකය තුළ බලවත් සහකම්පන ඇති කළේ ය. මෙම කැලඹීම යථාවත් කර ස්ථාවර කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග දැඩි ස්වභාවයක් ගත් නමුත් ඒවා අත්‍යවශ්‍ය වූ අතර, එම තත්ත්වය ප්‍රකෘතිමත් වීම සඳහා වූ අඩිතාලම අවසානයේ දී ඉන් ගොඩනගා ගත හැකි විය.

දළ දේශීය නිෂ්පාදිත වර්ධනය තුළ 2023 වසරේ දී පිළිබිඹු වූ 2.3% ක සෘණ අගය, පැවති මූල්‍ය පරිසරය හරහා අර්බුදයේ ප්‍රතිවිපාක තව දුරටත් රාව ප්‍රතිරාව නැංවීමට සැලැස්වීය. කෙසේ වෙතත්, මෙම අහිතකර තත්වය මධ්‍යයේ වුව ද, බලාපොරොත්තුවේ පහන් සිළු දිස් විය. කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාත, වරක් සෘණාත්මකව ගිලී ගොස්, ක්‍රමයෙන් ශුභවාදී දිශාවකට නැවත වරක් යොමු විය. 11.5% ක් වූ පළමු කාර්තුව තුළ වාර්තා වූ දැඩි හැකිලීම එතැන් සිට සිව්වන කාර්තුව වන විට, දිරිගන්වන සුළු 4.5% ක් වූ වර්ධනයක් දක්වා ප්‍රකෘතිමත් භාවයේ ගමන් පථය හෙළි පෙහෙළි කර ගැනීමට හැකියාව සලසා ගත්තේ ය.

අහිතකර ආර්ථික හා සාමාජීය තත්වය හමුවේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙන කවරදාකටත් වඩා ශක්තිමත් භාවයක් සහ වඩා ඔරොත්තු දීමේ හැකියාවක් මතු කර ගනිමින්, එහි නොසැලෙන ශක්තිය ඔප්පු කර පෙන්වා ඇත. පසුගිය වසරේ අත්දුටු අතීත අඳුරු සේයා පිළිබඳව මෙනෙහි කරන විට, අප එසේ කරන්නේ, අපගේ පාර්ශවකරුවන්ගෙන් ලද නොසැලෙන සහයෝගයෙන් සවිමත් වූ ශුභවාදී හැඟීම් පෙරදැරි කර ගනිමිනි. ස්ථාවරත්වය, සෞභාග්‍යය සහ තිරසර සාර්ථකත්වය මගින් නිර්වචනය කරන ලද අනාගතයක් කරා වූ ගමන් මාර්ගයක් සනිටුහන් කෙරෙන අනාගත අභියෝග වෙත අප සැම එක්ව ගමන් කළ යුතු වන්නෙමු.

2023 වසරේ දේශීය ණය ප්‍රශස්තකරණය කිරීමේ කාර්යය සඳහා රජය විසින් දරන ලද ප්‍රයත්නයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළේ ය. සාමාජික අරමුදලේ ස්ථායීතාවය සහතික කරන අතරම රාජ්‍ය ණයවල තිරසාර භාවය කෙරෙහි එකී කාර්ය භාරය හරහා දායකවීමට මණ්ඩලයට හැකි වූ බැවින් මෙම මැදිහත්වීම ඉතා වැදගත් විය. රාජ්‍ය ණය විෂයයෙහි ඊට අදාළ තිරසාර ඉලක්ක ඵලදායී ලෙස ස්ථාවර කිරීම සහ කළමනාකරණය කිරීම අරමුණු කරගත් ජාතික ආර්ථික ප්‍රතිපත්ති සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ක්‍රියාකාරී සහභාගිත්වයක් සලසා දී ඇති බව මෙයින් පිළිබිඹු වේ.

## මූල්‍යමය කාර්ය සාධනය

සැලකිය යුතු වැදගත් ජයග්‍රහණයක් වාර්තා කරමින් මණ්ඩල කළමනාකරණය යටතේ පවත්නා වත්කම් රුපියල් බිලියන 525 ක් වූ ප්‍රමාණයක් දක්වා ළඟා වූ අතර, එමඟින් අප අරමුදල, 2023 වර්ෂය තුළ යම් ආකර්ෂණීය වර්ධනයක් අත්විඳ ගත් බව පැහැදිලි ය. සාමාජික අරමුදල 9.7% කින් රු. බිලියන 504 ක් වූ ප්‍රමාණයක් දක්වා ද, එහි ආයෝජන කළඹ 12.9% කින් රු. බිලියන 515 ක් වූ ප්‍රමාණයක් දක්වා ද ඉහළ ගිය අතර, එමගින් 2023 මූල්‍ය වර්ෂය අවසන් වන විට, සවිමත් ස්ථාවරත්වයක් සහ අගය ආරෝපණයක් විද්‍යාමාන කළේ ය.

සමස්ත ආදායම, රුපියල් බිලියන 67.8 දක්වා සැලකිය යුතු මට්ටමක් වූ 47% ක ප්‍රමාණයකින් වැඩි වීමත් සමඟ අරමුදල ඉතා සුවිශේෂී අකාරයකින් ක්‍රියා කර ඇති බව ද පෙනෙන්නට තිබේ. තවද, 2023 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වසර සඳහා වූ ලාභය, රුපියල් බිලියන 65 ක් දක්වා ඉහළ යාම තුළින් උපදවන ලද බදු ගෙවීමට පෙර ලාභයේ කැපී පෙනෙන 50% ක් වූ ප්‍රමාණයේ වැඩිවීම, ඉහළ යන වෙළෙඳපොළ අනුපාතවල වාසිදායක තත්ත්වය සලසා ගන්නා අතරම ඵලදායී කළමනාකරණය සහ උපායමාර්ගික තීරණ ගැනීම හරහා මණ්ඩලය විසින් අත් කර ගන්නා ලද එකක් බව නිරූපණය වේ.

5% ක් වූ සාමාන්‍ය මට්ටමේ වැඩිවීමක් පමණක් සහිතව රජයේ වියදම් සීමා මාර්ගෝපදේශ තුළ මණ්ඩලයේ සම්පූර්ණ වියදම් පවත්වාගෙන යාමට හැකිවීම, එහි අරමුදල තුළ පැවති විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය පිළිබිඹු කරයි. මෙම විනය ගරුක ප්‍රවේශය, නියාමන අවශ්‍යතාවලට අනුකූලව යමින් සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන්කර දීම සහතික කරයි.

තම සාමාජිකයින්ට ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් වූ අරමුදලේ කැපවීම, 10% ක් වූ සම්පූර්ණ ප්‍රතිලාභ ප්‍රමාණයක් ස්වකීය සාමාජිකයින් වෙත ලාභාංශ සහ පොලී ලෙස

බෙදා හැරීම තුළින් මැනවින් පිළිබිඹු කරයි. මෙම ප්‍රතිලාභ බෙදා හැරීම සාමාජිකයින්ට ඔවුන්ගේ අරමුදල කෙරෙහි වූ විශ්වාසය සඳහා ත්‍යාග පිරිනැමීමක් පමණක් නොව ප්‍රමුඛ සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස එහි විශ්වසනීයත්වය ද ප්‍රතිශක්තිමත් කරන්නකි.

තවද, වසර පුරාවට රුපියල් මිලියන 549 ක සාමාජික ප්‍රතිලාභ ලබා දීමෙන් අරමුදලේ සාමාජික සාමාජිකාවන්ට සහයෝගය දැක්වීමට සහ ඔවුන් කෙරෙහි ඇති වගකීම් ඉටු කිරීමට ඇති කැපවීම ද එමගින් ඉස්මතු කර දක්වයි.

තාක්ෂණික අධ්‍යාපනය තුළ තම වෘත්තීය මාර්ගය දියුණු කර ගැනීම සඳහා මුල පුරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සාමාජිකයින්ගේ අවශ්‍යතා ඇති දූ දරුවන් වෙත මූල්‍ය ආධාර ලබා දීම සඳහා **"නිපුණතා සවිය"** නමින් නව ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් 2023 වසර තුළ දී හඳුන්වා දෙන ලදී. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3, 4 සහ 5 යන මට්ටමේ පිළිගැනීමක් සහිත තෝරාගත් විවිධ පාඨමාලා 100 ක් සඳහා රුපියල් 50,000 ක මූල්‍ය ප්‍රදානයක් මේ සඳහා ප්‍රදානය කරනු ලැබේ.

සමස්තයක් වශයෙන්, මෙම ක්‍රියා මාර්ග තුළින් මණ්ඩලීය අරමුදල විශ්වාසදායක වූ ද, අපේක්ෂා සහගත වූ ද සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස ස්ථානගත වෙමින් එහි වගකීම් භාරකාරත්වය, සාමාජික තෘප්තිය සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා වන කැපවීම අවධාරණය කර දක්වයි.

## පරිපාලිත සමාගමේ කාර්ය සාධනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අනුබද්ධිත ලංකා ලුණු සමාගම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් සාර්ථක වසරක් නිම කළේ ය. රුපියල් මිලියන 315 ක් වූ එහි ලාභාංශ ප්‍රමාණය තුළින් නිරූපණය කරන්නේ, ලංකා ලුණු සමාගම එම කාල වකවානුව තුළ සැලකිය යුතු ආදායමක් සහ ලාභයක් උපයා ඇති බවයි. ලාභාංශ යනු, සාමාන්‍යයෙන් මූල්‍ය සෞඛ්‍යය සහ ලාභය පිළිබිඹු කරමින් කොටස් හිමියන් වෙත ප්‍රකාශ කර බෙදා හරිනු ලබන සමාගමක ඉපැයීම්වල යම් කොටසකි. මෙම දායකත්වය හරහා සමාලෝචිත වසර සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සමස්ත මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය තව දුරටත් ශක්තිමත් වූ බව පෙනෙන්නට තිබේ.

## ඩිජිටල් අනාගතය හා සබැඳි ක්‍රියාදාම වැඩි දියුණු කිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහාත්, අනාගතයට සූදානම්ව පෙළ ගැසී සිටින ආයතනයක් ලෙස ස්ථානගත වීම සඳහාත් ඩිජිටල්කරණය වැළඳ ගැනීම අතිශය ප්‍රශංසනීය කටයුත්තකි. ව්‍යාපාර ක්‍රියාවලීන් විධිමත් කිරීමට සහ ඊට සහාය වීමට තාක්ෂණය උපයෝගී කර ගැනීමෙන්, තම සේවාවන්හි වේගවත් බව වැඩි දියුණු කර ගැනීමටත්, පිරිවැය අවම කර ගැනීමටත්, තම පාර්ශවකරුවන්ට වඩා හොඳ සේවයක් සලසා දීමටත් අරමුදලට හැකියාව ලැබෙන්නේ ය.

නව පද්ධතිය, සාමාජිකයින් දෙස අවධානය යොමු කරමින් සැලසුම් කර ඇති අතර ඔවුන්ගේ අත්දැකීම් වැඩි දියුණු කරන සහ සේවා යෝජකයා විසින් කෙරෙන දායක මුදල් ගෙවීමේ ක්‍රියාවලිය හා හිමිකම් ආපසු ගෙවීමේ සහ ප්‍රතිලාභ හිමිකම් සැකසීමේ ක්‍රියාවලිය පහසු කරන අන්තර්ජාල ද්වාරයකින් ද එය සමන්විත වනු ඇත. මීට අදාළ ව්‍යාපෘතිය දැනට එහි අවසන් අදියරේ පවතී. 2024 වසරේ අග භාගය වන විට නව පද්ධතිය ක්‍රියාත්මක භාවයට පැමිණෙනු ඇති අතර එය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලීය සේවා ඉතිහාසයේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කරනු ඇත.

## අපගේ මානව සම්පත

ආයතනයේ ප්‍රගමනය සහ සාර්ථකත්වය මෙහෙයවීමේ දී මානව සම්පත් සංවර්ධනයේ තීරණාත්මක කාර්ය භාරය මණ්ඩලය විසින් හඳුනා ගනු ලැබ ඇති බව ඉතා ප්‍රකට කරුණකි. කාර්ය මණ්ඩලයේ බහුකාර්ය ප්‍රවීනතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම මගින් සහ එහි පරිපාලන පද්ධතියේ ප්‍රතිව්‍යුහගත කිරීම් සහ වෙනස්කම් සිදු කිරීම් සමඟ ඔවුන් අඛණ්ඩව පවතිනු ඇති බවට වගබලා ගැනීම තුළින්, සිය ආයතනික හැකියාවන් ඉහළ නැංවීම කෙරෙහි මණ්ඩලය මනා කැපවීමක් ප්‍රදර්ශනය කර ඇති බව මෙහි දී කිව යුතු ය.

2023 කාල සමය, ඉතා අභියෝගාත්මක වසරක් වූ අතර, බොහෝ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සේවයෙන් විශ්‍රාම ගොස් සිටි අතර, ඔවුන්ගෙන් සමහරෙක් වඩා හොඳ රැකියා අවස්ථා සඳහා ද තම සේවයෙන් ඉල්ලා අස්වී ඇත. එවැනි තත්ත්වයන් යටතේ, දැඩි කාර්ය මණ්ඩල හිඟයක බලපෑමට ලක් වෙමින් සිය මෙහෙයුම් කාර්යයන් කළමනාකරණය කර ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට සිදු විය.

කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින්, අඛණ්ඩ ඉගෙනීම සහ කුසලතා සංවර්ධනය සඳහා මණ්ඩලය තුළ පැවති කැපවීම පෙන්නුම් කරයි. විවිධ අත්දැකීම් සහ ඉදිරි අරමුණුවලට සේවකයින් නිරාවරණය කිරීම මගින් ඔවුන්ගේ ප්‍රගුණතාව වඩා පොහොසත් බවට පත් කළ හැකි වන අතර, වඩාත් කාර්යශූරී සහ අනුවර්තනය විය හැකි ශ්‍රම බලකායක් බල ගැන්වීම උදෙසා ද ඒ හරහා දායක විය හැකි ය.

මානව ප්‍රාග්ධනය පුළුල් ලෙස ආවරණය කිරීමක් සහිතව කාර්යක්ෂම හා ඵලදායී මානව සම්පත් කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) ක්‍රියාත්මක කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද, නව නිපුණතා ආකර්ෂණය කර ගැනීම සහ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම්, තාක්ෂණික වැඩි දියුණු කිරීම් සහ පුහුණුව හා සංවර්ධනය යන කටයුතු තුළින් වත්මන් සේවක කණ්ඩායමේ දැනුම, කුසලතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමත්, නවෝත්පාදනය හා විශිෂ්ටත්වය බැඳි සංස්කෘතියක් පෝෂණය කිරීමේ කැපවීමත් අවධාරණය කරයි.

සමස්තයක් වශයෙන්, මානව සම්පත් සංවර්ධනය සඳහා මණ්ඩලයේ ක්‍රියාකාරී ප්‍රවේශය සහ ශීඝ්‍රයෙන් වෙනස් වන පරිසරයක් තුළ එහි පාර්ශවකරුවන්ගේ පුළුල් ලෙස විකාශනය වන අවශ්‍යතා සපුරාලීම පිණිස ද, ඒ වෙනුවෙන් උද්යෝගිමත්ව හා ඊට අනුවර්තනය වී කටයුතු කිරීමට මෙන්ම ඊට සුදුසු ධාරිතාවයෙන් පිරිපුන්ව කටයුතු කිරීම පිණිස ද සහතික වීම සඳහා තම ආයතනය සතු කැපවීම මෙම මුලපිරීම් මගින් ඉස්මතු කර දක්වයි.

## සම්මාන තිළිණ සහ පුද ප්‍රශංසා

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට අනුබද්ධ රාජ්‍ය අංශයේ අනු කණ්ඩායක් වන ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සමුළු ශාලාවේ දී අවසන් වූ 2022 රාජ්‍ය ආයතනය සඳහා වූ හොඳම වාර්ෂික වාර්තා සම්මාන තරගයේ දී එම කාණ්ඩය සඳහා වූ රන් සම්මානය තමන් සතු කර ගැනීමට මණ්ඩලය සමත් විය.

රාජ්‍ය අංශයේ ආයතනවල වාර්ෂික වාර්තා වාර්තාකරණය සිදු කිරීමේ කාර්යයේ දී සහ ආයතනික හෙළිදරව් කිරීම්වල දී විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම හා ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම සම්මාන තරගය, රටේ කීර්තිමත්ම සම්මාන තිළිණ ප්‍රදානය කිරීමේ උළෙලක් ලෙස ක්‍රියා කරයි. ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා කාණ්ඩය සඳහා **"ජයග්‍රාහකයා"** ලෙස **"රන් සම්මානය"** මෙන්ම සමස්ත රාජ්‍ය අංශයේ ආයතන කාණ්ඩයේ **"ලෝකඩ සම්මානය"** ද මණ්ඩලය විසින් එහි දී දිනා ගන්නා ලදී.

## ඉදිරි ගමන් මග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සියලුම සාමාජික සාමාජිකාවන්ට ගුණාත්මක විශ්‍රාම දිවියක් ලබා ගත හැකි බව සහතික කිරීම තම සදාචාරාත්මක වගකීමක් ලෙස එහි කාර්ය මෙහෙවර විධානය තුළින් නිරීක්ෂණය කරයි. දැනට, අප ආයතනය 2024 වසර වන විට, එහි මූලික ව්‍යාපාරය ඩිජිටල්කරණයට හසු කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් විද්‍යුත් ඊ-පාලනය කරා ඉදිරි පියවර තැබිය හැකි ය. මෙම සංක්‍රාන්තිමය පරිවර්තනය මඟින් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දැඩි කැපවීමක් නිරූපණය වේ.

තවද, අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා එහි උපායමාර්ග නැවත අර්ථකථනය කර දැක්වීමට මණ්ඩලය සැලසුම් කරයි. මෙම ක්‍රියාකාරී ප්‍රවේශය යෝජනා කරන්නේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සාම්ප්‍රදායික ක්‍රමවලින් ඔබ්බට නව්‍යකරණය පිණිස සූදානම්ව සිටින බවත්, ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා එහි මෙහෙයුම් සහ උපායමාර්ග අනුවර්තනය කර ඇති බවත් ය. මෙම මුලපිරීම් වැළඳ ගැනීම මගින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අභිප්‍රාය වන්නේ, එහි මෙහෙවර සහ එහි සාමාජිකයින්ට වගකීම් ඉටු කිරීමේ ඇති හැකියාව ශක්තිමත් කෙරෙන බවටත්, ප්‍රශස්ත ප්‍රතිලාභ සහ පුළුල් පරාසයක පැතිර වෙනත් සෙසු ප්‍රතිලාභ ස්වකීය සාමාජිකත්වය වෙත සහතික වන බවටත් වග බලා ගැනීමයි.

## තුති ප්‍රණාමය පළ කිරීම

ස්වකීය විශ්‍රාමික ධනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අප මණ්ඩලයට ඇති හැකියාව කෙරෙහි තබා ඇති අචල විශ්වාසය වෙනුවෙන් අපගේ ගෞරවනීය සාමාජිකයින් වෙත මම මාගේ හද පත්ලෙන් නැගෙන කෘතඥතාව පුද කරමි. සේවා සැපයීමේ විශිෂ්ටත්වය උදෙසා අඛණ්ඩ ප්‍රයත්නයකින් කටයුතු කිරීම සඳහා ඔවුන් අප වෙත පළ කරනු ලබන මහඟු විශ්වාසය අපව දිරිමත් කරයි.

උද්යෝගයෙන් සහ කැපවීමෙන් යුතුව අභියෝගයට මුහුණ දෙමින් දැඩි බැඳීමකින් හා සේවා පෙළැඹීමකින් කටයුතු කළ අපගේ සේවක කණ්ඩායම් පිළිබඳව මම අතිශයින් ආඩම්බර වෙමි. ඔවුන්ගේ වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ කැපවීම අපගේ සාමාජික සාමාජිකාවන් වෙත උසස් සේවා අත්දැකීමක් ලබා දීම සඳහා වූ මහෝපකාරී මෙවලමක් වී තිබේ.

අප වෙත ලබා දුන් අමිල සහයෝගය උදෙසා ගරු මුදල් අමාත්‍ය තුමා වෙත මගේ විශේෂ ගෞරවාදර ස්තුතිය මම මෙහිලා පිරිනමන්නෙමි. අභියෝගාත්මක වසරක් ගත කළ කාලය මුළුල්ලේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු එතුමාගේ නිලධාරී කණ්ඩායම අප වෙත හෙළි පෙහෙළි කර දුන් නොසැලෙන මගපෙන්වීම සහ සහයෝගිතාව වෙනුවෙන් මම මගේ ප්‍රණාමය ඔවුන් වෙත ද මෙයින් පුද කරමි.

අපගේ සාර්ථකත්වය සඳහා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බුද්ධිමත් උපදෙස් සහ උපායමාර්ගික මඟ පෙන්වීම වෙනුවෙන් මම මගේ ගෞරවනීය සහෝදර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව මෙයින් පුද කර සිටිමි.

**ඩී එල් පී රෝහණ අභයරත්න**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී



# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

අප ආයතනය 2024 අවසන් වන විට, එහි මූලික ව්‍යාපාරය ඩිජිටල්කරණයට හසු කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අතර, එමඟින් විද්‍යුත් ඊ-පාලනය කරා ඉදිරි පියවර තැබිය හැකි ය. මෙම සංක්‍රාන්තිමය පරිවර්තනය මඟින් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දැඩි කැපවීමක් නිරූපණය වේ.

## මෙහෙයුම් විශිෂ්ටත්වය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වසර මුළුල්ලේම පැවති අභියෝගාත්මක තත්වයන් තුළ සිය සාමාජිකයින්ගේ අවශ්‍යතා කාර්යක්ෂමව ආමන්ත්‍රණය කරමින් ඔවුන්ගේ සේවා තෘප්තියට ප්‍රමුඛත්වය දීම කෙරෙහි අවධානය යොමු කළේ ය. මෙම අභියෝග මධ්‍යයේ වුව ද, අපේක්ෂිත සේවා ප්‍රමිතීන් පවත්වා ගෙන යාමට සහ බාධාවකින් තොරව සේවා සැපයීමට වග බලා ගැනීම පිණිස ඔවුහු සමත් වූහ. මෙම ප්‍රවේශය තුළින්, බාහිර දුෂ්කරතා මධ්‍යයේ වුව ද, ධනාත්මක සාමාජික අත්දැකීම් සහ මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට දායකත්වය සැලසිණි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තම ආයෝජන කළඹ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මගින් සහ පාරිභෝගික සේවා සහ අභ්‍යන්තර කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල්කරණය සවිබල ගැන්වීම මගින් තම සාමාජිකයින්ට ආයෝජන මත ආකර්ෂණීය ප්‍රතිලාභ ලබා දීමට ප්‍රමුඛත්වය දී ඇති බව පෙනේ. මෙම ද්විත්ව උපායමාර්ග, මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සහ සාමාජිකයින්ට ඔවුන්ගේ ආයෝජන මත සතුටුදායක ප්‍රතිලාභ ලැබෙන බවට වග බලා ගැනීම අරමුණු කරයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රට තුළ සමාජ ආරක්ෂණ අරමුදල ආශ්‍රිත භූ දර්ශනයේ අද්විතීය ආයතනයක් ලෙස ස්ථානගත කරමින් හා එහි මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා නිසි මග පෙන්වමින්, ආයතනයේ මූලික මූලධර්ම ලෙස පාරිභෝගික සේවා තෘප්තිය සහ ඔවුන්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කරයි.

නිසැකවම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තම සාමාජිකයින් උදෙසා වූ සමාජ ආරක්ෂණ ජාලයක් ලෙස, ප්‍රවේශම් සහගතව සහ කාර්යශූරීව වසර තරණය කිරීමේ තීරණාත්මක කාර්යයට ඉතා හොඳින් මුහුණ දුන්නේ ය. මෙම ප්‍රවේශය, තම සාමාජික භාරයේ පවත්වා ගැනෙන අරමුදල් ආරක්ෂා කිරීම සහ එහි වර්ධනය සහතික කරමින්, පැවති වෙළඳපළ වර්ධනයන්ට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ඉඩ හසර සලසා දුන්නේ ය. සාමාජිකයින්, සේවායෝජකයින් සහ අදාළ වෙනත් යම් සම්බන්ධිත පාර්ශවයන් ද ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීමෙන්, සමාජ ආරක්ෂණ රාමුව තුළ විශ්වාසදායක සහ



ප්‍රයෝජනවත් ආයතනයක් ලෙස ස්වකීය කාර්ය භාරයට අයත් භූමිකාව පවත්වා ගෙන යාමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි විය. පැවති අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් එහි කාර්ය මෙහෙවර විධානය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා වූ ක්‍රියාශීලී පියවර සහිතව අවදානම් කළමනාකරණය සමතුලනය කිරීම මෙම උපාය මාර්ගයට ඇතුළත් වූයේ ය.

2023 වසර තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කාර්ය සාධනය "නිබඳ කැපවීමක්" ලෙස විස්තර කිරීම තුළින්, අභියෝගාත්මක තත්වයන් මධ්‍යයේ මණ්ඩලයේ ක්‍රියාවලීන්, සම්පත් සහ ශ්‍රම බලකායේ ඔරොත්තු දීමේ හැකියාව සහ සේවාවන්ට අනුවර්තනය වීම අවධාරණය කර දක්වයි. මෙම තේමාවෙන් ඇඟවෙන්නේ, කැලඹීම් සහ අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි මෙහෙයුම් ඵලදායී ලෙස පවත්වා ගැනීමට සමත් වූ බවයි. සාමාජිකයින් සහ සේවා යෝජකයින් ඇතුළු තම පාර්ශවකරුවන් සඳහා ස්ථාවරත්වය සහ අඛණ්ඩතාව සහතික කරමින් වසර පුරා සිය මෙහෙවර සහ අරමුණු ස්ථාවරව පවත්වා ගැනීමට මණ්ඩලයට ඇති හැකියාව ඉන් ඉස්මතු කර දක්වයි. වර්තමාන සහ අනාගත පාර්ශවකරුවන්ට ප්‍රයෝජනවත් වන තිරසාර භාවිතයන් සමඟ පෙළ ගැසෙමින් දිගු කාලීන පැවැත්ම සහ වගකීම් සහිත කළමනාකරණය උදෙසා වන කැපවීමක් ද මෙම තේමාවෙන් ගම්‍යමාන වේ.

අස්ථායී පරිසරයකට මුහුණ දී තිබියදීත්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන මගින් නියම කර ඇති 3% ක අවම පොලී අනුපාත අවශ්‍යතාවය සමඟ 7% ක ලාභාංශයක් ප්‍රකාශ කිරීමට ආයතනයට හැකිවීම හරහා 2023 වසර තුළ සාධාරණ ලෙස ශක්තිමත් කාර්ය සාධනයක් ලබා ගැනීම මගින් අදාළ තත්ත්වයන්ට නිබඳ කැපවීම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ප්‍රදර්ශනය කළේ ය. සාමාජිකයින් විෂයයෙහි පවත්නා මූල්‍ය වගකීම් ඉටු කරන අතරම අභියෝගාත්මක තත්වයන් නිසි පරිදි තරණය කරමින් ඒවා සමනය කර ගැනීමට මණ්ඩලයට ඇති හැකියාව මෙම ජයග්‍රහණය මගින් අවධාරණය කරයි. විශේෂයෙන්ම, අනපේක්ෂිත ආර්ථික වාතාවරණ තුළ, සාමාජිකයින්ගේ සේවා තෘප්තිය සහ විශ්වාසය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වන ආයතනයේ ආයෝජන ක්‍රියා පිළිවෙත තුළ සතුටුදායක ප්‍රතිලාභයක් ලබා දීම පිණිස වූ මණ්ඩලයේ කැපවීම ද ඉන් පිළිබිඹු කරයි.

## රජයේ දේශීය ණය ප්‍රශස්තිකරණය කිරීම සඳහා සහභාගිත්වය

පාර්ලිමේන්තුවේ දී සම්මත කළ යෝජනාවක් මගින් අනුමත කරන ලද දේශීය ණය ප්‍රශස්තිකරණයට අදාළ මූල පිරිම් පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය 2023 ජූලි මාසයේ දී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. අදාළ හුවමාරු සංදේශයට අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මෙම භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු වැඩසටහන සඳහා සුදුසුකම් ලත් ආයතනයක් ලෙස හඳුනා ගෙන ඇත. යෝජිත හුවමාරුව අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එහි බදු අය කළ හැකි ආදායම මත වාර්ෂිකව ගෙවනු ලබන 14% ක්වූ බදු අනුපාතය නොවෙනස්ව පවතිනු ඇත.

දැනට පවතින 14% ක බදු අනුපාතය සහිත බැඳුම්කර හුවමාරු කිරීම හෝ එසේ හුවමාරු කිරීමක් නොකර 30% ක් වූ ඉහළ බදු අනුපාතයක් මත ආදායම එල්ලේ බදු ගෙවීම යන විකල්පද්වය මනාව අධ්‍යයනය කළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, වඩාත් සාධනීය විකල්පය ලෙස භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කර ගැනීම තෝරා ගැනීම සඳහා තීරණය කර ඇත. සාමාජික අරමුදලේ ස්ථාවරත්වය සහතික කරන අතරම රජයේ ණය තිරසාර මූලපිරීම් සඳහා දායක වීමට ද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කළ බැවින්, මෙය, 2023 වසරේ දී අප අවතීර්ණ වූ ප්‍රමුඛ සන්ධිස්ථානයක් සනිටුහන් කළේ ය.

## ඩිජිටල්කරණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා සබැඳි ප්‍රධාන ව්‍යාපාරයේ ඩිජිටල් ගමන් මග 2016 වසරේ දී ආරම්භ වූ අතර, සේවා යෝජකයින් සහ සාමාජිකයින් වැනි ප්‍රධාන පාර්ශවකරුවන් සඳහා පහසු ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම කෙරෙහි එතුළින් අවධානය යොමු කෙරිණි. ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුව ද, කැපී පෙනෙන වර්ධනයක් සහ සාර්ථකත්වයක් අත්කර ගැනීමට මෙම මුලපිරීම ඉවහල් වී ඇත. මෙම පද්ධතිය, අති නවීනතම ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය (ERP) ආශ්‍රිත දත්ත මූල සමුදායක් වටා නිර්මාණය කර, පාරිභෝගික සේවා තව දුරටත් වැඩි දියුණු කිරීමේ මූලික අරමුණ ඇතිව සාමාජික කේන්ද්‍රීය පරිසරයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා සකස් කර ඇත.

මෙම යෝජිත පරිගණක පද්ධතියට අනෙකුත් යෙදුම් සමඟ සම්බන්ධ වූ අතුරු මුහුණත් ද ඇතුළත් වූ අතර, සමාලෝචනයට භාජිත කාලය පුරාවටම අපේක්ෂිත වර්ධනය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම යන කාර්යයන් උදෙසා දායකත්වය සැලසී ය. මෙම ඒකාබද්ධතාවය, බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රවේශතාව වැඩි දියුණු කිරීම අරබයා ඉඩකඩ සලසනු ඇති අතර, තම සාමාජික සමූහයේ ප්‍රයෝජනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා තාක්ෂණ උත්තේජනය සහිතව කටයුතු කිරීම සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ඇති කැපවීම වඩාත් ශක්තිමත් කරනු ඇත.

## ඉදිරි දැක්ම

පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාදාම බෙදීයාම් කීපයක් කෙරෙහි අවධානය යොමු කරමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි උපාය මාර්ගික දිශාව පැහැදිලිව පෙළගස්වා ඇත :

**ලාභය සහ ආයෝජන කළඹ ආශ්‍රිත වර්ධනය:** ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සහ අරමුදලේ වත්කම් ප්‍රසාරණය කිරීම කෙරෙහි උපාය මාර්ගික අවධානය යොමු කරමින් ලාභයේ වර්ධනය සහ ආයෝජන කළඹ වර්ධනය ඉලක්ක කිරීම. ආයෝජන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ එහි කාර්ය රාමුව සමඟ සමපාත වන කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම සඳහා විචක්ෂණ ආයෝජන උපාය මාර්ග භාවිතය සහ ක්‍රියාකාරී ලෙස අවදානම කළමනාකරණය කිරීම යන කටයුතු මෙයට අනුගත විය හැකි ය.

**කාර්යක්ෂම සහ සාමාජික කේන්ද්‍රීය අත්දැකීමක් ලබා දීම:** කාර්යක්ෂමතාවයට සහ සාමාජික කේන්ද්‍රීයත්වයට ප්‍රමුඛත්වය දීම හරහා ක්‍රියාවලි විධිමත් කිරීම මගින් සාමාජික අවශ්‍යතා සහ රුචිකම් සපුරාලීමේ වැදගත්කම මින් අවධාරණය වේ. පුද්ගලානුගත සේවා පිරිනැමීම, ගිණුම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සරල කිරීම සහ ප්‍රතිචාරාත්මක පාරිභෝගික සහාය සහතික කිරීම මෙයට ඇතුළත් වීමට පිළිවන.

**මෙහෙයුම් කටයුතු පූර්ණ ඩිජිටල්කරණයට හසු කිරීම :** මෙහෙයුම් කටයුතුවල සියලුම අංශ සිසාරා ඩිජිටල් තාක්ෂණය ව්‍යාප්ත කර හැරීමෙන් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත්, වැඩි පිරිවැය අඩු කිරීම සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීමත් සිදු කළ හැකි ය. මෙයට මිනිස් අතින් සිදු කෙරෙන ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීම, ගනුදෙනු සහ සාමාජික අන්තර්ක්‍රියා සඳහා ඩිජිටල් වේදිකා ක්‍රියාත්මක කිරීම සහ තීරණ ගැනීම සඳහා දත්ත විශ්ලේෂණ උත්තේජනය කිරීම ඇතුළත් කිරීමට පිළිවන.

**රජයේ මූල්‍ය ප්‍රතිපත්ති සමඟ පෙළගැසීම :** මෑත කාලීන රජයේ මුදල් ප්‍රතිපත්ති වෙනස්කම් හරහා නිරූපණය වනුයේ, පුළුල් ආර්ථික අරමුණු සමඟින් නියාමන කාර්ය රාමු තුළ ක්‍රියාත්මක වීම උදෙසා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු බැඳීම හා කැපවීමයි.

සමස්තයක් වශයෙන්, ලාභදායිත්වය වැඩි දියුණු කිරීම, අරමුදල් ස්ථායිතාව සහතික කිරීම, ඩිජිටල් නවෝත්පාදනයන් වැළඳ ගැනීම, වර්ධනය වැඩි කිරීම, සාමාජිකයින්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීම සහ නියාමන අනුකූලතාව පවත්වා ගැනීම යන කර්තව්‍යයන් සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තුළ පවත්නා උපායමාර්ගික ප්‍රමුඛතාවයන් මෙම ප්‍රධාන ක්‍රියාදාම බෙදීයාම් මගින් පැහැදිලිව පිළිබිඹු කෙරේ.

අප සේවය කරන සාමාජික සාමාජිකාවන් තුළ පවත්නා දෛවීය ඉරණම් අපේක්ෂා හා සහජ සම්බන්ධතාවක් ඇති ආයතනයක් ලෙස, ඒ වෙනුවෙන් ඔවුනට ස්ථාවර වටිනාකමක් ලබා දීම සඳහා අප අරමුදල අතිශය සුපරීක්ෂාකාරී ලෙස හැසිරවීම උදෙසා දැඩි වගකීම් හැඟීමකින් බැඳී කටයුතු කිරීමට අපි උත්සුක වී සිටිමු.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සියලුම සාමාජික සාමාජිකාවන්ට ගුණාත්මක විශ්‍රාම දිවියක් ලබා ගත හැකි බව සහතික කිරීම තම සදාචාරාත්මක වගකීමක් ලෙස එහි කාර්ය මෙහෙවර විධානය තුළින් නිරීක්ෂණය කරයි. දැනට, අප ආයතනය 2024 වසර වන විට, එහි මූලික ව්‍යාපාරය ඩිජිටල්කරණයට හසු කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අතර, එමඟින් විද්‍යුත් ඊ-පාලනය කරා ඉදිරි පියවර තැබිය හැකි ය. මෙම සංක්‍රාන්තිමය පරිවර්තනය මඟින් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දැඩි කැපවීමක් නිරූපණය වේ.

තවද, අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා එහි උපායමාර්ග නැවත අර්ථකථනය කර දැක්වීමට මණ්ඩලය සැලසුම් කරයි. මෙම ක්‍රියාකාරී ප්‍රවේශය යෝජනා කරන්නේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සාම්ප්‍රදායික ක්‍රමවලින් ඔබ්බට නව්‍යකරණය පිණිස සූදානම්ව සිටින බවත්, ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා එහි මෙහෙයුම් සහ උපායමාර්ග අනුවර්තනය කර ඇති බවත් ය. මෙම මූලපිරීම් වැළඳ ගැනීම මගින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අභිප්‍රාය වන්නේ, එහි මෙහෙවර සහ එහි සාමාජිකයින්ට වගකීම් ඉටු කිරීමේ ඇති හැකියාව ශක්තිමත් කෙරෙන බවටත්, තිරසාර ප්‍රතිලාභ සහ විශ්‍රාම සැලසුම් සඳහා වන අනුබලය ස්වකීය සාමාජිකත්වය වෙත සහතික වන බවටත් වග බලා ගැනීමයි.

## තුති ප්‍රණාමය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය මෙහෙයුම් තුළින් තම සාමාජිකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් ඔවුන් උදෙසා හවුල්කාරිත්ව වටිනාකමක් නිර්මාණය කිරීමට ඇප කැපවී සිටී. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ආයතන සේවයෙහි නිරත එහි පක්ෂපාතී සේවක පිරිස විසින් ඉටු කරන ලද ප්‍රමුඛ කාර්යභාරය මෙම කැපවීම තුළ ඉහළ පිළිගැනීමකට පාත්‍ර වේ. ශීඝ්‍රයෙන් විකාශය වන මෙහෙයුම් පරිසරයකට උපාය මාර්ගිකව ප්‍රතිචාර දක්වා ඇති වෙහෙස මහන්සි වී තම සේවා කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් පිළිබඳව මණ්ඩලය සිය සාඩම්බරය පළ කරයි.

අරමුදලේ සාමාජිකයින්ගේ අභිලාෂයන් උදෙසා සාමාන්‍යාධිකාරිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සියලුම කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් කළ නොසැලෙන කැපවීම වෙනුවෙන් අපගේ හද පිරි කෘතඥතාව ඔවුන් වෙත මෙයින් පුද කරමු. සාමාජිකයින්ගේ සේවා තෘප්තිය වෙනුවෙන් අරමුදලේ අඛණ්ඩ සාර්ථකත්වයට දායක වීම සඳහා සහ අභියෝග තරණය පිණිස සමස්ත සේවක කණ්ඩායම විදහා පෑ සාමූහික ප්‍රයත්නය සහ කැපවීම, මෙම තුති ප්‍රණාමයට පාදක වන සුවිශේෂී ලක්ෂණයයි.

**ඩී.එල්.පී. රෝහණ අභයරත්න**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## 2023 වසර සඳහා විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, නිදහසින් පසු ඇති වූ ඉතිහාසයේ දරුණුතම ආර්ථික පසුබෑම අභිභවමින් 2023 වසරේ දී ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් විය. ආර්ථිකය විසින් විශාල වශයෙන් අත්විඳින ලද කෙටි කාලීන දුෂ්කරතා මධ්‍යයේ වුව ද, රජය විසින් ක්‍රියාවට නංවන ලද සැලකිය යුතු ප්‍රතිපත්ති ගැළපීම් සහ ව්‍යුහාත්මක වෙනස්කම් රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය බොහෝ දුරට යථා තත්ත්වයට පත් කිරීම පිණිස උපකාරී විය. උද්ධමනය 2022 දී වාර්තා වූ ඉහළම මට්ටමේ සිට 2023 අවසානය වන විට තනි ඉලක්කමේ මට්ටමක් කරා ලඟා වූ අතර, එමගින් මුදල් ප්‍රතිපත්තියේ සාමාන්‍යකරණය ආරම්භ කිරීමට හැකි විය. 2023 දෙවන භාගයේ දී ආර්ථික ප්‍රසාරණයක් වාර්තා වූයේ ය. සමස්ත රාජ්‍ය අයවැයේ නිරන්තර ද්විත්ව හිඟය සහ ආර්ථික පසුබෑමට මූලික හේතුව වූ බාහිර ජංගම ගිණුම, 2023 කාල සමය තුළ වැඩි දියුණු වීමේ ලකුණු විද්‍යාමාන කළේ ය. 2023 වසරේ දී රජයේ ප්‍රාථමික ශේෂය තුළ අතිරික්තයක් නිරූපණය වූ අතර බාහිර ජංගම ගිණුම ද අතිරික්තයක් සනිටුහන් කර සිටියේ ය.

ශ්‍රී ලංකා රුපියල 2023 සහ 2024 මුල් කාලය පුරාවටම ඉහළ යෑමේ ප්‍රවනතාවක් අත්විඳින ලද්දේ ය. ඊට සමගාමීව, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන සාර්ථක ලෙස අවසන් කිරීමෙන් පසුව මුදල් ප්‍රතිපත්ති ලිහිල් වීම සහ රජයේ සුරැකුම්පත්වල ඉපැයුම් එලදාව හා සම්බන්ධ අවදානමේ වාරික ප්‍රමාණය අඩුවීම කරණ කොට ගෙන, දේශීය වෙළෙඳපොළේ පොලී අනුපාත සැලකිය යුතු පහත වැටීමක් කරා ගමන් කළේ ය. වෙළඳපළ පොලී අනුපාත ව්‍යුහයේ මෙම පහත වැටීම ආශ්‍රිත ගැළපුම, ඉහළ නැගි වෙළඳපළ සංවේදිතා සමඟ එක්ව, 2023 ජුනි මාසයේ සිට පුද්ගලික අංශයට ලබා දී ඇති ණය හැකිලීමේ ප්‍රවනතාවය කිසියම් දුරකට ආපසු හැරවීමට හේතු කාරක විය. මීට අමතරව, රජය විසින් කාලානුරූපව හඳුන්වා දෙන ලද ක්‍රියාශීලී සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති හේතුවෙන් මූල්‍ය අංශය තුළ යම් ඔරොත්තු දීමේ හැකියාවක් ද විද්‍යාමාන වූයේ ය.

බොහෝ දුරට 2023 මාර්තු මාසයේ දී දියත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම ආශ්‍රිත වැඩසටහන යටතේ ඇති වූ සැලකිය යුතු ප්‍රගතිය හේතුවෙන්, 2023 වසර තුළ ශ්‍රී ලංකාවේ බාහිර අංශය ශක්තිමත්ව ප්‍රකෘති තත්වයට පත්වීමක් සහ ස්ථාවරත්වයක් අත්විඳින ලද්දේ ය. අඩු වූ වෙළඳ ශේෂ හිඟය සහ සේවා, අපනයන හා සේවක ප්‍රේෂණවලින් ලැබෙන සැලකිය යුතු විනිමය ගලා ඒම හේතුවෙන් බාහිර ජංගම ගිණුම තුළ අතිරික්තයක් වාර්තා විය. අපනයන ආදායමට සාපේක්ෂව සලකන කළ, ආනයන වියදමේ විශාල පහත වැටීම හේතුවෙන් 2010 වසරෙන් පසු ලද අඩුම වෙළඳ හිඟය මෙනිසා ඇති විය. සංචාරක ඉපැයීම් වැඩි දියුණු වීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර විදේශ රැකියා අවස්ථා සඳහා වැඩි වශයෙන් පුද්ගලයන් පිටව යාමත් සමඟ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ද ඉහළ ගියේ ය.

## උද්ධමනය

උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී උපරිම මට්ටමක් කරා ළඟා වූ අතර, 2023 වසර අවසානය වන විට එය, අඩු තනි ඉලක්කම් වෙත ළඟා වෙමින් වේගවත් නිර්උද්ධමන තත්ත්වයක් අත්කර ගත්තේ ය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, දැඩි මූල්‍ය ක්‍රියාමාර්ග සමඟ එක්වූ දැඩි මුදල් විනය තත්ත්වයන් මධ්‍යයේ හට ගත් ඉල්ලුම හා බැඳි පහත වැටීමයි. තවද, දේශීය සැපයුම සාමාන්‍යකරණය වීම, ගෝලීය භාණ්ඩ මිල ගණන් මධ්‍යස්ථ වීම සහ ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යෑම යනාදී කරුණු මෙම නිර්උද්ධමනය විෂයයෙහි දායක විය. අඩු ඉල්ලුම් තත්ත්වයන් මධ්‍යයේ සැපයුම් පාර්ශවය තුළ සිදු වන අපගමනය හේතුවෙන් පුනරාවර්තන උච්චාවචනයන් පැවතියදීත්, උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත මට්ටම තුළ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් වූ ශීර්ෂ උද්ධමනය




## පොලී අනුපාත

2022 වසරේ දී නිරීක්ෂණය වූ සැලකිය යුතු ඉහළ මට්ටම්වලට සාපේක්ෂව 2023 දී වෙළඳපොළ පොලී අනුපාත කැපී පෙනෙන අඩුවීමක් අත් දුටුවේ ය. වෙළෙඳපොළ පොලී අනුපාතවල අඩුවීම මූලික වශයෙන් සිදු වූයේ, 2023 වසරේ ජුනි මාසයේ සිට දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ තව දුරටත් පැවති යම් ධනාත්මක සාධක කිහිපයක බලපෑම ද සමඟින් ඇති වූ තත්වය පසුකර යාම තුලිනි. ශ්‍රී ලංකා මහ බැංකුව, 2023 ජුනි මස මුල් භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම ආරම්භ කළ අතර, වසර තුළ අවස්ථා හතරක දී ප්‍රතිපත්ති පොලී අනුපාත 650 ක පදනම් අගයකින් අඩු කරමින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) 2023 වසර අවසානයේ දී පිළිවෙළින් 9.00% ක් හා 10.00% ක් කරා සේන්දු වීමට ඉඩ සැලැස්වී ය. තවද, අධික වෙළඳපළ ණය දීමේ අනුපාත අඩු කිරීම සඳහා පරිපාලන තීරණ කීපයක් ක්‍රියාවට නංවන ලද අතර, ඊට අදාළ පුළුල් මාර්ගෝපදේශ සමඟින් වසර අවසානයේ දී එකී ණය අනුපාතිකවල කැපී පෙනෙන අඩුවීමක් ඇති විය. ඒ අනුව, සළකුණුගත පොලී අනුපාතිකවලින් එකක් වූ බර තැබූ සාමාන්‍ය මූලික ණය දෙන අනුපාතිකය (AWPR) 2023 වසර තුළ දී 15.11% කින් සැලකිය යුතු ලෙස අඩු විය.

2023 ජූලි මාසයේ දී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට අදාළ මූලපිරීම් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම හරහා එය ඊට තවදුරටත් උපකාර කර ගැනීමත් සමඟ රජයේ සුරැකුම්පත් මත ඉපැයුම් එලදාව කැපී පෙනෙන ලෙස අඩු විය. උද්ධමනය අඩුවීම, උද්ධමන අපේක්ෂාවන් අඩු කිරීම සහ ඉහළ වෙළඳපළ සංවේදන රජයේ සුරැකුම්පත්වල ඉපැයුම් එලදාව සාමාන්‍යකරණය කිරීම පිණිස සහාය විය. ඒ අනුව, 2023 වසර තුළ භාණ්ඩාගාර බිල්පත්වල ඉපැයුම් එලදාව 16.34% කින් 18.13% දක්වා අඩු වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර ඉපැයුම් එලදාව ද දුර්මුඛ විය. ඒ අනුව, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ යම් සැකසංකා සහ රජයේ වැඩි වූ ණය ගැනීමේ අවශ්‍යතා හරහා පැන නැගි අවිනිශ්චිත තත්ව හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට අසාමාන්‍ය සංචලන මට්ටම් විද්‍යාමාන කළ ද්විතීයික වෙළෙඳපොළ ඉපැයුම් එලදා වක්‍රය තුළ, 2023 වසර පුරා ද්විත්ව ප්‍රතිලෝම ඉපැයුම් එලදා වක්‍රයක් අඛණ්ඩව ප්‍රදර්ශනය වූයේ ය.

### ප්‍රතිපත්ති පොලී අනුපාත




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## 2023 වසර තුළ භාණ්ඩාගාර බිල්පත්වල ඉපැයුම් ඵලදාව (ප්‍රාථමික වෙළඳපොළ)




## රජයේ සුරැකුම්පත් සඳහා ද්විතියික වෙළෙඳපොළ ඉපැයුම් ඵලදා වක්‍රය




## ශ්‍රී ලංකා ආර්ථිකය

2022 වසරේ දී වාර්තා වූ සැලකිය යුතු 7.3% ක් වූ ආර්ථික හැකිලීමට සාපේක්ෂව 2023 වසරේ දී, ශ්‍රී ලංකා ආර්ථිකය 2.3% ක මධ්‍යස්ථ සංකෝචනයක් සමඟ නැවත ප්‍රකෘතිමත් වීමේ සලකුණු පෙන්නුම් කළේ ය. 2023 වසරේ දී ක්‍රමානුකූල වූ නමුත්, ස්ථාවර ප්‍රකෘතියක සේයා මෙම වසරේ දෙවන භාගයේ දී විශේෂයෙන් නිරූපණය විය. එහිලා, දළ දේශීය නිෂ්පාදිතය (GDP) තුළ ධනාත්මක වර්ධන වේග වාර්තා වුයේ ය. උද්ධමනය ලිහිල් කිරීම සහ බාහිර අංශයේ පීඩන තත්ව ලිහිල් කිරීම මධ්‍යයේ නව සාර්ව ආර්ථික ස්ථායිතාව මෙම වැඩි දියුණුව උදෙසා ආධාරක විය.

රජයේ නිල සංචිතය (GOR), 2022 වසර අවසානයේ දී පැවති ඩොලර් මිලියන 1,898 මට්ටමට සාපේක්ෂව වැඩි දියුණු වී 2023 වසර අවසානයේ දී ඩොලර් මිලියන 4,392 ක් වූ සුවදායී මට්ටමකට ළඟා වූ අතර, 2023 වසර තුළ විදේශ අංශයෙහි නිරීක්ෂණය වූ හිතකර වර්ධනයන් පිළිබිඹු කර සිටියේ ය. රජයේ නිල සංචිතයෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, දේශීයව පවත්නා විදේශ විනිමය වෙළෙඳ පොළෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය අවශෝෂණය කර ගනු ලැබීමත්, දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම ආශ්‍රිත වැඩසටහන යටතේ පළමු හා දෙවන කොටස්වලට අයත් මුදල් ලැබීම සහ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යනාදී ආයතන වෙතින් මූල්‍ය ආධාර ලැබීමත් වැනි අනෙකුත් විදේශ විනිමය සලසා ගැනීම යන කරුණු කාරණා වේ.



# ආයෝජන

### ආයෝජන අරමුණු

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන අතර ආරක්ෂාව, ප්‍රතිලාභය සහ ද්‍රවශීලතාවය යන මූලික ආයෝජන මූලධර්මත්‍රයකට අවනතව මණ්ඩලය ක්‍රියා කරයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව, ප්‍රධාන ආයෝජන මූලාශ්‍රය වනුයේ, රජයේ සුරැකුම්පත්වල සැලකිය යුතු කොටසක් සමන්විත වන ආකාරයේ ස්ථාවර ආදායම් සුරැකුම්පත් සලසා ගැනීම ය.

ආයෝජන ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම විටම ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල 94% ක් වූ ප්‍රමාණයට නොඅඩු වත්කම් වෙන් කිරීමක් පවත්වා ගත යුතු අතර එම ප්‍රමාණය, කොටස් ආයෝජන විෂයයෙහි 6% ක් වූ ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය. සමාලෝචිත වර්ෂය තුළ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 2022 වසරට සාපේක්ෂව මුළු ආයෝජනයෙන් 93.30% ක් වන රජයේ ඉස්තරම් සුරැකුම්පත්හි රුපියල් බිලියන 480 ක මුදලක් ආයෝජනය කර ඇති අතර තව දුරටත් රුපියල් බිලියන 15 ක මුදලක් කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කර ඇත.

එම ප්‍රමාණය, 2022 වසරට සාපේක්ෂව රුපියල් බිලියන 3.99 ක වැඩිවීමක් සහිතව ආයතනයේ මුළු ආයෝජන කළඹෙන් 3.01% ක් වූ ප්‍රමාණයකි. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය රාජ්‍ය සුරැකුම්පත් තුළ රුපියල් බිලියන 480 ක මුදලක් ආයෝජනය කර ඇති අතර එය, 2022 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 431 ක් වූ ප්‍රමාණයට සාපේක්ෂව 11.37% ක් වූ වර්ධනයකි.










## ස්ථාවර ආදායම් ආයෝජන

ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අරමුදල් ප්‍රමාණය, 2023 දෙසැම්බර් මස 31 වන දිනට මුළු ආයෝජන කළඹෙන් 95.32% ක් හෙවත් රුපියල් බිලියන 498.5 ක් වූ ප්‍රමාණයක් නියෝජනය කරයි. 2022 දී වාර්තා වූ කැපී පෙනෙන ඉහළ මට්ටම්වල සිට 2023 වසර තුළ දී වෙළෙඳපොළ පොලී අනුපාත තියුණු ලෙස පහත වැටුණි. ශීඝ්‍ර නිර්උද්ධමන ක්‍රියාවලිය සහ උද්ධමන අපේක්ෂාවන් මධ්‍යස්ථකරණය කිරීම හරහා සහය සලසා ගැනුනු අධික වෙළෙඳපොළ පොලී අනුපාත අඩු කිරීමේ අරමුණින් හඳුන්වා දුන් පරිපාලන ක්‍රියාමාර්ග සහ දේශීය ණය ප්‍රශස්තකරණ මෙහෙයුම් කාර්යයෙන් පසුව රජයේ සුරැකුම්පත්වල ඉපැයුම් ඵලදාවට සම්බන්ධ අවදානම් වාරිකවල අඩුවීම යන කරුණු, වෙළඳපොළ පොලී අනුපාතවල පුළුල් පදනමක් ගත් අවකරණයක් සිදුවීම විෂයයෙහි දායක වූ අනෙකුත් වැදගත් සාධක වන්නේ ය. දිගුකාලීන දැක්මක් ඇතිව, තිරසාරව පවත්නා සාමාන්‍ය ඉපැයුම් ඵලදාවක් පවත්වා ගැනීම සඳහා විවිධ කාල සීමාවන් යටතේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල අරමුදල් ආයෝජනය කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි විය.

2023 වසර තුළදී ආයතනයේ ස්ථාවර ආදායම, 2022 වර්ෂයේ දී පැවති රුපියල් බිලියන 46 ක් වූ ප්‍රමාණයේ සිට රුපියල් බිලියන 64 දක්වා ඉහළ නංවා ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි වී ඇති අතර එය, 2022 වසරට සාපේක්ෂව 39% ක සැලකිය යුතු වර්ධනයකි.




## කොටස් ආයෝජන

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කොටස් ආයෝජන වලින් ලැබෙන ප්‍රතිලාභය, 2023 වසර තුළ පැවති නිරන්තර වෙළඳපළ අස්ථාවරත්වය නොතකා ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේ ය. ශ්‍රී ලංකාව 2023 මාර්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළැඹීමත් සමඟ වැඩි දියුණු වූ සාර්ව ආර්ථික වර්ධනයන් මත, 2023 පළමු භාගයේ දී සියලු කොටස් මිල දර්ශකයේ (ASPI) 11% ක් වූ ප්‍රතිශත ප්‍රමාණයක් අත්කර ගත්තේ ය. එය, 2022 මුදල් වර්ෂයේ දී සාක්ෂාත් කර ගන්නා ලද සාමාන්‍ය දෛනික පිරිවැටුම වූ රුපියල් මිලියන 2,972 ට වඩා බෙහෙවින් අඩු අගයක් සහිත රුපියල් මිලියන 1,478 ක් වූයේ ය. කෙසේ වෙතත්, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ බැංකු ක්ෂේත්‍රයට බලපෑම් ඇති කිරීමට අපේක්ෂිත දේශීය ණය ප්‍රශස්තකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සිය ද්විපාර්ශ්වික සහ නිල ණය හිමියන් සමඟ සාකච්ඡා කිරීමට මූලිකත්වය ගත් බැවින්

ආයෝජකයින් දිගින් දිගටම ප්‍රවේශම් සහගත බවක් පෙන්වී ය.

පසුව, 2023 පළමු භාගයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ කාර්ය සාධනය ඉහළ මට්ටමකට ළඟා වූ අතර 2023 වසරේ දෙවන භාගයේ දී ශ්‍රී ලංකා රජය විසින් මෙහෙයවනු ලබන දේශීය ණය ප්‍රශස්තකරණ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් කළ නිල නිවේදනයත් සමඟ 2023 වසරේ මුල් භාගය අවසානයේ බැංකු සහ රක්ෂණ ක්ෂේත්‍ර හැරුණු විට, අනෙකුත් ක්ෂේත්‍රවල කාර්ය සාධනය ඉහළ මට්ටමක පැවතුණි. 2023 වසර අවසානය වන විට සියලු කොටස් මිල දර්ශකය 25% ක වර්ධනයක් සහිතව 10,654 ක් වූ මට්ටමෙහි ස්ථානගත වූ බැවින් එම තත්ත්වය වෙළඳපොළ විසින් ඉතා ඉහළින් පිළිගනු ලැබී ය. 2023 වර්ෂය තුළ විදේශ සහභාගිත්වය ද 8% සිට 10% ක් දක්වා වර්ධනය වී ඇති අතර එය, සියලු කොටස් මිල දර්ශකය කෙරෙහි ධනාත්මක ලෙස බලපෑම් ඇති කරමින් ඉන් ලද ශුද්ධ විදේශ මුදල් ගලනය රුපියල් මිලියන 4,436 ක් වශයෙන් වාර්තා කර සිටියේ ය. උද්ධමනය පාලනයට නතු කර ගැනීමේ අරමුණින් තියුණු ලෙස මුදල් කටයුතු හැසිරවීමේ දෘඪ භාවය 2022 දී හඳුන්වා දීමෙන් පසුව, 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් අංක 650 කින් අඩු කරන ලදී. 2023 වසරේ 2 වන කාර්තුවේ සිට පොලී අනුපාතවල අඩුවීමේ ප්‍රවනතාවය, වෙළඳපළ වර්ධනයක් වාර්තා කිරීම කෙරෙහි තවදුරටත් බලපෑවේ ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට 2023 වසර අවසානයේ දී එහි මුළු අරමුදලින් 2.36% ක් වූ මට්ටමේ කොටස් මත සිදු කළ ආයෝජනයක් පවත්වා ගැනීමට හැකි විය. ව්‍යාපාරික ක්‍රියාකාරකම් දිරිමත් කරමින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම මධ්‍යයේ කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් බොහොමයක් මැනවින් ක්‍රියාත්මක විය. බොහෝ සමාගම්වලට 2023 මූල්‍ය වර්ෂයේ දී ලාභාංශ ප්‍රකාශ කිරීමට ද හැකි විය. 2023 මූල්‍ය වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට සිය කොටස් ආයෝජන මත ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ හරහා රුපියල් මිලියන 1,861 ක ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබිණි.

කොටස් ආයෝජනය මත මුළු ආදායම




## ආයෝජන කළඹ ආශ්‍රිත තත්ත්වය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මුළු ආයෝජන කළඹ ප්‍රමාණය 2023 වසර අවසානයේ බිලියන 515 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය, 2022 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 456 ක් වූ ප්‍රමාණයට සාපේක්ෂව 13.89% ක වර්ධනයක් ගෙන හැර දැක්වී ය.

ආර්ථික වශයෙන් අභියෝගාත්මක කාලයක් තරණය කරන අතරම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා උපක්‍රමශීලීව සිය අරමුදල් ආයෝජනය ඉහළ ඉපැයුම් එලදාවක් සහිත කොටස් ආයෝජන වෙත යොමු කළේ ය. විවිධ කාල සීමාවන් සහ කළඹ කාණ්ඩ හරහා ආයෝජන මිශ්‍රණය සමානුපාතිකව ගැළපීම මගින් ඉදිරි වසරවල දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තිරසාර ආයෝජන කළඹ කාර්යසාධන තත්ත්වයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.

## අනාගත ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා ආර්ථිකය එහි ප්‍රකෘතිමත් භාවය අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ඇතැයි ද, ඉහළ සාර්ව ආර්ථික ස්ථායීතාවය නවතාවයට පත්කිරීම මගින් ශක්තිමත් වූ ඉදිරි වසරවල දී එහි සම්පූර්ණ විභවය කරා ළඟා වනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීරණ අරමුදල් පහසුකම (EFF) පිළිබඳ වැඩසටහන මගින් අනුග්‍රහය දක්වන ලද අඛණ්ඩ අභිලාෂකාමී ප්‍රතිසංස්කරණ සහ ආර්ථික ගැළපීම් අඛණ්ඩව සිදු කිරීම උපකල්පනය කරමින්, විවිධ පෙරමුණු හා පැතිකඩවලින් ශ්‍රී ලංකාව ස්වකීය ආර්ථිකයේ ස්ථාවරත්වය අපේක්ෂා කරයි. ශීඝ්‍ර උද්ධමන ක්‍රියාවලියෙන් පසුව, උදාසීන ඉල්ලුම් තත්ත්වයන් මධ්‍යයේ සැපයුම් පාර්ශව විෂයයෙහි පැවති කම්පන හේතුවෙන් වරින් වර උච්චාවචනයන් ඇති වුව ද, 2024 වසර පුරාවට සාමාන්‍යයෙන් 5% ක ඉලක්කගත මට්ටම කරා උද්ධමන තත්වය ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මධ්‍ය කාලීනව, එම උද්ධමන තත්වය සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ අදාළ ඉලක්කය වටා ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

පවතින දත්ත මගින් පිළිබිඹු වන පරිදි හිතකර උද්ධමන තත්ත්වයන් සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය ඉදිරි කාලය තුළ තිරසාර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ලිහිල් කිරීම, දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩි දියුණු කිරීම සහ රජයේ සුරැකුම්පත්වලට සම්බන්ධ අවදානම් වාරිකය අඩු කිරීම, වෙළෙඳපොළ පොලී අනුපාත, විශේෂයෙන්ම ණය අනුපාත තව දුරටත් සාමාන්‍ය තත්ත්වයට පත් කිරීම

යන ක්‍රියා පිළිවෙත නොකඩවා අපේක්ෂා කෙරේ. මෙම සාමාන්‍යකරණය, ව්‍යාපාර සහ කුටුම්භ සඳහා අඩු මූල්‍ය පිරිවැය අනුසාරයෙන් වූ අවශ්‍ය සහන සැලසීම උදෙසා හේතු කාරක වේ.

සාර්ව ආර්ථික විචලතාවල බලපෑම කරණ කොට ගෙන මූල්‍ය අංශය තවදුරටත් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් කොන්දේසි ලිහිල් කිරීමත් සමඟ, 2023 වසරේ දී සිදු වූ ආර්ථික හැකිලීමෙන් පසු 2024 වන විට පුද්ගලික අංශය වෙත නැවතත් ණය පහසුකම් ලැබෙනු ඇතැයි ද පුරෝකථනය කෙරේ. මෙම හිතකර පරිසරය තුළින් සාමාජික දායකත්වය වෙතින් ගලා එන මුදල් ප්‍රවාහය ඉහළ නැංවීමත්, සාමාජික මුදල් ආපසු ගෙවීම ස්ථාවර කිරීමත් අපේක්ෂා කරන අතර එම තත්වය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු ආයෝජනවල වර්ධනය කෙරෙහි ඉදිරි වසරවල දී ධනාත්මක ලෙස බලපානු ඇත.

# දායක මුදල් රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ දායක මුදල් රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා අංශය සේවා යෝජකයාගේ දායක මුදල් කලට වේලාවට එකතු කිරීම සහ ප්‍රමාද දායක මුදල් මත අධිභාර අය කිරීම හා එකතු කර ගැනීම ඇතුළු අනුකූලතා ක්‍රියාකාරකම් පිළිබඳව වගකීම උසුලයි. සේවා යෝජකයින් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාම ද, සහ ස්වයං රැකියාවල නියුක්තව සිටින්නන් අතර සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ද මෙම අංශය වගකීම දරයි. මෙම අංශය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛාවල සේවා ජාලය සමඟ එක්ව නියමිත ඉලක්කවලට අනුව කටයුතු කරමින් පහත දැක්වෙන ප්‍රධාන කාර්ය සාධන දර්ශක සපුරාලීම සඳහා ක්‍රියාත්මක වේ.

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| **සේවා යෝජකයෝ** | | | | | |
| සක්‍රිය සේවා යෝජකයන්ගේ ගණන | 83,777 | 75,731 | 69,094 | 64,026 | 75,485 |
| **සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයෝ** | | | | | |
| සාමාජිකයන් (සක්‍රිය හා අරමුදලට දායක මුදල් ගෙවන සේවා යෝජකයන් නියෝජනය වේ.) | 2,800,000 | 2,680,000 | 2,430,091 | 2,445,609 | 2,592,923 |
| ස්වයං රැකියාවන්හි නියුක්ත සාමාජිකයන් | 41,989 | 41,867 | 41,517 | 41,113 | 43,640 |
| සංක්‍රමික සේවක සාමාජිකයන් | 231 | 220 | 228 | 241 | 274 |

### අනුකූලතාව දක්වන සේවායෝජකයන්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකාවේ සමස්ත රැකියා නියුක්තිකයන්ගේ ජනගහනය ආවරණය කිරීම සඳහා නිශ්චිත උපාය මාර්ගයක් අනුගමනය කරමින් ක්‍රියා කරයි. කම්කරු දෙපාර්තමේන්තුවේ සහ මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව, රැකියාවන්හි නිරත පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ සේවා යෝජකයින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවන සේවා යෝජකයින් සංඛ්‍යාව අතර පැහැදිලි අසමතාවක් පවතී. මෙම පරතරය වසා දැමිය හැක්කේ, සියලුම සේවා යෝජකයන් අරමුදල වෙත ලියාපදිංචි කර ගැනීමෙන් පමණි. 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුව, සේවා යෝජකයින් තම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් නොව, සිය අනියම් සේවකයන්, කොන්ත්‍රාත් සේවකයින්, කෑලි ගණනට

වැඩ කරන්නන් සහ දෛනික වැටුප් ලබන කම්කරුවන් වෙනුවෙන් ද ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 3 ක් වූ මුදල් ප්‍රමාණයක වටිනාකම සහිත දායක මුදලක් පද්ධතිය හරහා ගෙවිය යුතු ය.

## දායක මුදල් ගෙවන සේවා යෝජකයන් අතර අනුකූලතා අනුපාතය

සාමාජිකත්ව ප්‍රතිලාභ ප්‍රදානය කරනු ලබන්නේ සේවා යෝජකයින් විසින් මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළ ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත අඛණ්ඩව දායක මුදල් ගෙවූ සේවක සේවිකාවන්ට පමණි. එබැවින්, සේවා යෝජකයින් විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම අඛණ්ඩව සිදු කරනු ලබන බවට වග බලා ගැනීම පිණිස වූ අපගේ කාර්යය, අදාළ සේවා කාර්යභාරය හඳුනා ගැනීමේ කර්තව්‍යයෙන් ඔබ්බට ගමන් කරයි.

## ශාඛා මගින් දායක මුදල් අය කර ගැනීම

මෙය යොමුගත වන්නේ, කොරෝනා වසංගතයට පෙර දායක මුදල් ගෙවීම් අතපසු කළ හෝ පැහැර හරින ලද හෝ කිසිඳු මුදලක් නොගෙවන ලද සේවා යෝජකයින් වෙතින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් අයකර ගනු ලබන ගෙවීම් ප්‍රමාණයේ මට්ටම්වලට ය. ගෙවීම් කිරීමේ සුදුසුකම් ලබන සේවා යෝජකයින් ලියාපදිංචි කිරීමේ අරමුණින් සහ දැනටමත් ලියාපදිංචි වී සිටින සේවා යෝජකයන්ගේ දායක මුදල් ගෙවීමේ අනුකූලතාව සහතික කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අයත් ශාඛා ජාලය වාර්ෂිකව සේවා යෝජකයන් හමුවීම අරබයා ගමන් වාර 40,000 සිට 45,000 දක්වා වූ සංඛ්‍යාවක් සිදු කර ඇත. සිරිත් පරිදි, මෙයින් සියයට 70 ක් වූ පමණ ගමන් වාර ප්‍රමාණයක් සිදු කර ඇත්තේ, ගෙවීම් පැහැර හැරි සේවා යෝජකයන් වෙත ය. සෑම වසරකම නව සේවා යෝජකයින් 3,000 ක් පමණ වූ ප්‍රමාණයක් ලියාපදිංචි කෙරේ.

2023 වර්ෂයේදී සිදු කරන ලද මුළු පරීක්ෂා කිරීම් සංඛ්‍යාව 23,703 ක් වූයේ ය. දායක මුදල් නොගෙවන බවට අනාවරණය වූ සංඛ්‍යාව 4,010 ක් වන අතර නව සේවකයින් 19,227 ක් වූ ප්‍රමාණයක් ද එහිලා නිරාවරණය කර ගැනුණි.

## විද්‍යුත් ඊ-ගෙවීම්

ඉන්ධන හිඟය යනාදී හේතූන් කරණ කොට ගෙන පුද්ගලිකවම කාර්යාල වෙත පැමිණ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවය පිටු දැකීමේ අරමුණින් එම කාර්යය විද්‍යුත් යාන්ත්‍රනයක් හරහා ඉටු කිරීම කරා මාරු වන ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල එහි සාමාජිකයින් වෙතින් ඉල්ලා සිටින ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විශාල කාණ්ඩයේ 70% ක් පමණ වූ ප්‍රමාණයක් අදාළ විද්‍යුත් මාදිලිය කරා අවතීර්ණ වී ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා 'ක්ලවුඩ් බේස්' නමැති සංවෘත අන්තර්ජාල පදනමක් මත වූ ගෙවීම් යාන්ත්‍රණයට පැමිණීමට අකමැති සේවාදායකයන් සඳහා 2021 වර්ෂයේ දී සෘජු හර පහසුකමක් දියත් කරන ලදී. මෙම ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකු ජාලයක් හරහා ගෙවීම් සිදු කිරීමට ඉඩ සැලසේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිර පැවති කාල සීමාව තුළ සිදු වූ ප්‍රමාද සැලකිල්ලට ගෙන දායක මුදල් ගෙවීම සඳහා සහන කාලයක් ද ලබා දෙන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමාජ ආරක්ෂණ අරමුදල සාමාජිකයින් විෂයයෙහි මූල්‍ය සුරක්ෂිතතා ජාලයක් සලසා දෙන බැවින් වර්තමාන වාතාවරණය තුළ එය අතිශය වැදගත් අරමුදලක් වන්නේ ය.

අවම වශයෙන් සේවක සේවිකාවන් පහළොවක් (15) තමා යටතේ සේවයෙහි යොදවා ගනු ලැබ සිටින සෑම සේවා යෝජකයෙකුටම 2023.02.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ජාල ගෙවීම් ක්‍රමය හරහා ගෙවීම් කිරීම අනිවාර්ය කරමින් 2022 දෙසැම්බර් මාසයේ දී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. මෙම නව වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන්, විද්‍යුත් ඉලෙක්ට්‍රොනික් ක්‍රමය හරහා දායක මුදල් ගෙවන සේවා යෝජකයින්ගේ සංඛ්‍යාව 70% ක් වූ ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

# සාමාජික සේවා

සාමාජික හිමිකම් ඉල්ලීම් සැකසීම සහ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 ක් ක්‍රියාත්මක කිරීම විෂයයෙහි සාමාජික සේවා අංශය වගකීම දරයි. සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම, වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම සහ මුදල් වෙන් නොකළ සාමාජික ගිණුම් නිෂ්කාශනය කිරීම යන කාර්යයන්හි වගකීම ද මෙම අංශයට පැවරේ.

## සාමාජික හිමිකම් ඉල්ලීම් සැකසීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2022 වසරේ දී මරණ හිමිකම් ඇතුළුව මුදල් ආපසු ගෙවීමේ හිමිකම් ඉල්ලා සිටීම් 195,212 ක් සකස් කර ඇති අතර එහි මුළු මුදල ලෙස රුපියල් බිලියන 25 ක් ගෙවා ඇත. ඊට සාපේක්ෂව, 2021 වසරේදී රුපියල් බිලියන 20.1 ක ගෙවීමක්ද සමග ආපසු ගෙවීමේ හිමිකම් 149,019 ක් විය.

| | 2023 දෙසැම්බර් 31 | 2022 දෙසැම්බර් 31 | 2023 තුළ වෙනස |
|---|---|---|---|
| **ආපසු ගෙවන හිමිකම** | | | |
| සකසන ලද සාමාජික හිමිකම් ඉල්ලීම් ගණන | 240,888 | 195,212 | 23.09% |
| ගෙවන ලද ගණන | 39 | 25 | 56% |

## සාමාජික ප්‍රතිලාභ

අපගේ සාමාජිකයින්ගේ සුභසාධනය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අප හට ඉහළ ප්‍රමුඛතාවයක් වන්නේය. 1986 සිට අප අපගේ සාමාජිකයින් සඳහා විවිධ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ ඔවුන් වෙත ලඟා කර දී ඇත. වර්තමානය වන විට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකයෝ තමන් වෙත මූල්‍ය ආධාර සලසා දෙන, මුදල් ආපසු ගෙවනු ලබන හිමිකම් ලබා ගනිමින් ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 ක ප්‍රතිලාභ භුක්ති විඳිති.

හෘද සැත්කම්, වකුගඩු බද්ධ කිරීම් හා අභ්‍යන්තර අක්ෂි කාච සඳහා වූ වියදම් ප්‍රතිපූරණය කිරීම සහ නිත්‍ය දුබලතා හා මරණ සඳහා ප්‍රතිලාභ මෙන්ම ශ්‍රමසුව රැකවරණ යටතේ වන ප්‍රතිලාභ ද වෙනුවෙන් 2023 වසරේ දී රුපියල් මිලියන 353 ක් දක්වා වූ මුදල් නොවන සානුබලයක් සාමාජික සාමාජිකාවන් වෙත සලසා දී ඇත.

තනි පුද්ගල වශයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකයින්ට සෘජුවම ලබා දෙන ප්‍රතිලාභ වලට අමතරව, අපි අපගේ සාමාජිකයින්ගේ දරුවන් සඳහා ද ප්‍රතිලාභ ලබා දෙන්නෙමු. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වන දූදරුවන් සඳහා මූල්‍යාධාරයක් සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දුන් දූදරුවන්ට වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා රු.50,000 ක මූල්‍යාධාරයක් වාර්ෂික පදනමින් පිරිනමමින් අපි ඔවුන්ගේ අනාගතය අභිවෘද්ධිය සඳහා දායක වන්නෙමු.

## සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

වසර අවසානයේ දී අරමුදල සමඟ පවතින සක්‍රීය සහ අක්‍රිය ගිණුම් සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 18.95 ක් වූ අතර එම සාමාජික ගිණුම්වලින් සියයට 98 ක් 2023 වසර අවසන් වන විට යාවත්කාලීන කර ඇත. මෙම සාමාජික ගිණුම් අතරින් මිලියන 16.45 ක් වූ ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ අක්‍රිය වශයෙන් පවතින්නේය යනුවෙන් වූ අතර සාමාජික ගිණුම් මිලියන 2.5 ක් වූ ප්‍රමාණයක් සක්‍රීයව පවතී. සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී ගිණුම් සඳහා වාර්ෂික සාමාජික ප්‍රකාශ ඔවුන්ගේ අදාළ සේවායෝජකයන් වෙත නිකුත් කර ඇත. ස්වකීය අරමුදල සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, හිතෛෂී සාමාජික නැඹුරුවක් සහිත අන්තර්ජාල පරිගණක ද්වාරයක් දියත් කිරීමේ ක්‍රියාවලියක මේ වන විට නිරතව සිටී. (අදාළ විස්තර තොරතුරු තාක්ෂණ අංශය යටතේ දක්වා ඇත.)





| සේ.නි.භා.අ. සාමාජිකයන් සඳහා ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම | | |
|---|---|---|
| **ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (ආරම්භක වර්ෂය)** | **2023 ප්‍රතිලාභීන් ගණන (රු. 000)** | **2022 ප්‍රතිලාභීන් ගණන (රු. 000)** |
| නොමිලයේ දෙන ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය (1986) | සාමාජිකයන් 1,574<br>රු.156,593 | සාමාජිකයන් 1,502<br>රු.149,236 |
| නිත්‍ය දුබලතා රක්ෂණ යෝජනා ක්‍රමය (1989) | සාමාජිකයන් 99<br>රු. 22,799 | සාමාජිකයන් 52<br>රු.8,762 |
| හෘද සැත්කම් සඳහා මූල්‍ය ආධාර (1991) | සාමාජිකයන් 471<br>රු. 141,660 | සාමාජිකයන් 359<br>රු.98,048 |
| අභ්‍යන්තර අක්ෂි කාච පිරිවැය ප්‍රතිපූරණය කිරීම (1992) | සාමාජිකයන් 328<br>රු. 7,281 | සාමාජිකයන් 294<br>රු. 4,231 |
| පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුලයාධාර යෝජනා ක්‍රමය (1994) ස්ථිර ආබාධිත භාවය හේතුවෙන් සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ දරුවන් ද ඇතුළත්ව (2010) | *දරුවන් 12,856<br>*රු.196,840 | *දරුවන් 5,778<br>*රු.86,670 |
| "ශ්‍රමසුව රැකවරණ" රෝහල්ගත කිරීමේ වෛද්‍ය යෝජනා ක්‍රමය (1997) | සාමාජිකයන 868<br>රු.19,758 | සාමාජිකයන 1,365<br>රු. 23,477 |
| වියන නිවාස ණය යෝජනා ක්‍රමය (2002 ජූනි) | - | - |
| වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් සඳහා මූල්‍ය ආධාර (1991) | සාමාජිකයන 16<br>රු. 5,112 | සාමාජිකයන 17<br>රු.3,646 |
| අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනිසිටි අරමුදලේ සාමාජිකයන්ගේ දුදරුවන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදනය | *සාමාජිකයන 6,148<br>*රු.73,776 | *දරුවන් 3,859<br>*රු.46,308 |
| **ගෙවන ලද මුළු ව්‍යවස්ථාපිත නොවන සාමාජික ප්‍රතිලාභ** | **රු. 623,819** | **රු. 420,378** |

** 2023 වර්ෂයේදී 5 වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා හා උසස් අධ්‍යාපන මුලයාධාර වෙනුවෙන් ගෙවනු ලැබූ මුදල හා ශිෂ්‍යත්ව සංඛ්‍යාව*

# මානව සම්පත් කළමනාකරණය

විශ්‍රාම යෑම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2022 වර්ෂයේ 924 ක්ව සිටි සේවක සංඛ්‍යාවේ සුළු වෙනසක් සහිතව 2023 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතුව සේවක සේවිකාවෝ 882 දෙනෙකු සිටියහ.

| මට්ටම | රැකියා ශ්‍රේණිය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරී | 1 | - | 1 |
| | අතිරේක සාමාන්‍යාධිකාරී | - | - | - |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 5 | - | 5 |
| | සහකාර සාමාන්‍යාධිකාරී | 2 | 2 | 4 |
| | කළමනාකරු | 24 | 18 | 42 |
| | **එකතුව** | **32** | **20** | **52** |
| තෘතියික | කනිෂ්ඨ කළමනාකරු | 28 | 31 | 59 |
| | කළමනාකරණ සහකාර | 80 | 113 | 193 |
| | **එකතුව** | **108** | **144** | **252** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | - | 1 | 1 |
| | කළමනාකරණ සහකාර 1-2 | 158 | 274 | 432 |
| | **එකතුව** | **158** | **275** | **433** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 120 | 25 | 145 |
| | **එකතුව** | **120** | **25** | **145** |
| **මුළු එකතුව** | | **444** | **438** | **882** |

## සේවක පිරිස වයස අනුව

| සේවක පිරිස වයස අනුව (2023.12.31දිනට)<br>වයස පරාසය (අවුරුදු) | | |
|---|---|---|
| 21-25 | 3 | 1% |
| 26-30 | 92 | 10% |
| 31-35 | 129 | 15% |
| 36-40 | 152 | 17% |
| 41-45 | 119 | 13% |
| 46-50 | 99 | 11% |
| 51-55 | 169 | 19% |
| 55 ා වැඩි | 119 | 14% |
| **එකතුව** | **882** | **100%** |

## සේවක පිරිස රැකියා ශ්‍රේණිය අනුව

| | රැකියා ශ්‍රේණිය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරී | 1 | 0.12% |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 5 | 0.56% |
| | සහකාර සාමාන්‍යාධිකාරී | 4 | 0.45% |
| | කළමනාකරු | 42 | 4.76% |
| | **එකතුව** | **52** | **5.88%** |
| තෘතියික | කණිෂ්ඨ කළමනාකරු | 59 | 6.68% |
| | කළමනාකරණ සහකාර 4 | 193 | 21.88% |
| | **එකතුව** | **252** | **28.68%** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | 1 | 0.12% |
| | කළමනාකරණ සහකාර 1-2 | 432 | 48.97% |
| | **එකතුව** | **433** | **48.97%** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 145 | 16.43% |
| | **එකතුව** | **145** | **16.43%** |
| **මුළු එකතුව** | | **882** | **100%** |

## සේවකයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක පුරුෂ හා කාන්තා අනුපාතය 2023 අවසානයේ දී 50.4: 49.6 ක් ලෙස පැවතුනි.

| පුරුෂ | ස්ත්‍රී | මුළු එකතුව |
|---|---|---|
| 444 | 438 | 882 |
| 50.4% | 49.6% | 100% |

## සේවක පිරිස වයස අනුව

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 365 |
| ශාඛා කාර්යාල | 517 |
| එකතුව | 882 |

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් 882 දෙනාගෙන් 365 දෙනෙක් ප්‍රධාන කාර්යාලයේ සිටින අතර 517 දෙනෙක් ශාඛා ජාලය පුරා විසිරී සිටිති.

## සේවකයන් සේවයේ නිරත වී සිටීම

| විස්තර | විධායක | විධායක නොවන | එකතුව |
|---|---|---|---|
| විශ්‍රාම ගැනීම | 4 | 18 | 22 |

### සේවක ස්ථාන මාරු

මණ්ඩලයේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව මණ්ඩලයේ වසර පහකට වැඩි කාලයක් එකම අංශයේ සේවය කරන ලද සේවකයන් ස්ථාන මාරු සිදුකරන ලදී

### වැටුප් හා ප්‍රතිලාභ

මණ්ඩලයේ සියලුම සේවකයන් ස්ථිර තනතුරු දරයි. ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයන් වශයෙන් ඔවුන් තම මූලික වැටුපට අමතරව ප්‍රතිලාභ රැසක් සඳහා සුදුසුකම් ලබයි.

| | 2023 රු.'000 | 2022 රු.'000 | වෙනස |
|---|---|---|---|
| වැටුප් | 499,389 | 598,118 | (16.5)% |
| ජීවන වියදම් දීමනාව | 82,056 | 87,785 | (6.5)% |
| ආහාර දීමනාව | 12,854 | 13,649 | (5.8)% |
| අතිකාල දීමනාව | 23,582 | 21,587 | 9.2% |
| නිවාඩු දින දීමනා | 11,940 | 9,546 | 25% |
| **එකතුව** | **629,822** | **730,685** | **(13.8)%** |

### ප්‍රතිලාභ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක සේවිකාවන්, සේවකයින් වෙත පිරිනැමෙන ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබයි. ඒවාට මූලික වැටුප අනුව ලබා දෙන දිරිගැන්වීම්, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ පහසුකම්, වාර්ෂික ප්‍රසාදි දීමනා සහ විවිධ ණය, උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වැටුප් වර්ධක සහ සේවකයාගේ ස්ථිර ආබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් පිරිනැමෙන වන්දි යනාදිය ඇතුළත් වේ.

| | 2023 රු.'000 | 2022 රු.'000 | වෙනස |
|---|---|---|---|
| දිරි දීමනා | 131,941 | 137,573 | (4)% |
| නිල ඇඳුම් සහ මැහුම් වියදම් | 16,801 | 17,664 | (4.8)% |
| විශේෂ විශ්‍රාමික ප්‍රසාද දීමනා | 900 | 1,406 | (36)% |
| තේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සුබසාධන වියදම් | 16,019 | 10,241 | 56% |
| නිවාඩු දින වෙනුවෙන් මුදල් ගෙවීම | 28,144 | 33,775 | (17)% |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 80,801 | 103,408 | (22)% |
| වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම | 128,197 | 119,713 | 7% |
| නිවාස ණය සඳහා පොලිය | 8,963 | 9,805 | (8.5)% |
| පොලී පිරිවැය | 38,786 | 24,872 | 56% |
| වත්මන් සේවා පිරිවැය | 9,548 | 46,018 | (79)% |
| සේ.අ.අ. | 95,466 | 97,249 | (1.8)% |
| සේ.නි.භා.අ. | 19,157 | 19,450 | (1.5)% |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම | 4,007 | 4,187 | (4.3)% |
| **එකතුව** | **578,730** | **625,361** | **(7.5%)** |

### දිරි දීමනා

මූලික වැටුප පදනම් කරගෙන දිරි දීමනාව සකස් කරනු ලබන අතර, මාසික පදනමින් ගෙවනු ලබන පැමිණීමේ සහ කාර්ය සාධන දිරි දීමනා ඇතුළත් වේ.

### වෛද්‍ය පහසුකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සේවකයින්ගේ වෛද්‍ය පහසුකම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- එක් සේවකයෙකුට රු. 60,000.00 ක් දක්වා වූ වාර්ෂික බාහිර රෝගී සත්කාර වෛද්‍ය ප්‍රතිපූරණය.
- එක් සේවකයෙකුට වාර්ෂිකව රු.100,000.00 ක් දක්වා වූ රෝහල් ගතව ප්‍රතිකාර ලබා ගැනීමේ වියදම් ප්‍රතිපූර්ණය.

### සේවකයාගේ නිත්‍ය දුබලතා හෝ මරණය වෙනුවෙන් වන්දි

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| සේවකයාගේ මරණය | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,500,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,450,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,350,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,250,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,125,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,000,000.00 |
| | ප්‍රාථමික මට්ටම (1), (2), (3) | 875,000.00 |

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| නිත්‍ය දුබලතා | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,750,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,700,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,650,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,500,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,350,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,200,000.00 |
| | ප්‍රාථමික මට්ටම(1), (2), (3) | 1,050,000.00 |

### වාර්ෂික ප්‍රසාද දීමනා

දෙසැම්බර් මාසයේ දී ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාව මාස දෙකක මූලික වැටුපට සමාන වේ.

## ණය

### විශේෂ ණය

| | |
|---|---|
| ණය මුදල | රු.100,000.00 |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 60 |
| පොලිය | වාර්ෂික 4.2% |

### නිවාස ණය

| | |
|---|---|
| උපරිම ණය සීමාව | රු. 3,000,000.00 |
| ණය මුදල | අවුරුදු 25 හෝ වයස අවු. 60 සම්පූර්ණ වීම |
| ප්‍රතිසාධන කාල සීමාව | 1 වන රු. 2,000,000 සඳහා වසරකට 4.2% |
| පොලිය | ශේෂ රු. 1,000,000 සඳහා වසරකට 7.0% |

### වාහන ණය

**ඕනෑම සේවකයෙකුට පා පැදි ණය සමග මෝටර් වාහන, ත්‍රිරෝද රථ සහ මෝටර් සයිකල් යන ණය කාණ්ඩවලින් එක් ණයක් ලබා ගත හැකි ය.**

| | | |
|---|---|---|
| මෝටර් රථය | ණය මුදල | රු. 1,250,000.00 (MA 1-2 සහ ඊට පහළ) |
| | | රු. 2,500,000.00 (MA 4 සහ ඊට ඉහළ) |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| ත්‍රිරෝද ණය | ණය මුදල | රු 900,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| යතුරු පැදිය | ණය මුදල | රු. 500,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 10 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| පාපැදි ණය | ණය මුදල | රු. 25,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වාරික 36 |
| | පොලිය | වාර්ෂික 4.2% |

### ආපදා ණය

| | |
|---|---|
| ණය මුදල | මාස 12 ක වැටුප |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 120 |
| පොලිය | වාර්ෂික 4.2% |

## අතිරේක වැටුප් වර්ධක - උසස් අධ්‍යාපන සුදුසුකම්

උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා අමතර වැටුප් වර්ධක වාසි ප්‍රදානය කරනු ලබන්නේ රැකියා ශ්‍රේණිය සහ ලබාගත් සුදුසුකම් මත පදනම්ව ය.

| රැකියා කාණ්ඩය | සුදුසුකම | විශේෂ වැටුප් වර්ධක ගණන |
|---|---|---|
| කළමනාකරණ සහකාර (1-2) සහ (4) | ඩිප්ලෝමා | 01 |
| | උපාධිය | 02 |
| | මාස්ටර් උපාධිය | 03 |
| ඕනෑම ශ්‍රේණියක් සඳහා | මාස්ටර් උපාධිය | 03 |

## උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වියදම් ප්‍රතිපූර්ණය

විෂයක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන ගාස්තුව, නිශ්චිත නියම සහ කොන්දේසි සහිතව රු. 400,000/- දක්වා ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

| රු. | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වියදම් ප්‍රතිපූරණය | 6,163,469 | 3,515,594 | 2,358,826 |

### මානව සම්පත් කටයුතු

පහත සඳහන් දෑ ඇතුළුව, 2023 වසර තුළ අපි අපගේ එදිනෙදා සාමාන්‍ය මානව සම්පත් ක්‍රියාකාරකම් කිහිපයක් නොකඩවා කරගෙන ගියෙමු:

- සේවකයින් සඳහා කාර්ය මණ්ඩල ණය ලබා දීම;
- වෛද්‍ය ප්‍රතිපූර්ණ පහසුකම්;
- මණ්ඩලයේ වාර්ෂික වත්කම් සත්‍යාපනය සාමාන්‍ය පරිදි සිදු කර ඇත;
- වැරදි කරන සේවකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත.

## පුහුණුව සහ සංවර්ධනය

කාර්ය සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා ධාරිතා වර්ධනය කිරීමේ අරමුණින් 2023 වසරේ දී පුහුණු හා සංවර්ධන වැඩසටහන් සැලසුම් කරන ලදි. එහි ප්‍රතිපලයක් ලෙස, 2022 වසරේ වැයවූ රුපියල් 425,222.50 ක මුදලට සාපේක්ෂව 2023 දී පුහුණු හා සංවර්ධන ආයෝජනය සඳහා රුපියල් 5,947,739.41 ක මුදලක් වැය විය. සාමාජික කේන්ද්‍රීය පද්ධතියට සංක්‍රමණය වීමට පහසුකම් සැලසීම සඳහා ICTA තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ව්‍යාපෘති පුහුණු වැඩසටහන් වලට හා බාහිර පුහුණු වැඩසටහන් වලටද කාර්ය මණ්ඩලය සහභාගී විය.

## පුහුණුවීම් 2003

| | පුහුණුවීම් වර්ගය | ආයතනය | සහභාගි වූවන්ගේ සංඛ්‍යාව/ නම | වියදම |
|---|---|---|---|---|
| 1 | ප්‍රතිලාභ සම්බන්ධව | සාමාජික සේවා | 80 | 112,890.00 |
| 2 | කාර්යාලයේ පරිගණක භාවිතය | වරලත් ගණකාධිකාරි ආයතනය | 7 | - |
| 3 | UAT නව පද්ධතිය - Employer Management | INOVA & ICT | 36 | 38,065.00 |
| 4 | UAT නව පද්ධතිය - Employer Management | INOVA & ICT | 36 | 38,065.00 |
| 5 | නව කම්කරු නීති | ශ්‍රම අධ්‍යන ආයතනය | 1 | 2,500.00 |
| 6 | SLPSAS 11-20 වැඩසටහන | වරලත් ගණකාධිකාරි ආයතනය | 1 | - |
| 7 | නව ICTA වැඩ සටහන හඳුන්වා දීම | | 37 | 26,688.00 |
| 8 | නව පද්ධතිය UAT - සාමාජික කළමනාකරණ | INOVA & ICT | 65 | 113,530.00 |
| 9 | නව පද්ධතිය UAT - සාමාජික සබදතා - | INOVA & ICT | 69 | 108,710.00 |
| 10 | නව පද්ධතිය UAT - සාමාජික කළමනාකරණ | INOVA & ICT | 55 | 99,000.00 |
| 11 | නව පද්ධතිය UAT - සාමාජික සබදතා | INOVA & ICT | 50 | 90,810.00 |
| 12 | නව පද්ධතිය UAT - ස්වයං රැකියා | INOVA & ICT | 50 | 95,060.00 |
| 13 | නව පද්ධතිය UAT - දායක මුදල් | INOVA & ICT | 55 | 279,802.00 |
| 14 | නව පද්ධතිය UAT - දායක මුදල් රැස්කිරීම් නිවැරදි කිරීම | INOVA & ICT | 49 | 89,930.00 |
| 15 | නව පද්ධතිය UAT - වෙන් කිරීම | INOVA & ICT | 34 | 68,560.00 |
| 16 | නව පද්ධතිය UAT - ඇමතුම් මධ්‍යස්ථානය | INOVA & ICT | 63 | 96,755.00 |
| 17 | නව පද්ධතිය UAT -ක්‍රියාත්කිරීමේ 1 | INOVA & ICT | 69 | 208,320.00 |
| 18 | නව පද්ධතිය UAT -ක්‍රියාත්කිරීමේ 2- | INOVA & ICT | 60 | 233,400.00 |
| 19 | නව පද්ධතිය UAT - නීති | INOVA & ICT | 70 | 113,405.00 |
| 20 | නව පද්ධතිය UAT අධිභාර සම්බන්ධව | INOVA & ICT | 50 | 90,810.00 |
| 21 | මූලික පද්ධතිය පිළිබද දැනුවත් කිරීම - කළාප 03 කාර්යාලය | Hambantota | 100 | 88,090.00 |
| 22 | නව පද්ධතිය UAT දායක මුදල් සංශෝධන | INOVA & ICT | 55 | 187,890.00 |
| 23 | Enadoc ලේඛණ කළමනාකරණ පද්ධතිය (මෘදුකාංග ස්කෑන් කිරීම). | දින 1/2 | 60 | 64,620.00 |
| 24 | නව පද්ධතිය UAT - ප්‍රතිලාභ සාමාන්‍ය ආපසු ගැනීම් | INOVA & ICT | 63 | 211,235.00 |
| 25 | වියදම් සහ ගෙවීම් පටිපාටිය පිළිබද සම්මන්ත්‍රනය | එක් දින පුහුණුව | 2 | 24,000.00 |
| 26 | නව පද්ධතිය UAT - ප්‍රතිලාභ සාමාන්‍ය ආපසු ගැනීම් | INOVA & ICT | 55 | 220,020.00 |
| 27 | සංඛ්‍යා ලේඛණ සඳහා පරිගණක දත්ත සම්බන්ධ වැඩමුළුව | සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | 1 | - |

| | පුහුණුවීම් වර්ගය | ආයතනය | සහභාගි වූවන්ගේ සංඛ්‍යාව/ නම | වියදම |
|---|---|---|---|---|
| 28 | මූලික පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීම - කළාප 01 කාර්යාලය | මීගමුව | 60 | 120,000.00 |
| 29 | නව පද්ධතිය UAT - ගෙවීම් නිකුත් කිරීම | INOVA & ICT | 25 | 66,110.00 |
| 30 | NPC 2020 සම්මාන ලාභින් ඇගයීම | පරිපාලන අංශය | 110 | 56,860.00 |
| 31 | නව පද්ධතිය UAT - ලේඛණ කළමනාකරණ ඒකකය | INOVA & ICT | 50 | 90,220.00 |
| 32 | නව පද්ධතිය UAT - පොදු ද්වාර සේවා යෝජකයා | INOVA & ICT | 45 | 85,230.00 |
| 33 | නව පද්ධතිය UAT - පොදු ද්වාර සාමාජික | INOVA & ICT | 49 | 96,440.00 |
| 34 | ජාතික මානව සම්පත් සම්මේලනය | CIPM Sri Lanka | 3 | 59,850.00 |
| 35 | මූලික පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීම - කළාප 02 කාර්යාලය | මහනුවර | 55 | 83,800.00 |
| 36 | නව පද්ධතිය UAT - පොදු ද්වාර නියෝජිත | INOVA & ICT | 23 | 64,454.00 |
| 37 | නව පද්ධතිය UAT - හිමිකම් ප්‍රතිලාභ | INOVA & ICT | 50 | 90,810.00 |
| 38 | නව පද්ධතිය UAT - හිමිකම් ශිෂ්‍යත්ව | INOVA & ICT | 50 | 104,710.00 |
| 39 | මූලික පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීම - කළාප 03 කාර්යාලය | අනුරාධපුර | 38 | 78,900.00 |
| 40 | HRIS | පරිපාලන හා මානව සම්පත් අංශය | 41 | - |
| 41 | HRIS | පරිපාලන හා මානව සම්පත් අංශය | 62 | - |
| 42 | අපොස උ.පෙ. ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | සාමාජික සේවා | 120 | 12,500.00 |
| 43 | CCNA පදනම් කරගත් ව්‍යවසාය ජාල ක්‍රියාත්මක කිරීම | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2 | - |
| 44 | රජයේ ප්‍රසම්පාදන පද්ධතිය | මුදල් අමාත්‍යාංශය | 45 | 17,390.00 |
| 45 | අපොස උ.පෙ. ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | සාමාජික සේවා | 100 | 12,000.00 |
| 46 | AAT සම්මන්ත්‍රණය 2023 | AAT | 5 | 74,250.00 |
| 47 | HRIS - නිවාඩු පැකේජය | පරිපාලන හා මානව සම්පත් අංශය | 350 | 17,500.00 |
| 48 | පාරිභෝගික සේවාව | පරිපාලන හා මානව සම්පත් අංශය | 40 | 12,830.00 |
| 49 | කළමනාකරණ වැඩසටහන | පරිපාලන හා මානව සම්පත් අංශය | 50 | 106,670.00 |
| 50 | වරගත් ගණකාධිකාරි ආයතනයේ ජාතික සමුළුව 2023 | CA Sri Lanka | 3 | 90,000.00 |
| 51 | රජයේ ප්‍රසම්පාදන පද්ධතිය | මුදල් අමාත්‍යාංශය | 45 | 12,500.00 |
| 52 | කළමනාකරණය සහ ගොනුකිරීමේපද්ධති | SLIDA | 40 | 138,611.11 |
| 53 | කළමනාකරණය සහ ගොනුකිරීමේපද්ධති | SLIDA | 40 | 138,611.11 |
| 54 | ප්‍රවාහන කළමනාකරණය | SDFL | 2 | 12,000.00 |
| 55 | HRIS පුහුණු වැඩසටහන | පරිපාලන හා මානව සම්පත් අංශය | 47 | - |
| 56 | HRIS පුහුණු වැඩසටහන | පරිපාලන හා මානව සම්පත් අංශය | 37 | - |
| 57 | HRIS පුහුණු වැඩසටහන | පරිපාලන හා මානව සම්පත් අංශය | 30 | - |
| 58 | ප්‍රසම්පාදන සැලැස්ම 2024 සැකසීම පිළිබඳ සම්මන්ත්‍රනය | PRAG Service(Pvt) Ltd | 2 | 27,000.00 |

# තොරතුරු තාක්ෂණ

## 'මෙහෙවර පියස' පරිශ්‍රයේ වයි-ෆයි (Wi-Fi) ජාල සේවා යටිතල පහසුකම් සංවර්ධනය

සේවාලාභීන් තිස් දෙනෙකුට (30) වැඩි ප්‍රමාණයක් යම් ජාල ප්‍රවේශ ඒකකයකට සම්බන්ධ වන්නේ නම්, එබඳු ස්ථානයක් ඉහළ ඝනත්ව පරිසරයක් සහිත එකක් ලෙස වර්ග කළ හැකි ය. ප්‍රධාන කාර්යාලය හා සබැඳි ජාලගත සේවය, අධි ඝනත්ව පරිසරයක් ලෙස හඳුනා ගනු ලැබ ඇත. එම අධි ඝනත්ව රැහැන් රහිත සේවය සඳහා සහය වනු පිණිස, ගුවන් විදුලි සංඛ්‍යාත පරාස අධීක්ෂණය සඳහා වෙසෙසින්ම වෙන් වූ ගුවන් විදුලි තරංග ජාලයක් සහිත ව්‍යවසාය මට්ටමේ ප්‍රවේශ ස්ථාන පිහිටවනු ලැබ ඇති අතර එමඟින්, ප්‍රවේශ ස්ථාන වෙත අධි ඝනත්ව පරිසර හැසිරවීම උදෙසා වූ අවකාශය සලසා දෙයි. ජාලගත සේවා කාර්ය සාධනය වටහා ගනු ලැබ එම ජාලයෙහි කාර්යක්ෂමතාව, සුරක්ෂිතතාව සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබිය හැකි එකී ජාල සේවාකරණ ප්‍රවාහනයේ හැසුරුම් චර්යාව පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයේ දැනුවත් වීම කෙරෙහි ඉඩ සැලසෙන ආකාරයේ සෘජු සබඳතාවකින් යුත් මෙම ජාල සේවය විෂයයෙහි වූ මනා දෘශ්‍යතාවක්, ව්‍යවසාය මට්ටමේ ජාල ප්‍රවේශ ඒකක මඟින් ලබා දෙයි. “මෙහෙවර පියස” ආශ්‍රිත වයි-ෆයි (Wi-Fi) ජාලගත සේවා හා බැඳි යටිතල පහසුකම් සංවර්ධනය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය සැලසුම් කළ පරිදි මේ වන විටත් සාර්ථකව ඉටු කර අවසන් කර තිබේ.

2023 වර්ෂයේ දී, ශ්‍රී ලංකා රාජ්‍ය ජාල සේවය (LGN) වෙත සම්බන්ධතාවය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත සපැමිණියේ ය.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාලය (SD-WAN)

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි බොහෝ පද්ධති වෙබ් පාදක විසඳුම් වන බැවින්, ප්‍රධාන කාර්යාල ජාල සේවය සහ ප්‍රාදේශීය කාර්යාල ජාල සේවා අන්තර් සම්බන්ධනය කිරීම සඳහා මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවයක් (SD -WAN) ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වූයේ ය. මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවයක් ක්‍රියාත්මක කිරීම මගින්, ෆයර්වෝල් ආරක්ෂණ විධි සහ මධ්‍යගතව කළමනාකරණය කළ හැකි ප්‍රතිපත්ති ප්‍රාදේශීය කාර්යාලවලට ද යොදා ගත හැකි ය. මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවයක් හඳුන්වා දීම මගින්, මිල අධික අථත්‍ය පුද්ගලික ජාල සේවා (VPN) සම්බන්ධතා වෙනුවට අඩු වියදම් අන්තර්ජාල සම්බන්ධතා ඒ සඳහා ප්‍රතිස්ථාපනය කළ හැකි ය. මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවය, ප්‍රවාහනය මාර්ගගත කරණය හා සම්බන්ධ තීරණ සහිතව බහු සම්බන්ධතා වර්ග විෂයයෙහි පිටුබලයක් වීමට හොඳින් ස්ථානගත වී ඇති බැවින්, 4G / 5G තාක්ෂණය සහ බ්‍රෝඩ්බෑන්ඩ් ක්‍රමවේදය තෝරා ගැනීම, විවිධ තත්ව අර්ථවත් කෙරෙන ප්‍රවාහනය ගෙන යන්නක් බවට පත් වන්නේ ය. පවත්නා හොඳම සම්බන්ධතාව මත පදනම්ව, ශේෂය පූර්ණය කිරීම සඳහා හෝ ඒවා බෙදා ගැනීම සඳහා අපට හැකියාව ලැබෙන්නේ ය. මෘදුකාංග පාලනයේ ස්වභාවය යන්නෙන් අදහස් වන්නේ, ව්‍යාපාරය ක්‍රියාත්මකව පවත්නා බව සහතික කිරීම සඳහා යෙදුම් සහ / හෝ පරිශීලක යන ආකාරවලට ප්‍රමුඛත්වය ලබා දෙන ආපදා ප්‍රතිසාධන (DR) සැලසුම් ක්‍රියාත්මක කිරීම අපට කළ හැකි බව ය. මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවා සපයන්නන්, යෙදුම සහ පරිශීලක හැසිරීම් පිළිබඳ දත්ත පහසුවෙන් තේරුම් ගත හැකි ග්‍රැනුයුලා කැට්ටි සමඟ වෙන කවරදාටත් වඩා ජාලය වෙත වැඩි දෘශ්‍යතාවක් ලබා දෙයි. මෙකී මෘදුකාංග නිර්වාචිත පුළුල් ප්‍රදේශ ජාල සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර, එය, 2024 වර්ෂයේ දී ඉටු කර අවසන් කිරීමට නියමිත ය.

## ප්‍රාදේශීය කාර්යාල ආශ්‍රිත සේවා ජාලයේ ගැටලු විසඳීම

ප්‍රාදේශීය කාර්යාල ආශ්‍රිතව මධ්‍යගතව කළමනාකරණය කළ හැකි අන්තර්ජාල සේවයක් නොමැති අතර එම කාර්යාලවල ෆයර්වෝල් ආරක්ෂණ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කර නොමැත. එබැවින්, අනවශ්‍ය අන්තර්ජාල ප්‍රවේශය අවහිර කිරීම සහ ආරක්ෂණය හා සම්බන්ධ තර්ජන පාලනය කිරීම ප්‍රාදේශීය කාර්යාල ජාලය තුළ සිදු කළ නොහැක. එබැවින්, එම අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රාදේශීය කාර්යාලවල ජාල සේවා ප්‍රමාණවත් නොවේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය  සඳහා වන මධ්‍ය ක්‍රමය,  නුදුරු දිනයක දීම ක්‍රියාත්මක වීමට නියමිත ය.

ප්‍රාදේශීය කාර්යාලවල අන්තර්ජාල සම්බන්ධතා ව්‍යවසාය මට්ටමේ පුළුල් කලාප බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා දක්වා වැඩි දියුණු කළ යුතු ය. ප්‍රාදේශීය කාර්යාල ජාල සේවා මෘදුකාංග නිර්වාචිත කළ පුළුල් ප්‍රදේශ ජාලයක් (SD -WAN) හරහා ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ කළ යුතු ය. ප්‍රාදේශීය කාර්යාල ජාල සේවා උත්ශ්‍රේණිගත කිරීම සහ එම සේවා මෘදුකාංග නිර්වාචිත කළ පුළුල් ප්‍රදේශ ජාල වෙත සම්බන්ධනය කිරීම ක්‍රියාවට නැංවීමේ ක්‍රියාදාමය දැනටමත් ආරම්භ කර ඇති අතර, එය 2024 වර්ෂයේ දී ඉටු කර අවසන් කිරීමට නියමිතය.

## තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය ආයතනවල දත්ත සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සයිබර් තර්ජනවලින් ආරක්ෂා කරනු පිණිස, 2022 අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ ආයතන සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය අනුමත කරන ලදී. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ "රාජ්‍ය අධිකාරීන්" ලෙස අර්ථ දක්වා ඇති සියලුම රාජ්‍ය ආයතනවල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නියමිත ය. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් (චක්‍රලේඛ අංක MOT/2023/01) 2023 මැයි මස 2 වන දින නිකුත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි, ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම (ශ්‍රී ලංකා CERT) විසින් එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීමටත්, එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ඵලදායී කාර්යක්ෂමතාව තක්සේරු කිරීමටත්, තාක්ෂණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ඇත. ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය වන්නේ, 2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනතට අනුකූලතාව දැක්වීම ඇතුළුව අනවසර ප්‍රවේශ, සයිබර් තර්ජන සහ බාධා කිරීම් වලින් රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන දත්ත සහ තොරතුරු තාක්ෂණ පද්ධති ආරක්ෂා කර ගැනීමයි. අංක MOT/2023/01 දරන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ට මෙම ප්‍රතිපත්තිය ඔවුන්ගේ අදාළ ආයතන තුළ ක්‍රියාත්මක කිරීමට නියම කර ඇති අතර, ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම සමඟ සාකච්ඡා කර වාර්ෂික අයවැය හරහා ඒ වෙනුවෙන් අරමුදල් වෙන් කළ යුතු ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පිරිනමනු ලබන සේවාවන්හි භාරදූරත්වය මත පදනම්ව, පළමු වටයේ දී මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හඳුනා ගනු ලැබ ඇත.

ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම විසින් එවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සඳහා වූ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සහාය පළ කිරීමේ යෝජනාව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පිළිගන්නා ලද්දේ ය. රාජ්‍ය ආයතන සඳහා තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් දැනටමත් ආරම්භ කරනු ලැබ ඇති අතර, එය, 2024 වර්ෂයේ දී ඉටු කර අවසන් කිරීමට නියමිතව පවතී.

## එන්ඩොක් (Enadoc) ලිපි ලේඛන කළමනාකරණ පද්ධතිය සමඟ සජීවී ලෙස සම්බන්ධනය වීම

එන්ඩොක් (Enadoc) යනු, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහා නව්‍ය වූ ද, වලාකුළු පාදක 'ක්ලවුඩ් බේස්ඩ්' ක්‍රමවේදය මත පදනම් වූ ද, ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියකි. මෙම පද්ධතිය, දින හත පුරා පැය විසිහතර මුළුල්ලේ (24 x 7) මෙහෙයුම් සහ නඩත්තු සහාය සැලසෙන ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) ආයතනයේ දත්ත මධ්‍යස්ථානවල සත්කාරකත්වය හරහා ස්ථාපනය කෙරිණි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ලිපි ලේඛන පරිලෝකනය කිරීමේ ක්‍රියාවලිය ආරක්ෂිත සහ ඵලදායී ලෙස ආරම්භ කරමින් මෙම ව්‍යාපෘතිය කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කළ යුතුව තිබිණි. අදාළ දත්තවල සංක්‍රමණ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමෙන් පසුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එන්ඩොක් (Enadoc) පද්ධතිය හා සමඟ 2023 වර්ෂයේ දී සජීවී අයුරින් සම්බන්ධනය වූයේ ය.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මධ්‍ය පද්ධතිය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මධ්‍ය පද්ධතිය පිළිබඳව පරිශීලක පුහුණුව සහ ඒ ආශ්‍රිත පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පුහුණුව (TOT) 2023 වර්ෂයේ දී සාර්ථකව නිම කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මධ්‍ය පද්ධති ව්‍යාපෘතිය විසින්, "ව්‍යාපාර ක්‍රියාවලි අධ්‍යයනය", "යෙදුම සංවර්ධනය කිරීම", "පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT)", "පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ අදියරේ දී හඳුනාගත් සංවර්ධන වෙනස්කම් ඉල්ලීම්" සහ "පරිශීලක පුහුණුව" යන සන්ධිස්ථාන සම්පූර්ණ කරන ලදී.

**ආරක්ෂණය**

සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතියෙහි (MASS) ආරක්ෂාව ශක්තිමත් කිරීම.

ප්‍රධාන අරමුණු පහත පරිදි වේ:

රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබාගත හැකි බව සලසා දීම සඳහා තොරතුරු සහ සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතිය අනවසර ප්‍රවේශ වීම, භාවිතය, හෙළිදරව් කිරීම, බාධා කිරීම, වෙනස් කිරීම හෝ විනාශ කිරීම යනාදියෙන් ආරක්ෂා කිරීම.

**පුහුණු කිරීම්**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මධ්‍ය පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මධ්‍ය පද්ධතිය පිළිබඳ දැනුම ලබා දීමේ ක්‍රමයක් අත්‍යවශ්‍ය බව අනාවරණය කර ගැනුණි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙහි සහ ප්‍රාදේශීය ශාඛාවන්හි සියලුම අංශ ආවරණය කෙරුණි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ඉතා ඵලදායී එකක් වූයේ ය.

**වෙනත් පුහුණු කිරීම්**

අ. තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා ෆයර්වෝල් පරිගණක ආරක්ෂණ පුහුණු වැඩසටහන.
ආ. වෙබ් යෙදුම් සහ ජංගම ආරක්ෂණය පිළිබඳ වැඩමුළුව - (පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම - CERT)
ඇ. සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කිරීමේ සැසිය
ඈ. MS 365 පිළිබඳ පුහුණු වැඩසටහන.
ඉ. එන්ඩොක් (Enadoc) පරිශීලක පුහුණුව.

**අනාගත සැලසුම්**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, දැනට තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි (ICTA) සහයෝගිතාව ලබා ගනිමින් ස්වකීය මධ්‍ය ව්‍යාපාරික කර්තව්‍යය සඳහා සාමාජික කේන්ද්‍රීය යෙදුම සංවර්ධනය කිරීමේ කාර්යයෙහි නිරතව සිටී. නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, සේවා යෝජකයින් ඔවුන්ගේ සේවා යෝජක ද්වාරය හරහා සේවක විස්තර සමඟ සිය දායක මුදල් ඉදිරිපත් කළ යුතු ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් සපයනු ලබන තොරතුරු හා සංනිවේදන තාක්ෂණ පහසුකම් සුරක්ෂිතව සහ පහසුවෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් නොමැති සේවා යෝජකයින්ට අවශ්‍ය වන ආකාරයේ තිරසාර විසඳුමක් සොයා ගැනීම සඳහා ද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තව දුරටත් කටයුතු කරමින් සිටින්නේ ය.

මෙම ගැටලුව අවම කර ගැනීමේ උත්සාහයක් ලෙස තැපැල් සේවා හරහා අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට සේවා යෝජකයන්ට අවස්ථාව ලබා දීමට තීරණය කර ඇත. තොරතුරු තාක්ෂණ යෙදුම් සේවා සහ නිවසින් නිවසට ගොස් ඒවා බෙදා හැරීමේ හැකියාව සහිත තැපැල් සේවය, අපගේ සේවා යෝජකයන්ට පහසු විකල්පයක් වනු ඇතැයි අපි විශ්වාස කරමු. කරුණු එසේ වන හෙයින්, මෙම කාර්යයෙහිලා තැපැල් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අපි ඔවුන් තෝරාගෙන සිටින්නෙමු.

# මුදල්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි මුදල් අංශය සතුව පුළුල් හා තීරණාත්මක කාර්ය භාරයක් පවතී. එය සැකෙවින් ගෙන හැර දැක්වීම සඳහා, එහි ප්‍රමුඛ කාර්ය භාරය පහත සඳහන් පරිදි සාරාංශ කර දැක්විය හැකි ය :

**ගිණුම් සැකසීම :** ව්‍යවස්ථාපිත නියමයන් අනුව සියලුම මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළ කටයුතු නිවැරදිව ලේඛනගත කර වාර්තා කර ඇති බවට වග බලා ගනිමින්, මාසික සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම ඔවුන් විසින් හසුරුවනු ලබති.

**වාර්ෂික අයවැය :** ආදායම් සහ වියදම් පුරෝකථනය කිරීම සහ මූල්‍ය සම්පත් කාර්යක්ෂමව වෙන් කර දෙනු ලැබ ඇති බව තහවුරු කිරීම ඇතුළත් වන වාර්ෂික අයවැය ලේඛන කාර්යය වර්ධනය කර පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඔවුහු වගකීමෙන් යුතුව බැඳී සිටිති.

**ගෙවීම් කළමනාකරණය :** රජයට බදු ගෙවීමේ කර්තව්‍යය හැසිරවීම සහ මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වන බවට වග බලා ගැනීම ඇතුළුව කාර්ය මණ්ඩලය වෙත සහ අනෙකුත් ආයතන වෙත සිදු කෙරෙන ගෙවීම් කළමනාකරණය කිරීමේ සහ සැකසීමේ කටයුතුවල ඔවුහු නියැළී සිටිති.

**රජයේ විගණන සම්බන්ධීකරණය :** අවශ්‍ය හා අදාළ සියලු තොරතුරු සපයා ඇති බවට සහතික වෙමින් සහ විගණන ප්‍රමිති සහ නියමයන්ට අනුකූලව කටයුතු සිදු වන බවට තහවුරු කර ගනිමින් රජයේ විගණන කටයුතු සඳහා පහසුකම් සලසා දීම සහ ඒවා සම්බන්ධීකරණය කිරීම ඔවුන් විසින් ඉටු කරනු ලබති.

**ආයතනික සැලැස්ම පිළියෙළ කිරීම :** ආයතනයේ උපාය මාර්ගික දිශානතිය සහ ඉලක්ක ගෙන හැර දක්වන ආයතනික සැලැස්ම සංවර්ධනය කිරීමේ කාර්යය උදෙසා ඔවුහු දායකත්වය සපයති.

**කළමනාකරණ තොරතුරු වාර්තා :** මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා දෙන පරිදි සහ ආයතනය තුළ තීරණ ගැනීමේ කාර්යය සඳහා සහාය වන ආකාරයේ විවිධ කළමනාකරණ තොරතුරු හා වාර්තා සකස් කිරීමෙහි ඔවුහු නිරතව සිටිති.

සමස්තයක් වශයෙන් ගත් කළ, මූල්‍ය අඛණ්ඩතාව පවත්වා ගැනීම, උපාය මාර්ගික සැලසුම්කරණයට සහාය වීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඔවුහු ඉටු කරති.

2023 දෙසැම්බර් මස 04 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයීය හස්තය වන, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ 2022 සඳහා වූ වාර්ෂික වාර්තා සම්මාන තරඟය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ජයග්‍රහණය කළේ ය. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත වාර්ෂික වාර්තා අංශයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා යන කාණ්ඩය සඳහා වන "රන් සම්මානය" ද සහ සමස්ත තරගාවලියේ "ලෝකඩ" යන සම්මාන වලින් පිදුම් ලැබීය. මෙම තරඟයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත මෙම සම්මානය හිමි වූයේ අඛණ්ඩව පස්වන වසරටයි. ආයතනික වාර්තාකරණය සහ මූල්‍ය හෙළිදරව් කිරීම් යන ක්ෂේත්‍රයේ විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් නිරූපණය කළ රාජ්‍ය අංශයේ ආයතන මෙම සම්මානයෙන් ඇගයීමට ලක් කෙරේ.









# නීති

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නීති අංශය, මණ්ඩලයේ සියලුම නීතිමය කටයුතු සඳහා උපදේශක සේවා ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන අතර 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනී. නීති අංශය, වර්තමානයේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, නීති කළමනාකරුවන් සහ නීති නිලධාරීන් යන අයවළුන්ගෙන් ද, එහි සහායක කාර්ය මණ්ඩලයෙන් ද සමන්විත වේ. නීති අංශය සෘජුවම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි. ප්‍රාදේශීය කාර්යාල ජාලය ස්ථාපනය කිරීමෙන් පසුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධ නීතිමය ක්‍රියාදාමයන් ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කර ඇත.

නීති අංශයේ ප්‍රධාන අරමුණක් වන්නේ, අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සොයා ගනු ලබන සමුච්චිත දායක මුදල් / අධිභාර පැහැර හරින සේවා යෝජකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හරහා අදාළ හිඟ මුදල් අයකර ගැනීම සහතික කිරීමයි. නීති අංශය විසින්, මණ්ඩලීය කාර්ය මණ්ඩලයේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා නීතියේ මූලික මූලධර්ම සහ කම්කරු නීතියේ නව ප්‍රවණතා පිළිබඳ පුහුණු සැසි සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබේ.

# අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණනය යනු කළමනාකරණය වෙත කෙරෙන සේවාවක් ලෙස ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා පවත්නා සංවිධානය තුළ වූ ස්වාධීන තක්සේරුමය කාර්යයකි. එය, සංවිධානයක් තුළ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දායකත්වය ලබා දෙන කාර්යයක් ලෙස අභ්‍යන්තර පාලන, මූල්‍ය සහ වෙනත් කරුණුවල සඵලතාවය මැනීම, ඇගයීම සහ වාර්තා කිරීම පාලනය කරන්නා වූ විධි ක්‍රමයකි.

විගණන සහ සහතිකකරණ අංශයේ ප්‍රධානියා ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හරහා මණ්ඩලයට වාර්තා කරන අතර සියලුම පරිපාලන කටයුතු සඳහා ඔහු වාර්තා කරන්නේ මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාට පමණි. ප්‍රමුඛතා කාර්යයන් සකසා නියම කිරීමටත්, විගණන සැලැස්මක් සකස් කිරීමටත්, සොයා ගනු ලබන ප්‍රධාන අනාවරණ හා තොරතුරු නිවැරදිව හා කාලෝචිත ලෙස විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සැපයීමටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හා එක්ව කටයුතු කරයි.

යම් සංවිධානයක් තුළ ස්ථාවර වූ ද, කාර්යක්ෂම වූ ද පද්ධති සහ පාලන විධි ඇති බව සහතික කිරීම කළමනාකරණයේ වගකීම වේ. අදාළ කළමනාකරණය විසින් එහි වත්කම් සහ ආයෝජන ආරක්ෂා කිරීම, වාර්තා වල විශ්වසනීයත්වය සහතික කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති, රෙගුලාසි, කොන්ත්‍රාත්තු සහ නියෝග පිළිපැදීම අධීක්ෂණය කිරීම යන කරුණු උදෙසා ස්ථාපිත කරනු ලබන මූල්‍ය සහ වෙනත් ආකාර යන දෙඅංශයෙන්ම හෙබි පාලන ක්‍රමවලට අයත් සමස්ත පද්ධතියම අභ්‍යන්තර පාලනය තුළ සමන්විත වේ.

## මණ්ඩලයේ 43 වන සංවත්සරය වෙනුවෙන් පිරිත් සජ්ඣායනය













## නත්තල් කැරොල් ප්‍රසංගය 2023



## වෙසක් දන්සැල 2023



## මණ්ඩලයේ 43 වන සංවත්සරයට සමගාමීව සිදුකරන ලද ලේ දන්දීමේ ව්‍යාපාරය






## පොසොන් බැති ගී ප්‍රසංගය 2023









# අධ්‍යක්ෂක මණ්ඩලය 2023

**ඩී.එල්.පී. රෝහණ අභයරත්න මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරීවරයා වන රෝහණ අභයරත්න මහතා, රාජ්‍ය සේවය තුළ වසර 30 ක කාලයක් සේවය කර ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ්‍ය හා කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක් සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඊට අමතරව, ඔහු ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. අභයරත්න මහතා රජයේ ගුරුවරයෙකු ලෙස රාජ්‍ය සේවය ආරම්භ කළ අතර, 1995 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට (SLAS) ඇතුලත් විය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා එක් වීමට පෙර පහත සඳහන් තනතුරු අභයරත්න මහතා විසින් හොබවනු ලැබී ය:

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්,
- තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති (ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය),
- ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති, ගැටුම් පීඩිත ප්‍රදේශ ආශ්‍රිත (ආසියානු සංවර්ධන බැංකුවේ) හදිසි ව්‍යාපෘතියේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ නැවත පදිංචි කිරීම පිළිබඳ විශේෂඥ,
- ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංචාරක කටයුතු),
- ශ්‍රී ලංකා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්,
- මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්,
- නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ අධීක්ෂණය),
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක (ආගමන හා විගමන).

එපමණක් නොව, අභයරත්න මහතා ශ්‍රී ලංකාවේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ඇතුළු සැලකිය යුතු තනතුරු කීහිපයක් ද හොබවා ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨයේ පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද එම විශ්වවිද්‍යාලයේම වාණිජ්‍ය සහ මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තු උපදේශක කමිටුවේ බාහිර සාමාජිකයෙකු ලෙස ද සේවය කර ඇත. මීට අමතරව, අභයරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස දායක වී කටයුතු කර ඇත.



## නීල් උමගිලිය මහතා

අධ්‍යක්ෂ

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

උමගිලිය මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර බ්‍රිතාන්‍ය කළමනාකරණ ආයතනයේ ද සාමාජිකයෙකි.

ඔහු ලංකා බැංකුවේ හිටපු සභාපතිවරයෙකු වූ අතර ඩයල් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුර ද හෙබවීය. ඔහුගේ පෙර සේවා පත්වීම් අතර පහත තනතුරු ද වේ.

- ශ්‍රී ලංකා මුදල් මණ්ඩලයේ සාමාජික,
- තොරතුරු සංනිවේදන හා තාක්ෂණ නියෝජිතායතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වැඩ බලන සභාපති සහ සාමාජික.

## ආරියසේන ගාල්ලගේ මහතා

අධ්‍යක්ෂ

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී

ආරියසේන ගාල්ලගේ මහතා නීතිඥයෙකු ලෙස වසර 28 කට වැඩි පළපුරුද්දක් ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධියක්ද ලබා ඇත. ඔහු මීට පෙර මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ උතුරු මැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇත. මෙම භූමිකාවන්ට පෙර, ඔහු විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දැරූ අතර ඒවාට පහත දැක්වෙන තනතුරු ද ඇතුළත් වන්නේ ය :

- ජනතා පොහොර සමාගමේ අධ්‍යක්ෂ
- පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ

අනෙකුත් පත්වීම් අතර සීමාසහිත පොළොන්නරුව දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම ද ඇතුළත් වේ.



# අධ්‍යක්ෂක මණ්ඩලය 2023

**උදේෂ් අයි. ඩබ්ලිව්. සෙනෙවිරත්න මහතා**
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රතිපත්ති සහ සංවර්ධන) ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු මීට පෙර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වූ ජාතික නියෝජිතායතනයේ (NAPPP) ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙසත් සේවය කර ඇත.

මෙයට පෙරාතුව, ඔහු අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) ලෙසත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙසත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විවිධ තනතුරුවලත් සේවය කර ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ඔහු දැරූ තනතුරුවලට අධ්‍යක්ෂ (නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපය) සහ අධ්‍යක්ෂ (දකුණු ආසියාව සහ සාක් කලාපය) ඇතුළත් විය. ඊට, තොරතුරු හා සංනිවේදන තාක්ෂණය එම අමාත්‍යාංශයේ විෂය සීමාව යටතේ පැවතිය දී ඒ මහතා විසින් දරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධනය උදෙසා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය) තනතුර ද අයත් විය. සෙනෙවිරත්න මහතා, ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් ඇම්මයින් නුවර පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ අමාත්‍ය නිලය සහිත රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකු ලෙස වසර තුනක සේවා කාලයක් ද සම්පූර්ණ කර ඇත.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කිරීමට පෙර ඔහු ජනාධිපති ලේකම්වරයාගේ කාර්යාංශයේ සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා අධීක්ෂණ අංශයේ සහකාර ලේකම් තනතුරු හෙබවී ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සිය ප්‍රථම පත්වීම ලබා සේවයේ නියැලෙමින් කර්මාන්ත, සංචාරක හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන), සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කාර්මික සංවර්ධන) සහ සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ තොරතුරු පද්ධති සහ කර්මාන්ත ලියාපදිංචි කිරීම) යන තනතුරු ඔහු දැරී ය.

සෙනෙවිරත්න මහතා කොළඹ 07, රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ උපාධිය ලබා ඇත. තව දුරටත්, ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් අතරට ජාත්‍යන්තර සබඳතා, ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව මෙන්ම ජපානයේ විශිෂ්ටත්ව සාමාර්ථයෙන් පුද ලද කළමනාකරණය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ඇතුළත් වේ.

ඔහු ශ්‍රී ලංකා පරිගණක සංගමයේ (CSSL) සහකාර ලේකම්වරයා වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ පළමු ලේකම්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සහකාර භාණ්ඩාගාරික සහ ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ (SASA) නියෝජ්‍ය ලේකම් වැනි ස්වේච්ඡා නිලතල ද හොබවා ඇත.



### කේ.එස්. දයාරත්න මෙනෙවිය
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

දයාරත්න මෙනෙවිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිය සාමාජිකාවකි. ඇය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිව සිටින්නී ය.

වර්තමානයේ ඇය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවත්නා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරන අතර, පුනරුත්ථාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකවරියක් ද වන්නී ය. ඇය පසුගිය කාලය තුළ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය යන ආයතනවලට අයත් අධ්‍යක්ෂ මණ්ඩලවල මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරිය ලෙස ක්‍රියා කරමින් කටයුතු කර ඇත. ඊට අමතරව, ඇය ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමෙහි අධ්‍යක්ෂවරියක් ලෙස ද සේවය කර ඇත.

### ඊ.ඒ. ඒකනායක මහත්මිය
අධ්‍යක්ෂ
වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගේ නියෝජිත

ඒකනායක මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර සංඛ්‍යාලේඛනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද, මොරටුව විශ්ව විද්‍යාලයෙන් මෙහෙයුම් පර්යේෂණ පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කැළණිය විශ්ව විද්‍යාලයෙන් දත්ත විශ්ලේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කොළඹ විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයෙන් ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා සිටින්නී ය. ඇය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ගණකාධිකාරී සහ ව්‍යාපාර 2 මට්ටමේ සහතිකය ද සම්පූර්ණ කර ඇත.

ඒකනායක මහත්මිය දැනට වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරිය ලෙස කටයුතු කරයි. මීට පෙර, ඇය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර හෙබවූවා ය.

# අධ්‍යක්ෂක මණ්ඩලය 2023



**ජුඩ් ඩිනාල් පීරිස් මහතා**
අධ්‍යක්ෂ
ලංකා සේව්‍ය සම්මේලනයේ නියෝජිත

ඩිනාල් පීරිස් මහතා යාන්ත්‍රික ඉංජිනේරුවෙකු වන අතර, එක්සත් රාජධානියේ ලන්ඩන් ව්‍යාපාරික පාසලෙන් ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇත. ඔහු ලංකා සේව්‍ය සම්මේලන කවුන්සිලයේ සාමාජිකයෙකු වන අතර, තවත් බොහෝ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තනතුරුද දරයි.

**එල්.එස්.දේවේන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

දේවේන්ද්‍ර මහතා ජනාධිපති ජාතික සම්මාන උළෙලේ දී කීර්තිමත් දේශබන්දු නාමයෙන් පිදුම් ලැබූ ප්‍රවීණ වෘත්තීය සමිති ක්‍රියාකාරියෙකි. ඔහු දැනට ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ධූරය දරන අතර, ජාත්‍යන්තර ප්‍රවාහන සේවක සම්මේලනයේ විධායක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම, දකුණු ආසියා කලාපීය වෘත්තීය සමිතියේ උප සභාපතිවරයා ලෙස ද ඔහු සේවය කරයි.

වෘත්තියෙන් නීතිඥයෙකු වන දේවේන්ද්‍ර මහතා නීතිවේදී උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් (ILO) කම්කරු ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද, එක්සත් රාජධානියේ කාර්මික සබඳතා පිළිබඳ ඩිප්ලෝමාවක් ද, ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙතින් ලබා ගත් පුහුණු කටයුතු ක්‍රමවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා සිටී.

දැරූ තනතුරු :

- ජාතික වැටුප් කොමිසමේ සාමාජික
- ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- ජාතික පුවත්පත් මණ්ඩලයේ සාමාජික
- ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සාමාජික



**ඩබ්ලිව්.එම්. නුරාජිත් සිං මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

නුරාජිත් සිං මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ (CTB) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා පොදුජන ප්‍රවාහන සේවක සම්මේලනයේ වත්මන් සභාපතිවරයා ලෙසද සේවය කරයි.



# අධ්‍යක්ෂක මණ්ඩලය 2024

**ඩී.එල්.පී. රෝහණ අභයරත්න මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරීවරයා වන රෝහණ අභයරත්න මහතා, රාජ්‍ය සේවය තුළ වසර 30 ක කාලයක් සේවය කර ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ්‍ය හා කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක් සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඊට අමතරව, ඔහු ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. අභයරත්න මහතා රජයේ ගුරුවරයෙකු ලෙස රාජ්‍ය සේවය ආරම්භ කළ අතර, 1995 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට (SLAS) ඇතුලත් විය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා එක් වීමට පෙර පහත සඳහන් තනතුරු අභයරත්න මහතා විසින් හොබවනු ලැබී ය:

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
- අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්,
- තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති (ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය),
- ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති, ගැටුම් පීඩිත ප්‍රදේශ ආශ්‍රිත (ආසියානු සංවර්ධන බැංකුවේ) හදිසි ව්‍යාපෘතියේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ නැවත පදිංචි කිරීම පිළිබඳ විශේෂඥ,
- ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංචාරක කටයුතු),
- ශ්‍රී ලංකා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්,
- මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්,
- නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ අධීක්ෂණය),
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක (ආගමන හා විගමන).

එපමණක් නොව, අභයරත්න මහතා ශ්‍රී ලංකාවේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ඇතුළු සැලකිය යුතු තනතුරු කීහිපයක් ද හොබවා ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨයේ පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද එම විශ්වවිද්‍යාලයේම වාණිජ්‍ය සහ මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තු උපදේශක කමිටුවේ බාහිර සාමාජිකයෙකු ලෙස ද සේවය කර ඇත. මීට අමතරව, අභයරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස දායක වී කටයුතු කර ඇත.



**කේ.ජී.එම්. හරීන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

හරීන්ද්‍ර මහතා ඇමරිකාවේ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයෙන් (IUA) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (ගෞරව) උපාධියක් ලබා ඇත. ඔහු ඩිප්ලෝමා සහතික කිහිපයක් ද ලබා ඇත. එනම්, :

- ලන්ඩනයේ ලේටන් විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව
- ව්‍යාපාර කළමනාකරණය සහ පරිගණකවේද ලන්ඩන් විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව
- ලන්ඩනයේ තාක්ෂණ විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව
- අබුඩාබි ගුවන් සේවා (UAE) වෙතින් ලබා ගත් ගුවන් සේවා පිළිබඳ මානව සාධක පිළිබඳ ඩිප්ලෝමාව

ගරු වරාය, නාවික සහ ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමාගේ මෙන්ම ගරු යෞවන කටයුතු හා ක්‍රීඩා පිළිබඳ කැබිනට් අමාත්‍ය තුමාගේ ද සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස හරීන්ද්‍ර මහතා සේවා කටයුතු කර ඇත.

දැරූ තනතුරු :

- මාලින්ස් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවේට් ලිමිටඩ් ශ්‍රී ලංකා ආයතනයෙහි අධ්‍යක්ෂ - (2019 වර්ෂයේ සිට මේ දක්වා)
- ආවර් ප්‍රයිම් ඉන්ටර්නැෂනල් ප්‍රයිවේට් ලිමිටඩ් (පුනර්ජනනීය බලශක්ති - සූර්යාලෝක) - ශ්‍රී ලංකා ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරී - 2020 වර්ෂයේ සිට මේ දක්වා
- ක්ලවුඩ් ඇට්ලාන්ටික් ප්‍රයිවේට් ලිමිටඩ් - ශ්‍රී ලංකා ආයතනයෙහි අධ්‍යක්ෂ / මෙහෙයුම් - 2015 සිට 2020 දක්වා
- ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් හි බර්හාන් ග්‍රෑප් ඔෆ් කම්පනීස් ආයතනයෙහි අධ්‍යක්ෂ / මෙහෙයුම් (2014)
- ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි බවර් මීඩියා ආයතනයෙහි පරිපාලන කළමනාකරු
- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි ගුවන් සේවා ආයතනයෙහි ගුවන් යානා ඉංජිනේරු සම්බන්ධීකාරක (2011 සිට 2014 දක්වා)
- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි ගුවන් සේවා ආයතනයෙහි ගුවන් යානා ඉංජිනේරු සම්බන්ධීකාරක (2011 සිට 2014 දක්වා)
- ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශයේ (සැලසිනේ - ශ්‍රී ලංකා ආයතනයෙහි) සේවාදායක සේවා කළමනාකරු (2009 සිට 2011 දක්වා)
- ලැඩ්බ්‍රෝක්ස් ලිමිටඩ් (එක්සත් රාජධානිය) ආයතනයෙහි නියෝජ්‍ය කළමනාකරු - (2006 සිට 2009 දක්වා)
- ටෙස්කෝ ලිමිටඩ් (එක්සත් රාජධානිය) ආයතනයෙහි තොග පාලක - (2004 සිට 2006 දක්වා)

# අධ්‍යක්ෂක මණ්ඩලය 2024





**එස්.එෆ්.එච්. ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්
ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය සහ ඕස්ට්‍රේලියාව යන රටවල පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයන්හිම සැලකිය යුතු පළපුරුද්දක් සහිත වූ ගණකාධිකාරීවරයෙකු ලෙස ප්‍රනාන්දු මහතා සතු සාරගර්භ පසුබිමක් ඇත. ඔහු විශේෂයෙන්, බාට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි ආරම්භක කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ අතර, බාට්ලීට් සමාගම් සමූහය තුළ පැවති තවත් සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු ද ඔහු හොබවා ඇත.

දැරූ තනතුරු :

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ සභාපති
- ලංකා වරාය අධිකාරියේ සීමාසහිත ජය බහලු පර්යන්ත සමාගමේ සභාපති
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ අධ්‍යක්ෂ සහ සංචාරක අමාත්‍යවරයාගේ උපදේශක
- ඕස්ට්‍රේලියාවේ බී ඩී එස් කෝපරේෂන් ආයතනයේ මූල්‍ය පාලක
- එක්සත් රාජධානියේ ඉක්‍රොහේටින්ග් සමාගම් සමූහයේ සමූහ ගණකාධිකාරී
- ජාතික කම්කරු උපදේශක කමිටුවේ සාමාජික
- කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති

**එම්. පාර්තිපන් මහතා**
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

එම්. පාර්තිපන් මහතා කෘෂිකර්මය පිළිබඳව විද්‍යාවේදී (ගෞරව) උපාධිය යාපනය විශ්ව විද්‍යාලයෙන් ලබා ඇති අතර, සාමාන්‍ය කළමනාකරණය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් හදාරමින් සිටී. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක්ද ලබා ඇත.

ඔහු මේ වන විට ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති සහකාර ලේකම්වරයෙකු ලෙස රාජ්‍ය අංශය තුළ කටයුතු කරයි. ඊට පෙර, ඔහු ඉඩම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයකු (ඉඩම් අත්පත් කර ගැනීම් සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය / NIRP) ලෙස සේවය කළේ ය. තවද, ඔහු එස් ජී එස් එස්. ඒ. / එස් ජී එස් ලංකා (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර සංවර්ධන විධායක නිලධාරියෙකු ලෙස ද, ලංකෙම් සිලෝන් පීඑල්සී සමාග මෙහි ආයතනික කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ද පුද්ගලික අංශ සේවයේ පළපුරුද්ද ලබා ඇත්තෙකි.



**කේ.එස්. දයාරත්න මෙනෙවිය**
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

දයාරත්න මෙනෙවිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිව සිටින්නී ය.

වර්තමානයේ ඇය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවත්නා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරන අතර, පුනරුත්ථාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකවරියක් ද වන්නී ය. ඇය පසුගිය කාලය තුළ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය යන ආයතනවලට අයත් අධ්‍යක්ෂ මණ්ඩලවල මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරිය ලෙස ක්‍රියා කරමින් කටයුතු කර ඇත. ඊට අමතරව, ඇය ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමෙහි අධ්‍යක්ෂවරියක් ලෙස ද සේවය කර ඇත.

**කේ.ඒ. පී ද සිල්වා මහත්මිය**
අධ්‍යක්ෂ
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් පත් කරන ලදි.

ද සිල්වා මහත්මිය කැළණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක්ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතික ලත් වෘත්තීය මූල්‍ය ගණකාධිකාරී (CPFA) සුදුසුකම් ලබා ඇත.

ඇය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස ද, සී. බබ්ලිව්. ඊ. කන්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයෙහි සභාපතිනිය ලෙස ද වර්තමානයේ කටයුතු කරන්නී ය. ඇය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද ප්‍රධාන ගණකාධිකාරීවරිය ලෙස කටයුතු කළා ය. ද සිල්වා මහත්මිය, වී අලෙවි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් ලෙස සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්වරිය - මූල්‍ය ලෙස ද සේවා කටයුතු ඉටු කර ඇත.



# අධ්‍යක්ෂක මණ්ඩලය 2024

**ජුඩ් ඩිනාල් පීරිස් මහතා**
අධ්‍යක්ෂ
ලංකා සේව්‍ය සම්මේලනයේ නීතීඥ

ඩිනාල් පීරිස් මහතා යාන්ත්‍රික ඉංජිනේරුවෙකු වන අතර, එක්සත් රාජධානියේ ලන්ඩන් ව්‍යාපාරික පාසලෙන් ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇත. ඔහු ලංකා සේව්‍ය සම්මේලන කවුන්සිලයේ සාමාජිකයෙකු වන අතර, තවත් බොහෝ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තනතුරුද දරයි.

**එල්.එස්.දේවේන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

දේවේන්ද්‍ර මහතා ජනාධිපති ජාතික සම්මාන උළෙලේ දී කීර්තිමත් දේශබන්දු නාමයෙන් පිදුම් ලැබූ ප්‍රවීණ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයෙකි. ඔහු දැනට ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ධූරය දරන අතර, ජාත්‍යන්තර ප්‍රවාහන සේවක සම්මේලනයේ විධායක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම, දකුණු ආසියා කලාපීය වෘත්තීය සමිතියේ උප සභාපතිවරයා ලෙස ද ඔහු සේවය කරයි.

වෘත්තියෙන් නීතීඥයෙකු වන දේවේන්ද්‍ර මහතා නීතිවේදී උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් (ILO) කම්කරු ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද, එක්සත් රාජධානියේ කාර්මික සබඳතා පිළිබඳ ඩිප්ලෝමාවක් ද, ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙතින් ලබා ගත් පුහුණු කටයුතු ක්‍රමවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා සිටී.

දැරූ තනතුරු :

- ජාතික වැටුප් කොමිසමේ සාමාජික
- ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- ජාතික පුවත්පත් මණ්ඩලයේ සාමාජික
- ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සාමාජික



**ඩබ්ලිව්.එම්. නුරාජිත් සිං මහතා**

අධ්‍යක්ෂ

වෘත්තීය සමිති නියෝජිත

නුරාජිත් සිං මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ (CTB) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා පොදුජන ප්‍රවාහන සේවක සම්මේලනයේ වත්මන් සභාපතිවරයා ලෙසද සේවය කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම





**ආර්.කේ. ජයලත් මහතා**
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

සාමාන්‍යාධිකාරී (වැඩ බලන) ආර්. කේ. ජයලත් මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබා කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) උපාධිය ද ලැබුවේ ය. ඔහු ඉන්පසු, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේ ය. ජයලත් මහතා, රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, තම සේවා කාර්යභාරය ඉටු කිරීම සඳහා අවැසි දැනුම සහ විශේෂ ප්‍රගුණතා සම්භාරයක් තම සන්තකයේ තබා ගනිමින් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වසර 20 කට වැඩි පළපුරුද්දක් දරයි.

**කේ.එස්. වැලිවිට මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන)

කේ.එස්. වැලිවිට මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ධූරය හොබවයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ද, ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ද සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මුදල් පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධියක් සහ ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයෙන් තොරතුරු පද්ධති ආරක්ෂණය සහ පාලන විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. පෞද්ගලික සහ රාජ්‍ය ආයතන යන ද්වයෙහිම මූල්‍ය හා විගණනය පිළිබඳ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති වැලිවිට මහතා ඔහු තෝරාගත් ක්ෂේත්‍රයේ කෘතහස්ත විධායක නිලධාරියෙකි.





### ඩබ්ලිව්.ජී.කේ. රත්නායක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ඩබ්ලිව්.ජී.කේ රත්නායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය යන දෙකෙහිම සාමාජිකයෙකි. ඊට අමතරව, ඔහු තම තනතුරට සුවිශේෂී අගයක් එකතු කර දෙමින් එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ II වන අදියර සඳහා ද අර්ධ වශයෙන් සුදුසුකම් ලබා ඇත.

### ජේ.කේ.පී. රංජිත් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(එකතු කිරීම් සහ සේවායෝජක සබඳතා) 2024.01.15 වන දින සේවයෙන් විශ්‍රාම ලැබී ය.

2024 ජනවාරි මස 15 වන දින සිය සේවයෙන් විශ්‍රාම ලැබූ ජේ.කේ.පී. රංජිත් මහතා, රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙසින් කටයුතු කළ අතර, අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් රාශියක් ඔහු සතුව පැවතියේ ය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ කළමනාකරණ වරලත් ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකයෙකි. රංජිත් මහතා ජාත්‍යන්තර පොත් තබන්නන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් සහතිකය සතු අයෙකි. ස්වකීය කාර්ය භාරය තුළ කැපවීමෙන් සේවය කරනු පිණිස ඔහුගේ වෘත්තීය සාමාජිකත්ව සුදුසුකම් අතරට සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරී (CBA) සහතිකය සහ ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරී (CGMA) සහතිකය ඇතුළත් ප්‍රගුණතා ඔහු විසින් හිමි කර ගනු ලැබ සිටියේ ය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම





**එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) /
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**එච්.එම්.ඒ. ජයන්ත කුමාර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා වර්තමානයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) සහ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ලෙස සේවා කටයුතු ඉටු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අලුත්ගමගේ මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කේන්ද්‍රීය ක්ෂේත්‍රයක් අධීක්ෂණය කරන නිලධරයෙකි.

එච්.එම්.ඒ. ජයන්ත කුමාර මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා සම්බන්ධ නීතිමය කටයුතු ඉටු කරමින් දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) තනතුරෙහි සේවය කරයි. ඒ මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය (ගෞරව) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් නීතිපති උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ද ලබා ඇත. ජයන්ත කුමාර මහතා, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු, නොතාරිස්වරයෙකු සහ දිවුරුම් කොමසාරිස්වරයෙකු ද වේ. ඔහු සමාගම් ලේකම්වරයෙකු ලෙස ද ලියාපදිංචිය ලබා ඇත.





**ආර්.ජේ.සී.එස්. සම්පත් ගුණවර්ධන මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

ආර්.ජේ.සී.එස්. සම්පත් ගුණවර්ධන මහතා පරිපාලන හා මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරයි. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. මීට අමතරව, ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් සේවක අධ්‍යාපනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත. ගුණවර්ධන මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගනිමින් තම දක්ෂතාව තව දුරටත් ඉදිරියට ගෙන ගියේ ඔහු තමා සේවය කරන ආයතනයේ ප්‍රධාන අංශයකට මනාව ගැළපෙමෙනි.

**වජිරා ජයරත්න මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(දායක මුදල්රැස්කිරීම් සහ අධිභාර)

වජිරා ජයරත්න මහත්මිය සක්‍රියව ප්‍රධාන මෙහෙවරක නියැලී සිටිමින් සහකාර සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ අධිභාර) තනතුරෙහි සිය සේවා කටයුතු ඉටු කරයි. ඇය කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ ඕස්ට්‍රලියානු කළමනාකරණ ආයතනයේ ව්‍යාපාරික පාසලෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම





**පී.එල්.එල්.සී.පී. අල්විස් මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(බලාත්මක කිරීමේ කලාපය III)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා)
තනතුරේ ආවරණ රාජකාරි

පී.එල්.එල්.සී.පී. අල්විස් මහත්මිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා) තනතුර වෙනුවෙන් රාජකාරි ආවරණය කරන අතිරේක වගකීම් සහිතව සහකාර සාමාන්‍යාධිකාරී (බලාත්මක කිරීමේ කලාපය III) භාර නිලධාරිනිය ලෙස සේවය කරන්නී ය. ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් පළමු පන්තියේ ගෞරව සුදුසුකම් සහිතව විද්‍යාවේදී උපාධියක් ද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ජෛව තාක්ෂණය පිළිබඳ විශේෂඥතාව සහිත විද්‍යාපති උපාධියක් ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. මීට අමතරව, ඇය ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනයේ ව්‍යවහාරික සංඛ්‍යාලේඛනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. දැනට, අල්විස් මහත්මිය සිය වෘත්තීය සුදුසුකම් පෙළට තව දුරටත් කෙරෙන එකතු කර ගැනීම් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධියක් ද හදාරමින් සිටින්නී ය.

**කේ.ජී.එන්. රත්නායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

කේ.ජී.එන්. රත්නායක මහතා පරිපාලන හා මානව සම්පත් අධීක්ෂණ කටයුතු ඉටු කරමින් එහි සහකාර සාමාන්‍යාධිකාරීවරයා ලෙස ඉතා දක්ෂ ලෙස සේවය කරයි. ඔහු කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර පිරිස් කළමනාකරණ වරලත් ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකි.





**පුෂ්පරංග වීරසේකර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

**එච්.ජී.ඩී. නිහාල් ප්‍රසන්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

පුෂ්පරංග වීරසේකර මහතා තම නම ඉදිරියේ සුදුසු සුදුසුකම් රාශියක් ලබා සිටින්නෙකි. ඔහු දැනට සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් සහිතව ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයෙන් ලියාපදිංචි ඉංජිනේරු පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වීරසේකර මහතා ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකු වන අතර එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ ද සාමාජිකයෙකි. ඒ මහතා, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ද පිළිගැනීමක් ලබා ඇත. තවද, ඔහු කෘතිම බුද්ධි පද්ධති වැඩසටහන පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ජාවා පරිගණක යෙදුම පිළිබඳ ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.

එච්.ජී.ඩී. නිහාල් ප්‍රසන්න මහතා, සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ලෙස වැඩබලන ධාරිතාවකින් කටයුතු කරයි. ඔහු රුහුණු විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු චීනයේ වුහාන් නුවර හස්ට් (HUST) විශ්ව විද්‍යාලයේ උසස් මට්ටමේ වෘත්තීය වැඩසටහනක් සම්පූර්ණ කර ඇත. ඔහු සතු අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත කැපවීමෙන් යුතුව සේවය කිරීම සඳහා අමතර ශක්තියක් ඔහුට ලබා දෙයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම



**කේ.ඩී.ඒ.පී. කරුණාරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මුදල්)

කේ.ඩී.ඒ.පී. කරුණාරත්න මහතා සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර දරමින් සේවය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු ලෙස උසස් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දරයි. ඒ මහතා, මූල්‍ය හා ගිණුම්කරණ ක්ෂේත්‍රය සඳහා තම හැකියාව සහ කැපවීම ද ප්‍රදර්ශනය කරමින් සිය රාජකාරී කටයුතු ඉටු කරයි. ඔහුගේ මහඟු සේවා සාමාජිකත්වය, ස්වකීය කර්මාන්තය තුළ වෘත්තීය නිපුණතා සහ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වන ඔහුගේ කැපවීම අවධාරණය කරයි.



# කළමනාකාරිත්ව කණ්ඩායම
(2023/12/31 දිනට)

## සංස්ථාපිත කාර්යාලය

### දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

**කේ. එම්. ඩී. ඒ. යූ. ගුණවර්ධන මෙනවිය**
මූල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)

**ඒ. විදානපතිරණ මහත්මිය**
කළමනාකරු (අධිභාර)

**එන්. සී. ඈපා මහත්මිය**
මූල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්) 01.03.2024

**ඒ. ජේ. ආර්. අනුර මහතා**
කළමනාකරු (ස්වයංරැකියා සහ සංක්‍රමික සේවා)

### සාමාජික සේවා

**එම්. රාහුෆ්ඩීන් මහතා**
කළමනාකරු (සාමාජික ගිණුම්)

**ඒ. එච්. එන්. ප්‍රියන්ති මහත්මිය**
මූල්‍ය කළමනාකරු (ප්‍රතිලාභ ගෙවීම්)

**අයි. විජේතුංග මහත්මිය**
කළමනාකරු (සාමාජික ගිණුම් - කුඩා කාණ්ඩය)

**එස්. ආර්.  නන්දසීලි මහත්මිය**
කළමනාකරු (ප්‍රතිලාභ තීරණය කිරීම)

**එච්. කේ. කේ. පී. පුෂ්පකුමාර මහතා**
කළමනාකරු (ප්‍රතිලාභ)

**සුරාජ් ඩිලන්ත මහතා**
කළමනාකරු (ප්‍රතිලාභ පරිපාලන)

### ආයෝජන

**එන්. ආර්. එන්. ප්‍රනාන්දු මහත්මිය**
මූල්‍ය  කළමනාකරු

**එච්. එම්. සී. දමයන්ති මහත්මිය**
මූල්‍ය කළමනාකරු

**ඩබ්ලිව්. ඒ. ඒ. හංසමාලි මහත්මිය**
කළමනාකරු(ආයෝජන)

### මුදල් අංශය

**එම්. ඒ. වී. කුමුදිනි මෙනවිය**
මූල්‍ය කළමනාකරු (මුදල්)

### අභ්‍යන්තර විගණන

**එන්. පී. බිමන්ත මහතා**
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

**ඩී. එල්. සී. ඩී. කුමාර මහතා**
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

## පරිපාලන හා මානව සම්පත්

**බී. සරත් මහතා**
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**එස්. වීරසිංහ මහත්මිය**
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**ටී. එම්. අයි. අම්ඩොන් මහතා**
කළමනාකරු (ප්‍රසම්පාදන)

**ටී. එච්. සී. පී. කුමාර මහතා**
කළමනාකරු (එලදායිතා)

## තොරතුරු තාක්ෂණ

**බී. ඩී. වඩුගේ මහතා**
කළමනාකරු (තොරතුරු තාක්ෂණ)

## නීති

**එස්. ආර්. එස්. පුංචිහේවා මිය**
කළමනාකරු (නීති)

**එස්. පී. රාජපක්ෂ මහතා**
කළමනාකරු (නීති)

## ප්‍රාදේශිය කළමනාකරුවන්

**එච්. පී. පෙරේරා මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ දිස්ත්‍රික් කාර්යාලය)
2023.06.07 වන දින විශ්‍රාම යන ලදි

**එම්. ඒ. චන්ද්‍රසේන මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 1 - 7)

**කේ. එන්. අශෝක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 8 -15)

**යූ. එච්. එස්. රංජිත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - නුවර එළිය

**එන්. කේ. යූ. කේ. නාගසිංහ මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - බදුල්ල

**ප්‍රියංගි විජේරත්න මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කළුතර

**ඩී. එම්. කේ. පී. ඒ. දසනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - කුරුණෑගල

**ඩී. කේ .එස්. එස්. දිසානායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - හම්බන්තොට

**ඊ. එම්. එස්. කේ. ඒකනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - මහනුවර

**ඒ. කේ. එන්. ප්‍රසංගනි මිය**
නීති නිලධාරි - මහනුවර

**ජේ. එම්. එස්. බී. තෙන්නකෝන් මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කෑගල්ල

**සාගර හේවාගම මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - ගම්පහ

**සී. අබේගුණසේකර මිය**
ප්‍රාදේශිය කළමනාකරු - මාතර

**පී. හෙට්ටිආරච්චි මයා**
ප්‍රාදේශිය කළමනාකරු - අනුරාධපුර
(වැඩ ආවරණ)

**ජේ. තමිල්ලාගන් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - යාපනය

**ඒ. පී .පී. ගුණේන්ද්‍ර මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - ගාල්ල

**එස්. එම්. ගුණසිංහ මිය**
ප්‍රාදේශිය කළමනාකරු - වව්නියා

**සිසිර රංජිත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - නුවර එළිය

**ඩී. ඩී. කුළරත්න මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - රත්නපුර

**ජේ. සී. ජයසිංහආරච්චිමෙනවිය**
ප්‍රාදේශිය කළමනාකරු - අම්පාර



# ආයතනික පාලනය

යහපත් ආයතනික පාලනය, ඉහළ ප්‍රමුඛතා කාර්ය භාරයක් සේ සලකන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අර්ධ රාජ්‍ය ආයතනයක් වන්නේ ය. ස්වකීය සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු හරහා ව්‍යාප්ත වන පරිදි අදාළ ව්‍යවස්ථාමය හා නියාමනීය විධිවිධානවලට අනුකූලතාව දක්වමින් කටයුතු කරනු පිණිස මණ්ඩලය බැඳී සිටින්නේ ය. ස්වකීය පාලන කාර්ය භාරයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා මණ්ඩලය මෙහෙයවනු ලබන ප්‍රධාන මාර්ගෝපදේශ වනුයේ, විනිවිද භාවය, විශ්වාසදායක භාවය හා අනුකූලතාව දැක්වීම යන තෙවැදෑරුම් ප්‍රතිපත්තියයි.

### ආයතනික පාලනයේ කාර්ය රාමුව

මණ්ඩලයේ පාලන ව්‍යුහය ග්‍රැපික් චිත්‍රමය කව අනුසාරයෙන් පහත දක්වා ඇත:

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයතනික පාලන ව්‍යුහය, විශේෂිත භූමිකා හා වගකීම් සහිතව පැහැදිලි වාර්තාකරණමය මාර්ග ද සමග බහු ස්ථරවලින් සැදුම් ලත් පාලන ආයතන වලින් සමන්විත වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සිය අධීක්ෂණමය මෙහෙවර සලසා දෙන අතරම එහි උපාය මාර්ගික දිශානතිය, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන් කර දීම සහ අවදානම් නැඹුරුව යන කරුණු පිළිබඳව මණ්ඩලයේ ඉහළ කළමනාකරණ පාලනාධිකාරිය සමග නිරන්තර සංකථනයේ යෙදෙයි.


කොටස් හිමියන්
(අරමුදලේ සාමාජිකයින්)
විගණකාධිපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
මණ්ඩලයේ අනු කමිටුව
සාමාන්‍යාධිකාරී
කළමනාකරණ කමිටුව (සියළු නියෝජ්‍ය සාමාන්‍යකාරීන්/ සහකාර සාමාන්‍යාධිකාරී)
විගණන කමිටුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
අවදානම් කළමනාකරණ කමිටුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
අයෝජන කමිටුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (ආයෝජන)
දුක්ගැනිවිලි කමිටුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්)
අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විශේෂිත වගකීම් සහ පැහැදිලි නිශ්චිත විධානයන් මත ක්‍රියාත්මක වේ. කමිටුවේ සභාපතිවරු කමිටුවේ ඵලදායි ක්‍රියාකාරීත්වය සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සිදුකිරීම සඳහා වගකිව යුතුය
කළමනාකරණ කමිටු
මෙහෙයුම් තීරණ කළමනාකරණය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරනු ලැබ ඇත. කළමනාකරණ කමිටුව දෛනික මෙහෙයුම් තීරණ ගැනීමට සහ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වෙත නිර්දේශ සිදුකිරීමට ස්ථාපිත කර ඇත.

ආයතනික පාලනයේ ඉහළම මට්ටමේ සම්මත ප්‍රමිති පවත්වාගෙන යමින් ඒ අනුව කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම හා වගකීම බව මෙම වාර්තාව තුළින් අවධාරණය කෙරේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, යහපත් පාලන ව්‍යුහ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම යන කාර්යභාරය විෂයයෙහි ඉතා ඉහළ වගකීමක් දරන අතර මණ්ඩලයේ කාර්යය හා කර්තව්‍යය උදෙසා වන උපස්ම තලයේ පන්නරය එලදායි ලෙස ඔවුන් විසින් සලසා දෙනු ලැබිය යුතු ය. නියාමන වෙනස්කම් ද, උද්ගත විය හැකි අවදානම් හා අවස්ථා මෙන්ම අභ්‍යන්තර වෙනස්කම් යනාදිය ද පිළිබිඹු වනු පිණිස පාලන භාවිතා හා චර්‍යා සමාලෝචනයට හසු කර නිරන්තරව යාවත්කාලීන කෙරේ.

මණ්ඩලයේ පාලන කාර්ය රාමුව පහත ලැයිස්තු ගත කර ඇති පරිදි බාහිර සහ අභ්‍යන්තරික මෙහෙයුම් හා සබැඳි මෙවලම් කීපයකට සාරානුකූල වන ආකාරයෙන් සකසා ඇත:

- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් අරමුදල් පනත;
- මුදල් රෙගුලාසි (රජය);
- රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- විශිෂ්ට භාවිත හා චර්යා සංග්‍රහය (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල අයිතිවාසිකම් සපුරාලන අතරම සංස්ථාපිත ආයතන ක්‍රියා කළ යුතු ආකාරය ආමන්ත්‍රණය කෙරෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ට චර්‍යා සංග්‍රහය;
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත;
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය;
- සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වන 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත හා ඊට සිදු කරන ලද සංශෝධන;
- මුදල් එකතු කර ගන්නා නියෝජිතයන් සඳහා බදු අධිකාරීන් විසින් නිකුත් කරන ලද පනත්, චක්‍රලේඛ සහ ගැසට් නිවේදන.
- රජයේ අදාළ චක්‍රලේඛ (මහ භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

## 1. අධ්‍යක්ෂ මණ්ඩලය

### 1.1. මණ්ඩලය

රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වයෙහිලා ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කළමනාකාරිත්වය, කාර්යක්ෂම මෙහෙයුම් කටයුතු අරභයා සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම විෂයයෙහි සහතික වන්නා වූ එලදායී අභ්‍යන්තර පාලන විධි පද්ධතියක් පවත්වාගෙන යන බවට වග බලාගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙසෙසා කටයුතු කරයි.

### 1.2 අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබ ඇත්තේ ඉහළ විවිධත්වයක් ආරෝපණය වන අයුරින් පුළුල් සමාජ හරස්කඩක් සහිත පසුබිම් මට්ටමකින් (මූල්‍ය, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය හා වෘත්තීය සමිති යනාදිය) තෝරා ගැනීමෙන් පසුව ය. මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කෙරෙන කරුණු සම්බන්ධයෙන් ස්වාධීන මතයක් ගෙන හැර දැක්වීමට ඔවුන්ට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය:

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු;
- මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- සාමාජිකයන් 100,000 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිතිවල කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

### 1.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරු ලෙස තම අධිකාරියට යටත් කර ඇති අයිතිවාසිකම් සහ වගකීම් අවංකව සහ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. තමන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන යම් තීරණ හා ඉටු කරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේ දී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයින් මණ්ඩලය සෑම විටම සිය භාරදූර

වගකීම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු පහත දක්වා ඇත:

- ප්‍රතිපත්ති සකස් කිරීම;
- අරමුදලේ කාර්යකරණය අධීක්ෂණය කිරීම හා ඇගයීම;
- උසස්තම සදාචාරාත්මක ප්‍රමිතීන් සහිත ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් සහතික කරන අතරම පරිපාලිත සමාගම්වල, ආශ්‍රය සමාගම්වල හා වෙනත් ආයෝජනවල අරමුණු පිළිබඳ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම;
- වාර්ෂික කාර්ය සාධනය සමාලෝචනය කිරීම;
- කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම;
- කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා විශ්ලේෂණය කිරීම සහ ප්‍රගමනීය ක්‍රියාමාර්ග ගැනීම.

## 1.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාල විරාමයක් සහිතව සහ අවශ්‍ය වන අවස්ථාවලදී රැස්වේ. මණ්ඩලය වසර තුළ අවස්ථා 15 ක දී රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරබයා ඊට අදාළ මණ්ඩල පත්‍රිකා යෝග්‍ය කාල වේලාවක් සහිතව යටත් පිරිසෙයින් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර බෙදා හරිනු ලැබේ. 2023 වසරේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට එහි සාමාජිකයන්ගේ පැමිණීම පහත දැක්වෙන අයුරින් පැවතියේ ය.

| නම | සහභාගිවූ රැස්වීම් ගණන | 2023 මුල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් ගණන | සහභාගී වූ රැස්වීම්වල ප්‍රතිශතය % |
|---|---|---|---|
| ඒ. ආර්. දේශප්‍රිය මහතා* | 01 | 15 | 6.7% |
| ඩී. එල්. පී. ආර්. අභයරත්න මහතා | 14 | 15 | 93.3% |
| නීල් උමගිලිය මහතා | 14 | 15 | 93.3% |
| ආරියසේන ගාල්ලගේ මහතා | 15 | 15 | 100% |
| කේ. එස්. දයාරත්න මෙනවිය | 13 | 15 | 86.6% |
| උදේශ් අයි. ඩබ්ලිව්. සෙනවිරත්න මහතා | 10 | 15 | 66.7% |
| ඊ. ඒ. ඒකනායක මිය | 13 | 15 | 86.6% |
| ජුඩ් ඩිනාල් පීරිස් මහතා | 09 | 15 | 60% |
| එල්. එස්. දේවේන්ද්‍ර මහතා | 14 | 15 | 93.3% |
| ඩබ්ලිව්. එම්. නුරාජිත් සිං මහතා | 13 | 15 | 86.7% |

** 2023.02.01 වන දින සේවයෙන් ඉවත්වන ලදි.*

## 1.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව

ආයතනය ඵලදායි ලෙස කළමනාකරණය කර එය, යහපාලනයේ ඉහළතම ප්‍රමිතීන් කරා මෙහෙයවමින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය වන්නා වූ විශේෂඥ දැනුම, කුසලතාව සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සතුව පවතී. ඔවුහු ඉදිරි දැක්ම, නායකත්ව ලක්ෂණ, සාධිත නිපුණතාව සහ ඍජු අවංකභාවය යනාදී ගුණාංගවලින් හෙබි තැනැත්තන් වන්නා හ. මණ්ඩලීය සාමාජිකයින්ගේ පෞද්ගලික වෘත්තීක විස්තර මෙම වාර්තාවේ 46 පිටුවෙහි ගෙනහැර දක්වා ඇත.

## 1.6 ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැය වන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වන්නේ ය. අදාළ මණ්ඩල පත්‍රිකා පරිශීලනය කර අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් කාල වේලාවක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීම සහතික වනු පිණිස ඒවා සාමාන්‍යයෙන් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර ඔවුන් අතර බෙදා හරිනු ලැබේ.

## 2. මණ්ඩලීය ලේකම්

නියමිත කාර්ය පටිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ආයතනික ලේකම් වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ඉඩ ප්‍රස්ථාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ කාර්ය පටිපාටි අනුගමනය කෙරෙන බවට මණ්ඩලීය ලේකම් වගබලා ගත යුතු අතර මණ්ඩලයට ඵලදායක ලෙස ඔවුන්ගේ කාර්යයන් ඉටු කරනු පිණිස මණ්ඩල පත්‍රිකා කලට වේලාවට බෙදා හැරිය යුතු ය.

### 2.1 මණ්ඩලීය ලේකම්ගේ කාර්යභාරය

මණ්ඩලීය ලේකම්, සම්මත අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම් දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම;
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයා දීමෙන් ඔවුන්ට සහය සැලසීම.

## 3. සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 3.1 සභාපති වරයාගේ පත්කිරීම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා වනුයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ය. සභාපති වරයා පත්කරනු ලබන්නේ අමාත්‍ය තුමා විසිනි.

### 3.2 සභාපති වරයාගේ වගකීම්

සමස්ත ආයතනික පාලනතන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි උපාය මාර්ගික දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, උපාය මාර්ගික සැලසුම් හා මූලාරම්භක වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 3.3 උපායමාර්ගික සහ මෙහෙයුම් කටයුතුවල සමබරතාවය

භූමිකාවන්හි පැහැදිලි බව සහ වගකීම් ඵලදායී ලෙස වෙන් කිරීම තුළින් සුදුසු බල තුලනය සහතික කෙරේ. සභාපතිවරයාගේ කාර්යභාරය සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයෙන් වෙන්ව පවතී. සභාපති විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. සාමාන්‍යාධිකාරීවරයා මෙහෙයුම් කටයුතුවලට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් දරන්නේ නැත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධාන භූමිකාවන් / වගකීම් පහත දැක්වේ:

**සභාපති**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත උපාය මාර්ගික දැක්ම

ඉහල මට්ටමේදී උපායමාර්ගික හැසිරීම් සකස් කිරීම

සියළුම උපාය මාර්ගික දිශානතීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීත්වය

ශ්‍රී ලංකා රජය ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සමග ඵලදායී සන්නිවේදනය පවත්වා ගැනීම

ප්‍රමාණවත් තොරතුරු සියළුම අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි බව සහතික කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාදාචාර හැසිරීම ස්ථාපිත කිරීම

**සාමාන්‍යාධිකාරී**

දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පරමාර්ථ සකස් කරමින් උපයා මාර්ගික දැක්ම ක්‍රියාවට නැංවීම

ආයතනික සැලැස්මේ දක්වා ඇති කාර්ය සාධන අරමුණු අත්කර ගැනීම

ඉලක්ක පිළිබඳ නිරන්තර නියාමනය සහ ඒවායේ අත්කරගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම

මණ්ඩලය අනුමත අවදානම් රුචිය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම

ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට මෙහෙයුම් නායකත්වය ලබාදීම

## 4. ගණන් දීම හා විගණනය

### 4.1 මූල්‍ය වාර්තාකරණය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ද, එමෙන්ම, ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත ප්‍රකාරව ද පිළියෙළ කර ඉදිරිපත් කෙරෙනු ඇත.

#### 4.1.1 ව්‍යවස්ථාමය හා නියාමනය වාර්තාකරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වන වගන්තියට අනුකූලව විගණකාධිපතිවරයා මණ්ඩලයේ විගණක වරයා ලෙස කටයුතු කළ යුතු වන්නේ ය.

#### 4.1.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණක වරයාගේ වගකීම

පිටු අංක 142 හි යාකර ඇති විගණකාධිපති වාර්තාව පරිශීලනය කරන්න.

#### 4.1.3 කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ගැඹුරු ලෙස විස්තර කෙරෙන පිටු අංක 23 සිට 45 දක්වා සපයා ඇති කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය බලන්න.

### 4.2 අභ්‍යන්තර පාලනය

#### 4.2.1 අභ්‍යන්තර විගණන කෘත්‍යය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට තමන් සතු අභ්‍යන්තර විගණන අංශයක් ඇත. එය, විගණන කමිටුව හරහා මණ්ඩලයට ඉදිරිපත් කරන අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කරයි.

#### 4.2.2. අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාව පිළිබඳ විගණන කමිටු සමාලෝචනය

අභ්‍යන්තර විගණන අංශය, මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව පිළිබඳව විගණන කමිටුව වෙත අඛණ්ඩ පදනමක් මත වාර්තා කරයි. එහිලා මූල්‍ය වාර්තාකරණය පිළබඳ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ සමාලෝචනයක් ද ඇතුළත් වේ.

# අනු කමිටු



# විගණන කමිටු වාර්තාව

## කමිටුව

විධිමත්ව පත් කරනු ලැබ ඇති, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබන මණ්ඩලීය විගණන කමිටුව, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

## අරමුණ

විගණන කමිටුව යනු, මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩ ඒකාබද්ධතාව, අභ්‍යන්තර පාලන විධිවල සඵලතාව සහ විගණන ක්‍රියාවලියේ ස්වාධීනතාව සහ විෂයබද්ධතාව සහතික කරනු පිණිස නිර්මාපණය කර ඇති ආයතනික පාලනයේ අතිශය වැදගත් අංගයකි.

## කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

| නම | තනතුර | සහභාගි වූ රැස්වීම් ගණන |
|---|---|---|
| කේ. එස්. දයාරත්න මහත්මිය | කමිටුවේ සභාපති | 4/4 |
| නීල් උමගිලිය මහතා | කමිටු සාමාජික | 4/4 |
| ඊ.ඩී. ඒකනායක මහත්මිය | කමිටු සාමාජික | 4/4 |
| කේ.එස්. වැලිවිට මහතා | කමිටුවේ ලේකම් | 4/4 |

## විගණන කමිටුවේ කාර්යභාරය

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි, අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණන වාර්තා යනාදිය පිළිබඳව ක්‍රමානුකූලව සමාලෝචනය කරමින්, විගණන කමිටුව, ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්යයෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවැසි සහය සලසා දෙයි.

**කමිටුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ :**

- ක්‍රියාත්මකව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි දක්වන අනුකූලතාව සහ අදාළ නියාමන අවශ්‍යතා යනාදියෙහි ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සමාලෝචනය කිරීම;
- කළමනාකරණය විසින් සිදු කරනු ලබන අර්ථාන්විත ඇස්තමේන්තු සහ නිශ්චයමතීන් සමාලෝචනය කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

## අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කාර්යය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) වරයාගේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලබන අතර අදාළ විගණන සොයාගැනීම් විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. කමිටුව පහත දැක්වෙන කටයුතු සුපරීක්ෂණය කර සමාලෝචනයට භාජනය කරයි :

- වාර්ෂික විගණන සැලැස්ම;
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය හා බැඳි අභ්‍යන්තර විගණන සොයාගැනීම්, ඊට අදාළ නිර්දේශ සහ ඒවායේ සඵලතාවය.

## බාහිර විගණනය

විගණන කමිටුව විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තා විධිමත් පරිදි සැලකිල්ලට යොමු කොට, ඒවා සමාලෝචනයට හසු කර සාකච්ඡාවට භාජනය කරනු ලැබ තිබේ.

## අවධානය යොමු කෙරෙන ප්‍රමුඛ ක්ෂේත්‍ර

වෙන් කර නොපැවති ලැබීම්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය, තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නව ව්‍යාපෘතිවල ප්‍රගතිය, සාමාජික හිමිකම් ගෙවීමේ ක්‍රියාවලිය විෂයයෙහි අභ්‍යන්තර පාලන විධි, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ අධිකරණය හරහා දායක මුදල් හා අධිභාර එකතු කිරීම් යනාදී කටයුතු පිළිබඳව විගණන කමිටුව විසින් වර්ෂය තුළ දී සලකා බලනු ලැබ ඇත.

## වාර්තාකරණය

කමිටු සොයාගැනීම් සහ ඒවාට අදාළ නිර්දේශ, ලිඛිත හා වාචික සංක්ෂිප්ත කර දැක්වීම් සහ කමිටු රැස්වීම්වල දී කෙරෙන වාර්තා සභාගත කිරීම් මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දෙනු ලැබ ඇත.

## නිමාව

වසර තුළ දී, කමිටු රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලබන කරුණු සහ අදාළ විගණන නිරීක්ෂණ යනාදිය පිළිබඳව ගැඹුරු ලෙස සලකා බලා, ඒවා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කර, මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම් ද කමිටුව විසින් සලසා දෙනු ලැබ තිබේ. විනිවිදභාවය, වගවීම සහ අදාළ පාර්ශවකරුවන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා ස්වාධීන විගණන කමිටුවක පැවතීම මහෝපකාරී වන බැවින්, එය යහපත් ආයතනික පාලන කාර්ය පරිචයක් ලෙස සලකනු ලබන්නේ ය.

විගණන කමිටුව වෙනුවෙන්,

**අත්සන් කළේ**
කේ. එස්. දයාරත්න මහත්මිය
සභාපති
විගණන කමිටුව

# මණ්ඩලීය අවදානම් කළමනාකරණ කමිටුව

**විධායක සාරාංශය**

අවදානම, වත්මන් ව්‍යාපාරික භූ දර්ශනයේ තීරණාත්මක අංගයකි. ඉදිරි විභව අවදානම් සහ ඒවා ඵලදායී ලෙස සමනය කිරීම සඳහා වන උපාය මාර්ග පිළිබඳ පුළුල් අවබෝධයකින් කටයුතු කරනු පිණිස කළමනාකරණ අවදානම් කමිටුව විසින් සිදු කරන ලද ප්‍රධාන මුලපිරීම් දායක කාරක වී ඇත.

**අරමුණ**

ව්‍යවසාය අවදානම් කළමනාකරණය ක්‍රමානුකූල සහ විස්තීර්ණ කාර්ය රාමුවක් වන අතර එය, ඒ හා බැඳි ක්‍රියාකාරකම්වල සියලුම අංශවල අවදානම් කල්තියා කළමනාකරණය කරනු පිණිස උපකාරී වේ.

කළමනාකරණ අවදානම් කමිටුවෙහි අභිප්‍රාය වනුයේ, යම් ආයතනයක සමස්ත පරමාර්ථ සහ කාර්ය සාධනය කෙරෙහි බලපෑම් එල්ල කළ හැකි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා වන ප්‍රවේශය අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම වන්නේ ය.

**අවදානම පාලනය කිරීම**

ස්වකීය උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ තම පාර්ශවකරුවන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීම යන කාර්යයන් විෂයයෙහි මුඛ්‍ය අංගයක් ලෙස ඵලදායී අවදානම් කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඇප කැපවී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු වන අතර, ඒ සඳහා අධීක්ෂණ වගකීම් කාර්යභාරය පැවරී ඇති විගණන කමිටුව සහ කළමනාකරණ අවදානම් කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය සහාය පළ කරයි.

**ප්‍රධාන අවදානම්**

| අවදානම | සමනය කිරීමේ උපාය මාර්ග |
|---|---|
| **ණය අවදානම**<br>සේවා යෝජකයෙකුට තම සාමාජික දායකත්ව වගකීම් හා බැඳීම් ඉටු කිරීමට නොහැකි වූ විට වග බලා ගැනේ. | • නිරන්තර සමාලෝචනය.<br>• වාරික ගෙවීමේ සැලසුම්.<br>• සක්‍රීය බලාත්මක කරවීමේ ක්‍රියාකාරකම්. |
| **නීතිමය සහ නියාමන අවදානම**<br>ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීම හේතුවෙන් උද්ගත වේ. | • සියලුම ප්‍රතිපත්ති වෙනස් වීම් සහ නීති අණ පනත් හා රෙගුලාසි වෙනස් වීම් පිළිබඳව විමසිලිමත් ලෙස දැනුවත්ව සිටීම.<br>• නියාමන දැනුවත්භාවය වැඩි දියුණු කර ගැනීම. |
| **ආයෝජන අවදානම්**<br>කිසියම් ආයෝජනයක ඉදිරියේ දී විය හැකි අලාභය හෝ ඌණ කාර්ය සාධනය පිළිබඳ අවදානම හා බැඳේ. | • නිරන්තර ආයෝජන කමිටු රැස්වීම්.<br>• කොටස් කළඹවල වෙළඳපොළ ප්‍රති ඇගයීම් මැන බැලීම.<br>• ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචන සහ ඒවාට අනුකූලතාව දැක්වීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා සමාලෝචනය කරනු ලැබීම. |

| | |
|---|---|
| **පොලී අනුපාත අවදානම්**<br>මූල්‍ය මෙවලම්වල වටිනාකමට බලපෑම් ඇති කරන පොලී අනුපාතයන්හි වෙනස්වීමේ අවදානම. | • නිරන්තර ආර්ථික සමාලෝචනය.<br>• ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව තක්සේරු කිරීම්.<br>• විද්‍යාත්මක පුරෝකථන ක්‍රම යොදා ගැනීම. |
| **මානව අවදානම්**<br>ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරණ මට්ටම්වල දක්ෂ කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට නොහැකි වීමේ අවදානම. | • අනුක්‍රමික සැලසුම්.<br>• නිපුණතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන්.<br>• ශ්‍රම පිරිවැටුම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර.<br>• රේඛීය අමාත්‍යාංශය සමඟ නිරන්තර සාකච්ඡා. |
| **මෙහෙයුම් අවදානම්**<br>ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති, පුද්ගලයින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇති වන අලාභයේ අවදානම. | • ක්‍රියාවලි සම්බන්ධයෙන් අධීක්ෂණය වැඩි දියුණු කිරීම්.<br>• අභ්‍යන්තර පාලන විධි පිළිබඳ අඛණ්ඩ සමාලෝචනය<br>• අතින් වැඩ කිරීම වෙනුවට පරිගණක වැඩසටහන් භාවිතය.<br>• අභ්‍යන්තර විගණනය. |
| **තාක්ෂණයේ අවදානම**<br>තොරතුරු තාක්ෂණයේ අසමත්කම්, බිඳ වැටීම්, නතරවීම් සම්බන්ධ විභවයන්ට අවදානම අදාළ වන අතර, එය, ප්‍රකෘතිමත් වීමේ ඌණතාව පිළිබඳ පෙර දැනුවත් කිරීම් සිදු කරයි. | • උපස්ථ නිසි ලෙස නඩත්තු කිරීම.<br>• පද්ධති ආරක්ෂණය වැඩි දියුණු කිරීම්. |
| **සයිබර් ආරක්ෂණ අවදානම**<br>තොරතුරු තාක්ෂණ පද්ධතිවල අසාර්ථකත්වය හෝ සයිබර් ප්‍රහාර හේතුවෙන් සිදු වන විභව මූල්‍ය අලාභ, මෙහෙයුම්වලට බාධා සිදු වීම හා කීර්තිනාම හානි හා සම්බන්ධ අවදානම. | • අථත්‍ය පුද්ගලික ජාල සේවා (ඩචබ) භාවිතය.<br>• වැඩි දියුණු කළ පද්ධති ආරක්ෂාව.<br>• විශේෂඥයින්ගේ උපදේශනය. |

**නිමාව**

සමස්තයක් වශයෙන් ගත් කළ, කළමනාකරණ අවදානම් කමිටුව, ආයතනය තුළ අවදානම පිළිබඳව දැනුවත් සංස්කෘතියක් ඇති කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර, එමගින්, පරිපූර්ණ අවදානම් කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරමින් ආයතනයේ කීර්තිය, මූල්‍ය ස්ථාවරත්වය සහ දිගු කාලීන තිරසාරභාවය ආරක්ෂා කිරීමට අනුබල සලසා දෙයි.

**අත්සන් කළේ**
**කේ.එස්.වැලිවිට**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
අවදානම් කළමනාකරණ සම්බන්ධීකාරක

# ආයෝජන කමිටු වාර්තාව

## සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

| | |
|---|---|
| කේ. එස්. දයාරත්න මෙනවිය | අධ්‍යක්ෂක |
| කේ.වී.සී. දිල්රුක්ෂි මිය | භාණ්ඩාගාර නියෝජිත |
| ඩී.පී.ජී. ප්‍රනාන්දු මහතා | සාමාන්‍යාධිකාරී (2023.02.01 දක්වා) |
| ආර්.කේ. ජයලත් මහතා | සාමාන්‍යාධිකාරී (වැ.බ.) |
| එම්.ඒ.කේ. අළුත්ගමගේ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) |
| ජී.ඒ.එස්. සුමනසේන මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) (2023.09.22 දින සේවයෙන් ඉවත්වන ලදි) |
| කේ.එස්. වැලිවිට මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන), නිරීක්ෂක |

## රැස්වීම්

| නම | සහභාගි වූ රැස්වීම් ගණන |
|---|---|
| කේ. එස්. දයාරත්න මෙනවිය | 4/12 |
| කේ.වී.සී. දිල්රුක්ෂි මිය | 11/12 |
| ඩී.පී.ජී. ප්‍රනාන්දු මහතා | 01/12 |
| ආර්. කේ ජයලත් මහතා | 01/12 |
| එම්. ඒ. කේ. අළුත්ගමගේ මහතා | 12/12 |
| ජී.ඒ.එස්. සුමනසේන මිය | 08/12 |
| කේ.එස්. වැලිවිට මහතා | 12/12 |

ආයෝජන කමිටුව නිසි පරිදි අදාළ අභ්‍යන්තර සාමාජිකයින්ගෙන් සහ රේඛීය අමාත්‍යාංශයේ සාමාජිකයින්ගෙන් සමන්විත වේ. අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන පිළිබඳ අදහස් සහ මතය දැන ගැනීම සඳහා කමිටුව අවම වශයෙන් මසකට වරක් රැස්වේ.

ආයෝජන සම්බන්ධයෙන් මණ්ඩලයේ මූලික පරමාර්ථය වන්නේ, මූල්‍ය බැඳීම් සපුරාලීම සඳහා ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරතුර අදාළ ආයෝජිත මුල් මුදල ආරක්ෂා කර ගැනීම වන අතර අනුදත් ආයෝජනය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් උපරිම ආයෝජන ප්‍රතිලාභ ඊට ලබා දීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මණ්ඩලය පහත සඳහන් තෙවැදෑරුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමට උත්සාහ කරයි.

### (අ) සුරක්ෂිතභාවය

ආයෝජන මූල ධනයේ ආරක්ෂාව සලසා ගැනීම මණ්ඩලයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ ය. මෙම මූල ධනයේ ආරක්ෂාව තහවුරු කිරීම අරබයා කටයුතු කිරීම පිණිස මණ්ඩලය ස්වකීය ආයෝජන සමුච්චයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අතිශය සුරක්ෂිත රජයේ ස්වෛරී සුරැකුම්පත්වල ආයෝජනය කරයි.

### (ආ) ද්‍රවශීලතාව

යුක්ති සහගත ලෙස ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීම මණ්ඩලයට පහසු කරනු පිණිස මණ්ඩලයේ ආයෝජන කාර්යභාරය මුදල් කළ හැකි ද්‍රවශීලතා මට්ටමකින් පැවතිය යුතු වන්නේ ය.

### (ඇ) ආයෝජන මත ප්‍රතිලාභ

ලබාගත හැකි ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන සමුච්චය සැලසුම් කළ යුතු වන්නේ ගිණුම් අවරෝධ හා මුදල් ප්‍රවාහ අවශ්‍යතා සැලකිල්ලට ගෙනය.

# කළමනාකරණ කමිටු වාර්තාව

## සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

## සභාපති, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරරීත්වය

අරමුදලට අයත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකිම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරන්නාහ. මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දීමේ කාර්යයෙහි සභාපති වරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම නියැලෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහි ද නිරතව සිටිති.

එබැවින්, මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි මුඛ්‍යාංගයක් ලෙස කළමනාකරණ කමිටුව ක්‍රියා කරයි. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ:

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වල දී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තිරණ.
- ඉලක්ක දිශාභිමුඛ කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහිතව විධිමත් පිළිවෙත්වලින් බැහැරව කටයුතු කිරීමේ යුක්ති සහගත භාවය හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා අතිශය තීක්ෂණ අයුරින් ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදී ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි සිදු වන බවට වගබලා ගැනීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණමය උත්ශ්‍රේණිගත කිරීම් සලසා ගැනීම.
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය / අතෘප්තිමත් භාවය පිළිබඳ පසු විපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම / නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ප්‍රතිශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.

# අවදානම් කළමනාකරණය




## පසුබිම

මනා අයුරින් පාලනය වන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සිය කාර්ය නිරාවරණය තුළ යම් අධිකාරිත්වයක් දරමින් අවදානමට මුහුණ දෙන්නේ ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ය. එමෙන්ම, ව්‍යාපාරික අරමුණු යන නිර්වචනයෙන් ආරම්භ වන අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස අවදානම් පාලනය සැලකිල්ලට භාජනය කරයි. ඉන් අනතුරුව විමසා බැලෙනුයේ, උපකල්පනය කළ හැකි, කළ යුතු හෝ නොකළ යුතු ව්‍යාපාරික නිරාවරණයන් පිළිබඳ ප්‍රතිපත්ති පිළිපැදීම, අවදානම් සාධක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම මෙන්ම ස්වකීය ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණය සඳහා වන ක්‍රම සහ විධි සූක්ෂම අයුරින් යොදා ගැනීම යන කරුණු කාරණායි.

සෑම සංවිධානයක්ම එහි සාර්ථකත්වයට තර්ජනයක් වන අවදානම් වලට මුහුණ දෙයි. කම්පන හෝ ස්වභාවික සිදුවීම්, වසංගත අර්බුද හා පාරිසරික / සමාජීය / පාලනමය ගැටලු ජාතික මෙන්ම ගෝලීය ආර්ථිකයට පවා අහිතකර ලෙස බලපෑම් එල්ල කළ හැකි සංසිද්ධීන් ය. තාක්ෂණය අපේ ජීවිතයේ අනිවාර්ය අංගයක් වී ඇති නමුත් නව තාක්ෂණයේ දියුණුව, ආර්ථික වර්ධනය උපදවන ඵලදායිතා මට්ටම් ඉහළට ඔසවා තැබීම දුර්මුඛ කර තිබේ.

කෙසේ වෙතත්, ෆින්ටෙක් (Fintech) හා රෙග්ටෙක් (Regtech), ක්‍රිප්ටොඇසෙස්ට්ස් (Cryptoassets), මූල්‍ය අපරාධ, සයිබර් සෙකියුරිටි (Cyber Security) සහ ඩේටා සෙකියුරිටි (Data Security) යනාදී අනර්ථකාරී නවෝත්පාදනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විෂයයෙහි උද්ගතව ඇති හිතකර නොවන සලකා බැලීම් වන්නේ ය.

## ඵලදායී ප්‍රතිපත්ති කරා දිවෙන මාවත

පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන කෙටි යෙදුම වඩා ඉහළ පිළිගැනීමක් සහිත පාඨයක් වන අතර එකී අංගයන්, වත්මන් ව්‍යවසායන් තම ව්‍යාපාර කාර්යයන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරන නව ආකාරයේ පිළිබිඹුවක් බවට පත් කර ගෙන ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ද පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන පාඨය හැකි උපරිම ආකාරයෙන් තම ව්‍යවසාය වර්ධනය පිණිස ඉවහල් කර ගත හැකි මහාර්ඝ ආදර්ශයකි.

## අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණය පිළිබඳ කාර්යභාරයේ බලය අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරයි.

සියලු වර්ගවල අවදානම් හඳුනා ගැනීම, මානනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම යන කටයුතු ස්වාධීනව සමාලෝචනයට හසු කිරීම අරබයා අවදානම් කළමනාකරණ කමිටුව වගකීම උසුලයි. තව ද, අවදානම් කළමනාකරණ කමිටුව, ආයතනයේ ව්‍යාපාරික උපාය මාර්ගවලට අනුකූලව අනුමත කරනු ලැබීම සඳහා විචක්ෂණශීලී අවදානමක් සහිත මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි. අවදානම අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවදානම් විශ්ලේෂණය කිරීම, මානනය කිරීම සහ කළමනාකරණය කිරීම යන අවස්ථාවල දී වැදගත් කාර්යභාරයක් ඉටු කරන ආරක්ෂක මාදිලියේ තෙවැදෑරුම් රේඛා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලැබ ඇත.


පාලනය
අභ්‍යන්තර ප්‍රතිපත්ති
මෙහෙයුම් කළමනාකරණය සහ සහාය තුලින්
ශක්තිමත් ආචාර ධර්ම කාර්යක්ෂමතාව
උපාය මාර්ග
ක්‍රියාවලිය
මහජනතාව
තාක්ෂණය
අවදානම් නැඹුරුව
බාහිර රෙගුලාසි
අවදානම් කළමනාකරනය
අනුකූලවීම

# අවදානම් සැසඳුම


අනෙකුත් සියලු අංශ
සේ.නි.භා.අ.
ගෝලීය අවදානම් වර්ණාවලිය
උපාය මාර්ගික සහ මෙහෙයුම්
ණය, ද්‍රවශීලිතාවය, වෙළඳපොළ ආයෝජනය

| අභ්‍යන්තර අවාදනම් ධාවක | අවදානම් සාධක | අවම කිරීමේ උපාය මාර්ගය |
|---|---|---|
| **උපායමාර්ගික අවදානම** | ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් හා අහිතකර ව්‍යාපාරික තීරණ නිසාත්, තීරණ නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ඌනතාවය හේතුවෙන් පැන නගින ඉපැයීම්වලට සහ ප්‍රාග්ධනය වෙත එල්ල වන වත්මන් හෝ අනාගත අවදානම. | අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීමෙන් ද, මුළු මහත් ආයතනය සඳහා ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම කල්තියා සකස් කර ගැනීමෙන් ද, විචලනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමෙන් ද අභ්‍යන්තර හා බාහිර උපායමාර්ගික අවදානම අවම කර ගැනේ. |
| **මෙහෙයුම් අවදානම** | ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලින් හේතුවෙන් ද, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ද ඇති වන අලාභයේ අවදානම. | පාලන විධි, රක්ෂණය හා පද්ධති විගණනය යොදා ගැනීමෙන් සහ නිතිපතා තොරතුරු තාක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් ද, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් හා ආපදා ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි, තොරතුරු සහ සයිබර් ආරක්ෂාව මෙන්ම භෞතික ආරක්ෂාව සම්බන්ධ අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණුව යනාදිය මගින් ද මෙහෙයුම් අවදානම අවම කර ගැනේ. |
| **ණය අවදානම** | තම වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රති පාර්ශවය හෝ නිකුත් කරන්නා විසින් ගනු ලබන පියවර හේතුවන් සිදු වන අලාභයේ අවදානම. | හිමිසුම් අත්සන් කිරීම, ණය සීමා පවත්වා ගැනීම හා ඒවා අධීක්ෂණය මගින් ද, ඇපකර ලබා ගැනීම මගින් ද ණය අවදානම අවම කර ඇත. |
| **වෙළඳපළ අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ, දේශීය මූල්‍ය වෙළඳපොළේ මුදල් ආයෝජනය කිරීමෙන් ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීම වන අතර එහි ස්වභාවය මිල අවිනිශ්චිතතාවය මත පදනම් වේ. මූල්‍ය සාධන පත්වල අගයයෙහි සිදු වන වෙනස්වීම් හේතුවෙන් අලාභ උද්ගත වනු ඇත. | අති සුවිශේෂී ආයෝජන පවත්වා ගෙන යාමේ විධි හා මෙවලම් යෙදීම හරහා අස්ථායී අවදානම් වෙළඳපළ තුළ ද්‍රවශීලතා අවදානම් පොලී අනුපාත අවදානම සහ කොටස් මිල අවදානම සලකා බැලීම මගින් වෙළඳපළ අවදානම අවම කර ඇත. |
| **ආයෝජන අවදානම** | ආයෝජනය යනු වර්තමාන සම්පත් භාවිතය අත්හැරීමේ තීරණයයි. ඒ වෙනුවට, ඒවායේ වත්මන් අගයන්හි ආයෝජන අවදානමට වඩා වැඩි අනාගත ප්‍රතිලාභ ලැබීමට ඒවා භාවිතා කළ හැකිවේය යන විශ්වාසය තුළ මෙම අනාගත ප්‍රතිලාභ ක්‍රියාත්මක නොවීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවීම අවදානමක් වේ. | පාරිසරික, සමාජීය හා පාලනමය සාධක හරහා වගකිව යුතු ආයෝජන පිළිබඳ සංකල්පය සලකා බැලීමෙන් ආයෝජන ප්‍රතිපත්තියට අනුගත වීම ඔස්සේ ආයෝජන අවදානම් අවම කර ගැනීම සිදු කර ඇත. |
| **ද්‍රවශීලතා අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ද්‍රවශීලතාවය රඳා පවතින්නේ, වෙනත් දේ අතර, සාමාජික හිමිකම් ගෙවීම සඳහා එහි ක්ෂණික මුදල් අවශ්‍යතාවය, දැනට එහි ඇති මුදල් ප්‍රමාණය සහ එහි ආයෝජන වත්කම් කෙතරම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ද යන කරුණු මත ය. | කල්පිරීමේ හිනිපෙත ඉදිකිරීම, සත්‍ය සහ හිමිසුම්ගත මුදල් ලැබීම් විශ්ලේෂණය කිරීම, 'රිපෝ' වැනි ප්‍රති මිලදී ගැනුම් ද්‍රව වත්කම්වල ආයෝජනය, විවිධාංගීකරණය වූ අලෙවි කළ හැකි කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය යනාදිය මගින් ද්‍රවශීලතා අවදානම අවම කර ඇත. |

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම හඳුනාගෙන විවිධ හේතූන් යටතේ වර්ගීකරණය කර ඇත: ක්‍රියාවලි, පුද්ගලයින්, පද්ධති සහ බාහිර සිදුවීම් නිසා සේ. නි. භාර අරමුදල් මණ්ඩලය මුහුණ දෙන විවිධ මෙහෙයුම් අවදානම් තක්සේරු කර, පසුව මෙහෙයුම් අවදානමේ ප්‍රතිවිපාක අවදානම අවම කිරීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙල තීරණය කිරීම සඳහා අවදානම් ශ්‍රේණිගත කර, අවදානම් ලේඛනයක් ඉදිකර ඇත.

| | කොට්ඨාසය / අංශය / කමිටුව | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 1 | සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | තොරතුරු තාක්ෂණ පද්ධති පාලන විධි මගින් රාජකාරි වෙන්කර නියම කිරීම |
| 2 | යාවත්කාලීන කිරීම | සචලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොග යේ මුරපද හා එහි විකල්ප අයථා පරිහරණය - වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. තොරතුරු තාක්ෂණ දත්ත ගබඩාව නඩත්තු කිරීම<br>ii. වඩාත් සංකීර්ණ මුරපද |
| 3 | මුරපද පාලනය | මෙහෙයුම් අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. විස්තීරණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම<br>ii. තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය කිරීම |
| 4 | තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | i. සාමාජික ප්‍රධාන ගොනු දත්ත වෙනස් කිරීම් සඳහා සීමිතව අවසර දීම සහ අධිගාමී පහසුකම ලබා දීම |
| 5 | සාමාජික ප්‍රධාන ගොනු දත්තවලට සිදු වන වෙනස්කම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | සචලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි ඇති සාමාජික ජාතික හැඳුනුම්පත් / ගමන් බලපත්‍ර අංක බැංකු පත්‍රිකා ගෙවුම් පද්ධතියට ඒකාබද්ධ කිරීම |
| 6 | හිමිකම් ඉල්ලුම් ක්‍රියාවලිය - වැඩ පත් සකස් කිරීම | වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | වැඩ පත්වලට දත්ත අටහන් පිවිසුම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |
| 7 | වෙන් නොකළ ලැබීම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | වෙන් නොකළ ලැබීම් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මධ්‍යම | ඉහළ | අඩු | මධ්‍යම | ඉහළ | |
| 8 | සාමාජිකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | i. සංක්‍රමණික ගිණුම් අවහිර කිරීම<br>ii. 2015 වර්ෂයට පෙර ගිණුම් අවහිර කිරීම<br>iii. 2015 වර්ෂයේ සිට ගිණුම් යාවත්කාලීන කර කමිටුව වෙත ප්‍රගතිය ඉදිරිපත් කිරීම |
| 9 | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොගය පවත්වා ගෙන යාම | වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | උපස්ථ දත්ත වසර 3 ක් දක්වා දීර්ඝ කිරීම |
| 10 | ඉකුත් ජාතික හැඳුනුම්පත මකා දැමීමේ දී නව ජාතික හැඳුනුම්පත ඇතුළත් කිරීම | i. වංචා කිරීමේ අවදානම<br>ii. ද්විත්ව ගෙවීම් අවදානම<br>iii. දත්ත අහිමි වීම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | බලාත් ප්‍රවේශය හඳුනා ගැනීම |
| 11 | නවම් මාවත රථ ගාලෙහි ආදායම | i. ආදායම අහිමි වීම<br>ii. ණය අවදානම / පැහැර හැරීමේ අවදානම<br>iii. වංචා කිරීමේ අවදානම<br>iv. වන්දි ගෙවීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | i.ii.iii. නිසි අධීක්ෂණය සහ ණය කළමනාකරණය<br>iv. වලංගු සහ බැඳී පවත්නා ද්විපාර්ශ්වික ගිවිසුම් |
| 12 | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය - බලාත්මක කිරීමේ ලිපිගොනු | i. අනුකූලතා අවදානම<br>ii. වංචා කිරීමේ අවදානම<br>iii. නීති අවදානම<br>iv. ආදායම අහිමි වීම | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා | | | × | × | | | i. නිසි අධීක්ෂණය සහ එය ක්‍රමිකව ඉහළ නැංවීමේ ක්‍රියාවලිය |
| 13 | වට්ටෝරු බඩු තොග කළමනාකරණය කිරීම | i. වත්කම් අයථා පරිහරණය<br>ii. වත්කම් අහිමි වීම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් | | | × | × | | | i. සමීක්ෂණ මණ්ඩලය<br>ii. ප්‍රධාන වට්ටෝරු බඩු තොගය |
| 14 | ගෙවා ඇති නමුත් නොගෙවූ ලෙස සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි පෙන්වන සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා<br>සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | i. සියලු අනුපත් ගිණුම් හඳුනා ගෙන අවහිර කිරීම |

| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 15 | ව්‍යාජ සේවා යෝජක ගිණුම් | වංචා කිරීමේ අවදානම | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා/ සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | ස්ථිර සේවා යෝජක ගිණුම් |
| 16 | ස්වයං -සාමාජික හිමිකම් - සංක්‍රමණික සේවකයින් (අතින් ලියූ හිමිකම්) | ද්විත්ව ගෙවීම් / වංචනික ගෙවීම් | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | × | | × | | | සචලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතිය හරහා හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය |
| 17 | මෝටර් වාහන රක්ෂණ | වාහන අනතුරු / සොරකම් කිරීම් / අලාභ | සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | පවතින වෙළඳපළ වටිනාකමට රක්ෂණය කිරීම |
| 18 | ස. අතින් ලියූ ස්වයං ප්‍රතිලාභ හිමිකම් ගෙවීම්<br>සස. 2017 ට පෙර අතින් ගෙවන ලද ස්වයං සාමාජික හිමිකම් | ද්විත්ව ගෙවීම් / වංචනික ගෙවීම් | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | සචලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතිය හරහා හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය |



කොට්ඨාසය / අංශය / කමිටුව | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | 2023

| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 19 | පරිශ්‍රය කුලියට දීම / බදු දීම සඳහා ගිවිසුම් වලට එළඹීම | මෙහෙයුම් අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති / සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | වලංගු සහ බැඳී පවත්නා ගිවිසුම්වලට එළඹීම |
| 20 | ස්ථාවර වත්කම් කළමනාකරණය | වත්කම් අස්ථාන ගතවීම් / අලාභ | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් | | × | | × | | | නිවැරදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල. තොරතුරු තාක්ෂණ අංශයේ පවත්නා තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛනය. කාලානුරූපීව ව්‍යාපහරණය කිරීම. |
| 21 | ප්‍රාදේශීය කාර්යාලවල චෙක්පත්/ මුදල් තැන්පතු | සොරකම් කිරීම් / අලාභ / ප්‍රමාද | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / | | × | | | × | | නිසි අධීක්ෂණය සහ වාර්තා පවත්වා ගෙන යෑම |

## නිමාව

ස්වකීය ආයතනය වර්තමානයේ දී නිරාවරණය වීමට ඉඩකඩක් ඇති විභවයක් සහිත පුළුල් පරාසයක් තුළ පවතින අවදානම් සහ එක් එක් ආකාරයේ නිහඬ ගාමක බලවේග පිළිබඳ අවබෝධයක් ලබා ගත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එය මුහුණ දෙන සැබෑ අවදානම් කළමනාකරණය කළ හැකි විවිධ ක්‍රම පිළිබඳව අවධානය යොමු කළේ ය. එක් එක් ආකාර අවදානම් වර්ගවල අවදානම් ලේඛනයක් සම්පාදනය කර භාවිතා කරන ලද අතර එමගින්, අදාළ අවදානම් සහ ඒ ආශ්‍රිත සමනමය ක්‍රියා සහ පාලන විධි පිළිබඳව අවබෝධ කර ගැනීමටත්, ඒවා පිළිග උනුමට හා අධීක්ෂණයට ලක් කිරීමටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකිවී තිබේ.


A
B
C
D
E




# මූල්‍ය තොරතුරු



## ලාභ හෝ අලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මුළු ආදායම** | | | | | |
| පොළී ආදායම | 4 | 64,834,198 | 46,442,799 | 64,380,505 | 46,316,209 |
| ශුද්ධ වෙළඳ කටයුතු ආදායම | 5 | 2,148,913 | 1,296,862 | - | - |
| ලාභාංශ ආදායම | 6 | 1,209,331 | 736,919 | 1,209,331 | 736,919 |
| ලාභ/ අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/(අලාභ) | 7 | 1,528,360 | (1,375,782) | 1,528,360 | (1,375,782) |
| වෙනත් ආදායම් | 8 | 756,921 | 473,899 | 674,482 | 444,592 |
| | | **70,477,723** | **47,574,697** | **67,792,678** | **46,121,938** |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 9 | 1,939,661 | 1,690,272 | 1,324,106 | 1,392,354 |
| පරිපාලන වියදම් | 10 | 389,856 | 346,572 | 312,763 | 252,293 |
| මූල්‍ය වියදම් | 11 | 4,385 | 4,314 | 4,013 | 3,697 |
| සාමාජික වියදම් | 12 | 711,058 | 577,743 | 704,507 | 574,568 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් | 13 | 61,812 | 56,103 | 40,554 | 36,063 |
| ප්‍රවර්තන වර්ෂයේ සාමාජිකයන් වෙත ගෙවන ලද පොළී | | 499,157 | 358,411 | 499,157 | 358,411 |
| කොටස් හිමිකම් ආයෝජනයන්හි වත්කම් හානිකරණය | 14 | (51,452) | 76,820 | (51,452) | 76,820 |
| වෙනත් වියදම් | 15 | 208,011 | 121,030 | - | - |
| | | **3,762,488** | **3,231,266** | **2,833,648** | **2,694,206** |
| **බදු වලට පෙර ලාභය** | | **66,715,235** | **44,343,431** | **64,959,030** | **43,427,732** |
| අදායම් බදු වියදම | 16 | (9,582,180) | (6,663,194) | (9,016,645) | (6,449,427) |
| **බදු වලට පසු ලාභය** | | **57,133,055** | **37,680,237** | **55,942,384** | **36,978,305** |
| **ලාභය ආරෝපනයඃ** | | | | | |
| සමාගම් කොටස් හිමියන් | | 57,013,988 | 37,610,044 | 55,942,384 | 36,978,305 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන් | | 119,067 | 70,193 | - | - |
| **වර්ෂය සඳහා ලාභය** | | **57,133,055** | **37,680,237** | **55,942,384** | **36,978,305** |

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතිය** | | | | | |
| වෙනත් විස්තීර්ණ සංචිත (කොටස්) තුළින් සාධාරණ අගයට මාරු කිරීම | | 3,070,788 | (2,151,584) | 3,070,788 | (2,151,584) |
| වෙනත් විස්තීර්ණ සංචිත (ඒකක) තුළින් සාධාරණ අගයට මාරු කිරීම | | 29,982 | (39,196) | 29,982 | (39,196) |
| | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයු ගණක ලාභය/(අලාභය) | | (63,865) | 55,129 | (63,865) | 55,129 |
| **වර්ෂය සඳහාවූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ අදායම** | | **3,036,905** | **(2,135,651)** | **3,036,905** | **(2,135,651)** |
| **වර්ෂය සඳහාවූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම** | | **60,169,960** | **35,544,586** | **58,979,289** | **34,842,654** |
| | | | | | |
| **විභජනය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| සමාගමේ කොටස් හිමිකම් හිමියන් | | 60,050,893 | 35,474,393 | 58,979,289 | 34,842,654 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතින් | | 119,067 | 70,193 | - | - |
| **බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම** | | **60,169,960** | **35,544,586** | **58,979,289** | **34,842,654** |
| | | | | | |
| ඉ/ගෙ රඳවාගත් ලාභය | | 5,928,466 | 5,230,602 | 4,812,440 | 4,732,140 |
| වත්කම් මත ශුද්ධ ලාභය/ (අලාභය) | | 321,350 | 83,102 | 321,350 | 83,102 |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | | (10,314,164) | - | (10,314,164) | - |
| **විසර්ජනය සඳහා වූ ලාභය** | | 57,133,055 | 37,680,237 | 55,942,384 | 36,978,305 |
| **විසර්ජනය සඳහා වූ මුළු ලාභය** | | **53,068,708** | **42,993,941** | **50,762,011** | **41,793,547** |
| අඩුකළා: යෝජිත විසර්ජනය - ලාභාංශ 7% (2022 - 5.75%) | | (32,102,819) | (24,301,886) | (32,102,819) | (24,301,886) |
| පොළී ආදායම - 3.0% | | (13,758,500) | (12,679,221) | (13,758,500) | (12,679,221) |
| අඩුකළා: ලාභාංශ - ලංකා ලුණු සමාගම | | (315,000) | (14,175) | - | - |
| අඩුකළා: පාලන නොවන අයිතිය | | (119,067) | (70,193) | - | - |
| **විසර්ජනයෙන් පසු ලාභය** | | **6,773,322** | **5,928,466** | **4,900,692** | **4,812,440** |

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 1,226,541 | 760,157 | 898,585 | 584,266 |
| ලාභ හා අලාභ ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම් | 17 | 4,463,977 | 2,887,168 | 4,463,977 | 2,887,168 |
| පරිපාලන සමාගමෙහි ආයෝජන | 18 | - | - | 470,961 | 470,961 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම් | 19 | 10,764,966 | 8,646,578 | 10,764,966 | 8,646,578 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් | 20 | 501,639,231 | 445,527,175 | 499,504,778 | 444,308,492 |
| අනෙකුත් වත්කම් | 21 | 4,210,470 | 3,851,196 | 3,503,613 | 3,206,136 |
| දේපළ, පිරියත සහ උපකරණ | 22 | 988,715 | 973,832 | 310,604 | 297,256 |
| කල්බදු දේපළ | 23 | 697 | 1,394 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 24 | 6,163 | 9,017 | 6,163 | 9,017 |
| ආයෝජන දේපල | 25 | 4,587,406 | 4,587,406 | 4,587,406 | 4,587,406 |
| **මුළු වත්කම්** | | **527,888,166** | **467,243,924** | **524,511,053** | **464,997,280** |
| | | | | | |
| **බැරකම්** | | | | | |
| පොළී දරණ ණය සහ ණය ගැනුම් | 26 | 7,620 | 11,049 | - | - |
| ප්‍රදාන හා සහනාධාර | 27 | 38,399 | 36,134 | 8,490 | 4,512 |
| නිශ්චිත ප්‍රතිලාභ බැරකම | 28 | 593,245 | 466,499 | 303,379 | 215,479 |
| ප්‍රවර්තන බදු බැරකම | 29 | 5,144,686 | 3,828,019 | 4,864,069 | 3,701,367 |
| අනෙකුත් බැරකම් | 30 | 680,320 | 550,467 | 115,112 | 107,206 |
| විලම්බිත බදු වගකීම් | 31 | 70,865 | 90,684 | - | - |
| ප්‍රතිපාදන | 32 | 415,163 | 407,301 | 415,163 | 407,301 |
| **මුළු බැරකම්** | | **6,950,298** | **5,390,152** | **5,706,213** | **4,435,866** |
| | | | | | |
| **කොටස් හිමිකම්** | | **520,937,868** | **461,853,772** | **518,804,839** | **460,561,415** |
| | | | | | |
| සාමාජික අරමුදල | 33 | 504,434,709 | 459,630,606 | 504,434,709 | 459,630,606 |
| සංචිත | | 16,242,759 | 2,046,835 | 14,370,130 | 930,809 |
| පාලන නොවන අයිතිය | | 260,399 | 176,332 | - | - |
| **සාමාජිකයින්ට අයත්වන ශුද්ධ වත්කම්/ පාලනය නොවන අයිතිය** | | **520,937,868** | **461,853,772** | **518,804,839** | **460,561,415** |

පිටු අංක 102 සිට 138 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.
නිවැරදි බවට සහතික කළේ:

..............................
එම් ඩී වී කුමුදිනී
මූල්‍ය කළමනාකරු

..............................
කේ වී ඩී පී කරුණාරත්න
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

..............................
එම් ඩී කේ අළුත්ගමගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වැ.බ.

..............................
ආර් කේ ජයලත්
සාමාන්‍යාධිකාරී (වැ.බ.)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදී.

..............................
ඩී එල් පී රෝහණ අභයරත්න
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

## කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 දිනට

| සමූහය | මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | රඳවාගත් ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය | වෙනත් සංචිත | ලාභාංශ සමකාර සංචිත අරමුදල | පශ්චාත් අත්කර ගැනීමේ සංචිත | පාලනය නොවන පොලිය | එකතුව |
| **2022.01.01 දිනට ශේෂය** | **4,732,140** | **(1,818,142)** | **(69,838)** | **142,000** | **498,462** | **107,714** | **3,592,336** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | (2,190,780) | - | - | - | - | (2,190,780) |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (12,679,221) | - | - | - | - | - | (12,679,221) |
| ලාභාංශ 5.75% | (24,301,886) | - | - | - | - | - | (24,301,886) |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 36,978,305 | - | - | - | - | 70,193 | 37,048,498 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 83,102 | - | - | - | - | - | 83,102 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | 55,129 | - | - | - | 55,129 |
| පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | (1,575) | (1,575) |
| උපයෝගී කොටස් හිමිකම් සංචලනය | - | - | - | - | 617,564 | - | 617,564 |
| **2022.12.31 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **1,116,026** | **176,332** | **2,223,167** |
| | | | | | | | |
| **2023.01.01 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **1,116,026** | **176,332** | **2,223,167** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,100,770 | - | - | - | - | 3,100,770 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (13,758,500) | - | - | - | - | - | (13,758,500) |
| ලාභාංශ 7% | (32,102,819) | - | - | - | - | - | (32,102,819) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (10,314,164) | | | 10,314,164 | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 55,942,384 | - | - | - | - | 119,067 | 56,061,451 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 321,350 | - | - | - | - | - | 321,350 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (63,865) | - | - | - | (63,865) |
| පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | (35,000) | (35,000) |
| උපයෝගී කොටස් හිමිකම් සංචලනය | - | - | - | - | 756,604 | - | 756,604 |
| **2023.12.31 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **1,872,630** | **260,399** | **16,503,158** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
# කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් මස 31 දිනට

| මණ්ඩලය | මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | රඳවාගත් ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය | වෙනත් සංචිත | ලාභාංශ සමකාර සංචිත අරමුදල | |
| **2022.01.01 දිනට ශේෂය** | **4,732,140** | **(1,818,142)** | **(69,838)** | **142,000** | **2,986,160** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මිහිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | (2,190,780) | - | - | (2,190,780) |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (12,679,221) | - | - | - | (12,679,221) |
| ලාභාංශ 5.75% | (24,301,886) | - | - | - | (24,301,886) |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය - අවදානමේ වටිනාකම | 36,978,305 | - | - | - | 36,978,305 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 83,102 | - | - | - | 83,102 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | 55,129 | - | 55,129 |
| **2022.12.31 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **930,809** |
| | | | | | |
| **2023.01.01 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **930,809** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මිහිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,100,770 | - | - | 3,100,770 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (13,758,500) | - | - | - | (13,758,500) |
| ලාභාංශ 7% | (32,102,819) | - | - | - | (32,102,819) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (10,314,164) | | | 10,314,164 | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 55,942,384 | - | - | - | 55,942,384 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 321,350 | - | - | - | 321,350 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (63,865) | - | (63,865) |
| **2023.12.31 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **14,370,130** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | |
| FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක අලෙවියෙන් ලත් මුදල | 1,977,534 | 247,354 | 1,977,534 | 247,354 |
| කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරකවල කල් පිරීම් | 47,760,983 | 52,955,675 | 47,760,983 | 52,955,675 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරකවල කල් පිරීම් | 135,921 | 155,571 | 135,921 | 155,571 |
| තඩඔජඩ ලෙස නියම කළ මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම | (631,015) | (999,321) | (631,015) | (999,321) |
| කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම | (99,406,414) | (103,095,316) | (99,406,414) | (103,095,316) |
| අත්පත්කරගැනීම් සඳහා ලබාදුන් ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරක | (31,202) | (140,816) | (31,202) | (140,816) |
| පාරිභෝගිකයින්ගෙන් ලත් මුදල් | 4,668 | 2,942 | - | - |
| සැපයුම්කරුවන්ට ගෙවූ මුදල් | (3,148) | (2,176) | - | - |
| ලැබූ පොළිය | 66,446,928 | 47,878,326 | 66,446,928 | 47,878,326 |
| ලැබූ ලාභාංශ | 1,111,591 | 820,045 | 1,111,591 | 820,045 |
| ලැබූ වෙනත් ආදායම් | 639,060 | 415,942 | 639,060 | 415,942 |
| ගෙවූ මෙහෙයුම් වියදම් | (7,596,563) | (4,581,404) | (7,596,563) | (4,581,404) |
| ගෙවූ සාමාජික වියදම් | (358,684) | (291,969) | (358,684) | (291,969) |
| ගෙවන ලද ආදායම් බදු | (7,647,524) | (2,241,332) | (7,647,524) | (2,241,332) |
| ගෙවූ පොළිය | (499,157) | (358,412) | (499,157) | (358,411) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | (28) | (41) | (24) | (37) |
| ප්‍රාදේශීය ලේකම් කාර්‍යාල වෙත ගෙවූ බිම් කුලිය | (8) | (13) | - | - |
| 5 වසර ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම් | (192,949) | (31,966) | (192,949) | (31,966) |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම් | (73,776) | (76,044) | (73,776) | (76,044) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,636,217** | **(9,342,955)** | **1,634,709** | **(9,343,703)** |
| | | | | |
| **ආයෝජන කටයුතු** | | | | |
| දේපළ සහ උපකරණ මිලදී ගැනීම | (44,619) | (135) | (44,495) | (87) |
| දේපළ සහ උපකරණ අලෙවියෙන් උත්පාදිතයන් | 8,088 | 244 | 8,088 | 242 |
| අයෝජන අත්පත්කර ගැනීම් | (894) | (648) | - | - |
| ලැබූ පොළිය | 429 | 116 | - | - |
| කාර්ය මණ්ඩල ණය නැවත ගෙවීම/ ශුද්ධ ප්‍රදාන | (21) | (51) | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(37,017)** | **(474)** | **(36,407)** | **155** |
| | | | | |
| **මූල්‍ය කටයුතු** | | | | |
| ලැබුණු දායකත්වය | 37,004,419 | 34,372,190 | 37,004,419 | 34,372,190 |
| නැවත මුදල් ලබාදීම් | (38,286,021) | (25,019,500) | (38,286,021) | (25,019,500) |
| ගෙවූ මූල්‍ය වියදම් | (2,381) | (3,635) | (2,381) | (3,635) |
| ගෙවූ ලාභාංශ | (742) | (52) | - | - |
| මූල්‍ය කල්බදු බැරකම් යටතේ මූලික ගෙවීම | - | (2) | - | - |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,284,724)** | **9,349,002** | **(1,283,982)** | **9,349,055** |
| | | | | |
| **මුදල් සහ මුදලට සමාන දේවල් ශුද්ධ වැඩි වීම** | 314,475 | 5,573 | 314,319 | 5,508 |
| ජනවාරි 01 වනදා වන විට මුදල් හා මුදල් සමාන දෑ | 584,431 | 578,857 | 584,266 | 578,758 |
| **දෙසැම්බර් 31 වන දා වන විට මුදල් හා මුදල් සමාන දෑ** | **898,905** | **584,431** | **898,585** | **584,266** |

## 2023/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2023 | - | - | - | - |
| 2024 | - | - | - | - |
| 2025 | - | - | - | - |
| 2026 | 3,553,926 | 3,269,928 | 3,560,515 | 3,468,337 |
| 2027 | 34,084,172 | 31,454,559 | 33,975,152 | 32,999,476 |
| 2028 | 50,262,069 | 44,680,558 | 47,669,876 | 46,585,619 |
| 2029 | 30,622,954 | 28,248,749 | 29,271,747 | 28,868,631 |
| 2030 | 32,959,975 | 30,330,021 | 30,616,329 | 30,653,402 |
| 2031 | 31,845,954 | 29,342,275 | 31,642,323 | 30,560,130 |
| 2032 | 30,622,954 | 28,248,749 | 29,905,673 | 29,406,936 |
| 2033 | 60,859,072 | 57,337,854 | 58,584,398 | 60,144,487 |
| 2034 | 33,447,954 | 31,065,196 | 32,323,401 | 31,975,863 |
| 2035 | 32,049,144 | 29,771,347 | 30,829,231 | 30,315,848 |
| 2036 | 30,622,954 | 28,248,749 | 29,110,762 | 28,447,053 |
| 2037 | 30,622,954 | 28,248,749 | 30,901,439 | 29,354,847 |
| 2038 | 30,622,954 | 28,248,749 | 30,237,932 | 29,351,299 |
| 2039 | 7,600,000 | 7,676,208 | 6,692,286 | 7,975,805 |
| **එකතුව** | **439,777,037** | **406,171,692** | **425,321,064** | **420,107,732** |

## 2023/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2023 | 34,040,648 | 37,457,608 | 31,769,017 | 35,471,396 |
| 2024 | 21,001,181 | 20,832,265 | 16,404,389 | 21,494,867 |
| 2025 | 52,195,884 | 49,142,455 | 40,133,810 | 51,043,772 |
| 2026 | 40,215,741 | 37,902,717 | 27,696,424 | 39,755,815 |
| 2027 | 37,099,783 | 37,599,688 | 23,006,589 | 38,161,667 |
| 2028 | 70,020,619 | 66,849,538 | 46,668,033 | 70,199,856 |
| 2029 | 13,964,368 | 12,888,801 | 10,629,317 | 13,617,796 |
| 2030 | 10,177,461 | 10,764,475 | 5,545,790 | 10,812,077 |
| 2031 | 49,655,898 | 48,648,974 | 28,030,281 | 49,722,282 |
| 2032 | 45,540,515 | 31,479,362 | 32,458,369 | 35,206,107 |
| 2033 | 30,236,118 | 29,089,105 | 16,235,646 | 30,698,625 |
| 2034 | 2,825,000 | 2,816,447 | 1,373,196 | 2,902,915 |
| 2035 | 1,426,190 | 1,522,598 | 778,253 | 1,562,245 |
| 2036 | - | - | - | - |
| 2037 | - | - | - | - |
| 2038 | - | - | - | - |
| 2039 | 7,600,000 | 7,676,208 | 3,729,996 | 7,977,305 |
| **එකතුව** | **415,999,406** | **394,670,241** | **284,459,110** | **408,626,726** |

# භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල අගය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2023/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2023 | - | - | - | - |
| 2024 | 63,292,846 | 55,941,271 | 59,864,320 | 59,813,248 |

### 2022/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2023 | 23,300,000 | 21,547,877 | 22,160,993 | 22,152,226 |
| 2024 | - | - | - | - |

රජයේ සුරැකුම්පත්වල සාධාරණ අගය මහ බැංකුව විසින් ප්‍රකාශිත පිළිවෙලින් 2022 සහ 2023 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනිමේ හා විකිණිමේ මිළගණන්වල සාමාන්‍යයන් මත පදනම්වයි.

**2023.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළඳපොළ අගය**

| සමාගමේ නම | මිලදීගත් දිනය | නිදහස් කරගත් දිනය | ණයකර | | වෙළඳපොළ අගය | | | ක්‍රමක්ෂය පිරිවැය රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගණන | පිරිවැය රු.'000 | විකුණුම් කරයකට | රු.'000 | අනුපාතය (වාර්ෂිකව) | |
| සම්පත් බැංකුව පීඑල්සී | 28.02.2019 | 28.02.2024 | 1,750,000 | 175,000 | 100.00 | 175,000 | 13.90% | 195,460 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 28.03.2019 | 28.03.2024 | 7,500,000 | 750,000 | 100.00 | 750,000 | 13.50% | 827,394 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10.09.2019 | 10.09.2024 | 13,500,000 | 1,350,000 | 100.00 | 1,350,000 | 11.25% | 1,397,019 |
| හැටන් නැෂනල් බැංකුව 3 | 23.09.2019 | 22.09.2024 | 3,500,000 | 350,000 | 74.00 | 259,000 | 12.30% | 361,795 |
| ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී | 25.09.2020 | 24.09.2025 | 4,750,000 | 475,000 | 100.00 | 475,000 | 9.50% | 487,116 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 23.10.2020 | 23.10.2025 | 5,000,000 | 500,000 | 100.00 | 500,000 | 9.00% | 508,630 |
| සම්පත් බැංකුව පීඑල්සී | 12.04.2021 | 12.04.2028 | 6,000,000 | 600,000 | 100.00 | 600,000 | 9.00% | 639,058 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 16.04.2021 | 15.04.2026 | 20,000,000 | 2,000,000 | 98.00 | 1,960,000 | 9.35% | 2,133,205 |
| සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පීඑල්සී | 25.06.2021 | 25.06.2026 | 1,750,000 | 175,000 | 100.00 | 175,000 | 9.25% | 183,426 |
| නේෂන්ස්ට්‍රස්ට් බැංකුව පීඑල්සී | 09.07.2021 | 09.07.2026 | 8,000,000 | 800,000 | 100.00 | 800,000 | 9.15% | 825,296 |
| පීපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී | 05.08.2021 | 05.08.2026 | 10,000,000 | 1,000,000 | 100.00 | 1,000,000 | 9.00% | 1,036,740 |
| **එකතුව** | | | | **8,175,000** | | **8,044,000** | | **8,595,139** |

ලැයිස්තුග කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2023 දෙසැමබර් 31 දිනට මිලගණන් මත පදනම්වේ.

**2022.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළඳපොළ අගය**

| සමාගමේ නම | මිලදීගත් දිනය | නිදහස් කරගත් දිනය | ණයකර | | වෙළඳපොළ අගය | | | ක්‍රමක්ෂය පිරිවැය රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගණන | පිරිවැය රු.'000 | විකුණුම් කරයකට | රු.'000 | අනුපාතය (වාර්ෂිකව) | |
| හැටන් නැෂනල් බැංකුව | 01.11.2016 | 01.11.2023 | 547,100 | 54,710 | 107.25 | 58,676 | 13.00% | 55,899 |
| පීපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී | 18.04.2018 | 18.04.2023 | 5,000,000 | 500,000 | 98.00 | 490,000 | 12.80% | 545,238 |
| කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් | 23.07.2018 | 22.07.2023 | 1,859,700 | 185,970 | 100.00 | 185,970 | 12.00% | 195,936 |
| සම්පත් බැංකුව පීඑල්සී | 28.02.2019 | 28.02.2024 | 1,750,000 | 175,000 | 100.50 | 175,875 | 13.90% | 195,460 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 28.03.2019 | 28.03.2024 | 7,500,000 | 750,000 | 100.00 | 750,000 | 13.50% | 827,394 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10.09.2019 | 10.09.2024 | 13,500,000 | 1,350,000 | 100.00 | 1,350,000 | 11.25% | 1,397,019 |
| හැටන් නැෂනල් බැංකුව පීඑල්සී | 23.09.2019 | 22.09.2024 | 3,500,000 | 350,000 | 74.00 | 259,000 | 12.30% | 361,795 |
| ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී | 25.09.2020 | 24.09.2025 | 4,750,000 | 475,000 | 100.00 | 475,000 | 09.50% | 487,116 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 23.10.2020 | 23.10.2025 | 5,000,000 | 500,000 | 100.00 | 500,000 | 09.00% | 508,630 |
| සම්පත් බැංකුව පීඑල්සී | 12.04.2021 | 12.04.2028 | 6,000,000 | 600,000 | 100.00 | 600,000 | 09.00% | 639,058 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 16.04.2021 | 15.04.2026 | 20,000,000 | 2,000,000 | 88.61 | 1,772,200 | 09.35% | 2,133,205 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා පීඑල්සී) | 25.06.2021 | 25.06.2026 | 1,750,000 | 175,000 | 100.00 | 175,000 | 09.25% | 183,426 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී | 09.07.2021 | 09.07.2026 | 8,000,000 | 800,000 | 100.00 | 800,000 | 09.15% | 835,296 |
| පීපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී | 05.08.2021 | 05.08.2026 | 10,000,000 | 1,000,000 | 100.00 | 1,000,000 | 09.00% | 1,036,740 |
| **එකතුව** | | | | **8,915,680** | | **8,591,721** | | **9,402,211** |

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2022 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම්වේ.

**2023 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත**

| | ආයෝජන සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය (රු. '000) |
|---|---|---|---|---|
| 1 | ඒහොට් දේපල සමාගම | 58,213 | 26,938 | 44,130 |
| 2 | ඒකන්ස් ස්පෙන්ස් සමාගම | 275,623 | 246,427 | 219,889 |
| 3 | ඒකන්ස් ස්පෙන්ස් හෝටලය | 206,275 | 119,721 | 149,354 |
| 4 | ආසිරි රෝහල | 129,516 | 110,388 | 104,869 |
| 5 | ආසිරි සර්ජකල් රෝහල | 66,124 | 57,444 | 57,002 |
| 6 | බහිරා ෆාම්ස් | 206,974 | 149,358 | 176,665 |
| 7 | කාසන් කම්බර්බැච් පීඑල්සී | 16,147 | 9,749 | 8,991 |
| 8 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් | 128,840 | 73,891 | 124,729 |
| 9 | සිලෝන් ඉන්වෙස්මන්ට් | 8,575 | 2,223 | 3,137 |
| 10 | සිලෝන් ගාඩියන් ඉන්වෙස්මන්ට් | 143,302 | 30,000 | 40,753 |
| 11 | සිලෝන් ග්‍රේන් ඉලිවේටර් | 96,022 | 59,056 | 117,524 |
| 12 | සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | 95,431 | 50,134 | 73,980 |
| 13 | සීඅයිසී හෝල්ඩිංග්ස් | 118,893 | 198,308 | 149,314 |
| 14 | කලම්බු ෆෝට්ලන්ඩ් | 55,327 | 19,881 | 21,701 |
| 15 | කොමර්ෂල් බැංකුව | 1,236,783 | 499,002 | 915,771 |
| | කොමර්ෂල් බැංකුව (X) | 516,923 | 189,285 | 355,875 |
| 16 | ඩී.එෆ්.සී.සී. බැංකුව | 682,419 | 150,148 | 369,282 |
| 17 | ඩොක්යාඩ් | 437,865 | 102,463 | 87,701 |
| 18 | ඩයලොග් ආසියාටා | 355,601 | 256,994 | 272,111 |
| 19 | ඩිප් ප්‍රොඩක්ට්ස් | 86,955 | 55,521 | 53,650 |
| 20 | ඒඩන් හෝටලය | 75,885 | 27,684 | 16,136 |
| 21 | ෆස්ට් කැපිටල් ට්‍රෂෙරීස් | 10,841 | 609,237 | 650,717 |
| 22 | හැටන් නැෂනල් බැංකුව (X) | 131,073 | 66,761 | 131,570 |
| 23 | එච්එන්බී ඇෂුවරන්ස් | 202,158 | 164,982 | 223,905 |
| 24 | හේලිස් ෆැබ්රික්ස් | 93,245 | 59,399 | 106,390 |
| 25 | හේකාබ් පීඑල්සී | 82,261 | 65,062 | 73,440 |
| 26 | ජෝන් කීල්ස් | 15,800 | 11,066 | 10,913 |
| 27 | ජේකේඑච් | 2,140,032 | 1,763,297 | 2,480,956 |
| 28 | කැළණි කේබල්ස් | 10,326 | 21,420 | 20,038 |
| 29 | කැළණි ටයර්ස් | 246,394 | 164,467 | 178,645 |
| 30 | කීල්ස් ෆුඩ්ස් | 7,847 | 7,961 | 8,193 |
| 31 | ලන්කෙම් සිලෝන් | 16,823 | 7,693 | 5,307 |
| 32 | ලාෆ් ගෑස් | 780 | 688 | 1,587 |
| 33 | ලාෆ් ෆවර්ස් | 815 | 415 | 405 |
| 34 | ලංකා අයිඕසී | 14,746 | 165,002 | 82,704 |

| | ආයෝජන සමාගමේ නම | සත්‍ය පිරිවැය | සාධාරණ අගය | වෙළඳපොළ අගය |
|---|---|---|---|---|
| | | (රු. '000) | (රු. '000) | (රු. '000) |
| 35 | ලංකා මිල්ක් ෆුඩ්ස් | 96,823 | 71,286 | 130,881 |
| 36 | ලංකා ටයිල්ස් | 16,745 | 15,809 | 15,430 |
| 37 | ලංකා වෝල්ටයිල්ස් | 25,053 | 18,415 | 15,798 |
| 38 | ජාතික සංවර්ධන බැංකුව | 1,438,105 | 444,795 | 880,725 |
| 39 | නවලෝක රෝහල | 68,652 | 55,601 | 30,889 |
| 40 | ඕවසීස් රියල්ටි | 161,143 | 155,474 | 156,207 |
| 41 | පීපල්ස් ලීසිං | 182,879 | 65,249 | 136,894 |
| 42 | පීපල්ස් ඉන්ෂුවරන්ස් | 54,022 | 42,504 | 48,030 |
| 43 | පිජීපි ග්ලාස් පිඑල්සී | 16,214 | 12,136 | 25,191 |
| 44 | රේණුකා හොල්ඩිංග්ස් | 116,906 | 43,190 | 39,311 |
| 45 | රිසර්ස් එනර්ජි | 49,445 | 22,869 | 28,552 |
| 46 | රිචඩ් පීරිස් කොම්පැනි | 115,544 | 138,671 | 116,986 |
| 47 | සම්පත් බැංකුව | 421,670 | 249,516 | 507,070 |
| 48 | සෙලාන් බැංකුව | 391,259 | 158,211 | 221,403 |
| | සෙලාන් බැංකුව (X) | 86,135 | 30,288 | 64,525 |
| 49 | සිංගර් ෆිනෑන්ස් | 23,608 | 11,927 | 13,214 |
| 50 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 110,326 | 224,219 | 307,103 |
| 51 | ටීජේ ලංකා | 115,357 | 86,485 | 97,195 |
| 52 | ට්‍රාන්ස් ඒෂියා | 37,073 | 25,737 | 22,306 |
| 53 | ටොකියෝ සිමෙන්ට් පිඑල්සී | 230,952 | 117,161 | 179,654 |
| 54 | වැලිබල් ෆවර් | 83,752 | 61,035 | 69,754 |
| 55 | විදුල් ලංකා පීඑල්සි | 701 | 537 | 589 |
| 56 | වින්ඩ්ෆෝස් පිඑල්සි | 131,660 | 104,067 | 133,401 |
| | **එකතුව** | **11,944,860** | **7,697,247** | **10,578,443** |

## ලැයිස්තුගත නොවන සමාගම්වල කොටස්

| | | | | |
|---|---|---|---|---|
| 1 | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් | 5 | 45 | - |

ප්‍රොපර්ටි ඩිවලොප්ටන්ට්ස් පීඑල්සී 2022 ඔක්තෝම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැයිස්තුගත කර ඇත.

**2023.12.31 දිනට විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම් ලෙස නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත නොවන කොටස් ආයෝජන**

| | සමාගමේ නම | පිරිවැය (රු. '000) | ශුද්ධ වත්කම් වටිනාකම (රු. '000) 31.12.2022 | ශුද්ධ වත්කම් වටිනාකම (රු. '000) 31.12.2023 |
|---|---|---|---|---|
| 1 | ෆිච් රේටින් ලංකා ලිමිටඩ් | 1,649 | 3,908 | 4,923 |
| | **එකතුව** | **1,649** | **3,908** | **4,923** |

**2023.12.31 දිනට අනුබද්ධිත සමාගම්වල ආයෝජන**

| | සමාගමේ නම | පිරිවැය (රු. '000) |
|---|---|---|
| 1 | ලංකා ලුණු සමාගම | 470,961 |
| | **එකතුව** | **470,961** |

**ලාභ හෝ අලාභ තුළින් සාධාරන අගය මත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් ආයෝජනය**

| | සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය 2023.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 1 | ඇක්සස් ඉන්ජිනියරින් | 51,441 | 17,905 | 34,290 |
| 2 | ඒසීඑල් කේබල්ස් පීඑල්සී | 41,664 | 35,418 | 35,944 |
| 3 | චෙව්‍රොන් ලබ්රිකන්ට් | 121,847 | 121,847 | 121,585 |
| 4 | සී.අයි.සී. හෝල්ඩිංග්ස් පීඑල්සී | 152,792 | 152,792 | 148,311 |
| | සී.අයි.සී. හෝල්ඩිංග්ස් (X) | 53,267 | 53,267 | 42,228 |
| 5 | කොමර්ෂල් බැංකුව | 1,317,132 | 522,514 | 958,920 |
| | කොමර්ෂල් බැංකුව (X) | 165,809 | 69,176 | 130,058 |
| 6 | ඩයලොග් ආසියාටා | 216,249 | 160,645 | 170,095 |
| 7 | ඩිප් ප්‍රොඩක්ට්ස් | 220,950 | 116,042 | 112,005 |
| 8 | හැටන් නැෂනල් බැංකුව | 536,702 | 248,405 | 519,145 |
| | හැටන් නැෂනල් බැංකුව (X) | 70,448 | 37,407 | 73,721 |
| 9 | හේකාබ් පීඑල්සී | 14,120 | 13,881 | 15,745 |
| 10 | හේමාස් හෝල්ඩිංග්ස් | 32,479 | 32,479 | 30,925 |
| 11 | ජැට් හෝල්ඩිංග්ස් | 4,385 | 4,385 | 4,297 |
| 12 | ලංකා අයිඕසී | 38,612 | 214,397 | 107,462 |
| 13 | ලංකා ටයිල්ස් පීඑල්සී | 200,033 | 139,487 | 133,486 |
| 14 | ලංකා වෝල්ටයිල්ස් | 314,486 | 215,094 | 179,792 |
| 15 | ලාෆ් ෆවර් | 3,196 | 1,433 | 1,401 |
| 16 | මෙල්ස්ටාක්‍රෝප් පීඑල්සී | 32,301 | 32,301 | 34,877 |
| 17 | පීපල්ස් ලීසින්ස් | 79,571 | 32,749 | 68,710 |
| 18 | පීපල්ස් ඉන්ෂුවරන්ස් | 57,882 | 34,853 | 39,384 |
| 19 | රිච්ඩ් පීරිස් | 64,590 | 91,490 | 77,183 |
| 20 | රිසර්ස් එනර්ජි | 32,663 | 16,684 | 20,817 |
| 21 | රෝයල් සෙරමික් | 343,724 | 221,493 | 203,400 |

| | සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළෙඳපොළ අගය 2023.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 22 | සම්පත් බැංකුව | 865,531 | 442,903 | 900,073 |
| 23 | සෙලාන් බැංකුව | 86,456 | 38,367 | 53,691 |
| | සෙලාන් බැංකුව (ඩ) | 84,307 | 32,279 | 68,767 |
| 24 | සීරා කේබල්ස් පීඑල්සී | 34,477 | 21,567 | 27,303 |
| 25 | සිංගර් ෆිනෑන්ස් | 48,443 | 23,170 | 25,668 |
| 26 | සන්ෂයින් හෝල්ඩිංග්ස් | 68,231 | 68,231 | 67,808 |
| 27 | ටෝකියෝ සිමෙන්ති | 34,293 | 34,293 | 30,667 |
| | ටෝකියෝ සිමෙන්ති (X) | 26,573 | 26,573 | 26,220 |
| | **එකතුව** | **5,414,655** | **3,273,526** | **4,463,977** |

2023.12.31 දිනට ලැයිස්තුගත ඒකක භාර

| | වර්ගය | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළෙඳපොළ අගය 2023.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 1 | CTCLSA ඇසට් | 12,283 | 25,124 | 32,307 |
| 2 | නැෂනල් ස්කන්ධ අරමුදල | 35,816 | 117,495 | 141,069 |
| 3 | නාමල් වර්ධන අරමුදල | 375 | 6,882 | 8,180 |
| | **එකතුව** | **48,474** | **149,502** | **181,556** |

## 1. සාංගමික තොරතුරු

### 1.1 නීත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නීත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියා පදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

2023 දෙසැම්බර් මස 31 වන දිනට සහ අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට, මණ්ඩලය (පරිවාරිත) සහ එහි පූර්ණ හිමිකාරිත්වය දරන පරිපාලිත ආයතනය (එක්ව කියැවෙන කල්හි, "සමූහය" ලෙස හඳුන්වනු ලබන) ඇතුළත් වේ. 2023 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලයේ පරිපාලිත සමාගම වූයේ, ලංකා සෝල්ට් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සමූහයේ අත්‍යන්ත ආයතනය වන්නේ ය.

මණ්ඩලයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශ විෂයයෙහි සෑම වසරකම දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. "මණ්ඩලයේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශ, සෑම වසරකම දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වන මාස 12 ක් වූ කාල පරිච්ඡේදය සඳහා සකස් කර ඇත.

### 1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

| ආයතනයේ නම | ව්‍යාපාරයේ සවභාවය |
|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් එකී සේවක සේවිකාවන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවක සේවිකාවන් ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී. |
| ලංකා ලුණු සමාගම | මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි. |

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සහ සංශෝධිත පනතේ විධිවිධාන හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති (LKAS/SLFRS) අනුව සමූහයේ සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රමිති සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතු වගකීමකි.

### 1.5 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2024 අප්‍රේල් මස 08 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

## 2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

### 2.1 පොදු ප්‍රතිපත්ති

#### 2.1.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රපෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ.

#### 2.1.2 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2023 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් (“මූල්‍ය ප්‍රකාශ”) සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි.

සිමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

#### 2.1.3 වැදගත් ගිණුම් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දැක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂී ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතාවයක් සම්බන්ධ වන්නා වූ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්තමේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

**තීන්දු**

**විලම්බිත බදු වත්කම්:**

සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ චිල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

#### 2.1.4. මානනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ, සාධාරණ අගය අනුව මිනිනු ලබන ඇතැම් වත්කම් සහ බැරකම් සඳහාත්, ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකර ප්‍රමිති අංක 09 වන, මූල්‍ය මෙවලම්වල අවශ්‍යතා අනුව ක්‍රමක්ෂිත පිරිවැය යටතේ ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් සඳහාත් හැරුනු විට, ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ

සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේ දී, ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 වන ගිණුම්කරණය සහ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මගින් වාර්තාකරණය කිරීම යොදා ගනු ලැබ ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී එම මණ්ඩලය විසින් ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 ප්‍රකාරව ගිණුම්කරණය සහ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මගින් වාර්තාකරණය කිරීම යොදා ගන්නා ලද්දේය යන කාරණය, පෙර මූල්‍ය ප්‍රකාශවල නිශ්චිතව අනාවරණය කර නොතිබුණි. මෙම කාරණය හෙළිදරව් නොකිරීම කරණ කොට ගෙන පෙර මූල්‍ය ප්‍රකාශවල වාර්තා කරන ලද මුදල් ප්‍රමාණ ප්‍රති ප්‍රකාශ කිරීමක් අවැසි නොවන්නේ ය.

සීමාසහිත ලංකා ලුණු සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. සමාගමේ ක්‍රියාත්මක මුදල් ඒකකය, ශ්‍රී ලංකා රුපියල වන අතර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල මගිනි.

**2.1.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් ඒකකය**

සමාගමේ ක්‍රියාකාරී ව්‍යාවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

**2.1.6 වැටයීම**

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණයන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 1) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 විසින් අවසරදී ඇති පරිදි සඳහන් කර ඇති අවස්ථා හැර ආසන්න රුපියල් දහසට වටයා ඇත.

**2.1.7 හිලව් කිරීම**

ගිනුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපනයක් (IFR අර්ථ නිරූපන කමිටුව සහ ප්‍රමිති අර්ථ නිරූපන කමිටුව විසින් නිකුත් කළ) විසින් අවශ්‍යනම් හෝ අවසරදී ඇතිනම් මිස, ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් නොකෙරේ. හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතිව බලාත්මක අයිතියක් ඇත්නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම් මුදාහැර වගකීම් නිරවුල් කිරීමේ අභිප්‍රායක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ ප්‍රමාණය SOFP හි වාර්තා කරයි.

**2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමූහනය**

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූලය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වය පිළිබඳ අයිතම LKAS 1 විසින් සහ 2016 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ අනාවරණ මුල්පිරිම පිළිබඳ LKAS 1 ට විසින් අවසරදී ඇති පරිදි ඒවා වැදගත් නොවන්නේනම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

**2.1.9 ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය**

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාරණය දැනුවත් නොමැත. එහෙයින්, සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

**2.1.10. සංසන්දනාත්මක තොරතුරු**

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ. පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසැඳිය හැකියග

## 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

### (අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2023 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ. පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

### (ආ) පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ ඍජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමාගම සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්තනය සේ සැලකෙන ඡන්දය දිමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පරිපාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ.

ඒකාබද්ධ කිරීමේදී සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ ඒකාබද්ධ කිරීමේදී අන්තර්ගත කළ සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

### (ඇ) රපෝර්තු දිනය

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

## 2.3 ලාභ සහ අලාභ මානනය කිරීමේ පදනම

### 2.3.1 ආදායම

ආදායම හඳුනා ගැනෙනුයේ එමගින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකිතාක් දුරකටය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනිමේ නිර්නායක ද සපුරා ලිය යුතු වන්නේ ය.

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හී ය. වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනිමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

**අ) භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂී අවදානම් සහ භාණ්ඩවල හිමිකාරීත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

**ආ) සේවා ඉටු කිරීම**
එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදයම හඳුනා ගැනේ.

**ඇ) පොලිය**
වත්කම් මත සඵල පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

**ඈ) වෙනත්**
වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගනී

**2.3.2 පොලී සහ සමාන ආදායම් සහ වියදම්**

විකිනීමට ඇති ලෙස වර්ග කර ඇති පොළි දරණ මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධරණ වටිනාකමින්නම් කරන සියලුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මූල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ. එම ගණනය මගින් මූල්‍ය මෙවලමෙහි දැක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සඵල පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය එකී ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කූපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ.

දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, “අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකගත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය” යනුවෙනි.

**2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්**

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

**2.3.4 වෙනත් ආදායම්**

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

**2.4 බදුකරණය**

### 2.4.1 ප්‍රවර්තන බදු

රපෝර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනිමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂ්‍ය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයු ආදායමට අදාළ රඳවා ගැනිමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

දැනට ගෙවිය යුතු සහ කල් දැමූ බදුවල එකතුව ආදායම් බදු වියදම් නියෝජනය කරනු ලබයි.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශිය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

### 2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනිමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වූ විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

## 2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිලිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

### 2.6 ආයෝජන හා වෙනත් මූල්‍ය වත්කම්

#### 2.6.1 වර්ගීකරණය

2018 ජනවාරි 1 දින සිට, මණ්ඩලය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් මැනීම් වර්ගීකරණ තුළ වර්ගීකරණය කරයි

- සාධාරණ අගයට (අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් හො ලාභය හෝ අලාභය තුළින්) පසුකාලීනව මනිනු ලබන මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්
- මෙම වර්ගකීකරණය රඳා පවතින්නේ ආයතනයේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් මතවේ.

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වතක්ම් සඳහා, ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරනු ලැබේ. වෙළඳාම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණවල අයෝජන සඳහා, අරමුදල අනෙකුත් විස්තරාත්මක අදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ ආයෝජනය සඳහා ගණනය කිරීම සඳහා මුලින් හඳුනා ගන්නා අවස්ථාවේදී වෙනස් නොකලහැකි තේරීමක් සිදු කර ඇත යන පදනම මත රඳා පවතී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඉදිරිපත් කරන ප්‍රමාණය පසුකාලිනව ආදායම් ප්‍රකාශනයට මාරු නොකෙරේ. එවැනි ආයෝජන මත ලාභාංශ අදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

අරමුදල ණය ආයෝජන වර්ගීකරණය කරන්නේ එවැනි වත්කම් කළමනාකරණය කිරීම සඳහා එහි ව්‍යාපාර මාදිලිය වෙනස්වන විට පමණක්වේ.

#### 2.6.2 හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම් නිත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම්, වත්කම් මිලදී ගැනිමට හෝ විකිණීම කළ දිනය අනුව වෙළෙඳ දිනට හඳුනා ගනී. මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ අරමුදල විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා නොගනී.

#### 2.6.3 මැණුම්කරණය

මූලික හඳුනාගැනිමේදි, අරමුදල මූල්‍ය වත්කම් එහි සාධාරණ වටිනාකම සමඟ, ලාභ හෝ අලාභ (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් නොලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත්කර ගැනිම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලබයි. FVTPL ට ගෙන යන මූල්‍ය වත්කම්වල ගණුදෙණු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. බද්ධවූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේදි මූලික මුදලත් පොළිය පමණක් සලකා බලනු ලැබේ.

##### 2.6.3.1 ණය උපකරණ

ණය උපකරණවල පසුකාලීන මැණුම්කරණය, වත්කම කළමනාකරණය තරමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ මත රඳා පවති. අරමුදල ණය උපකරණ වර්ගීකරණය කරන මිණුම්කරණ තුනක් ඇත.

**ක්‍රමක්ෂය කළ පිරිවැය :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා දරාගෙන සිටින වත්කම්වල එම මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි. මෙම මූල්‍ය වත්කම්වලින් පොළි ආදායම එලදායි පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ ඇතුලත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර විදේශ විනිමය ලාභ සහ අලාභ සමඟ එක්ව වෙන් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කෙරේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනය තුල වෙනම තිරුවක ඉදිරිපත් කෙරේ.

**වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය (FVTOCI) :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා දරාගෙන සිටින වත්කම්, එම වත්කම්වල මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි. ධාරණ අගය තුළ වෙනස්වීම් අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා හානිකරණ ලාභ හෝ අලාභ, පොළි ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනාගැනිම හැර අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළින් ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගන්නා විට, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ මෙයට පරෙ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධවල සිට ලාභය හෝ අලාභ දක්වා නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/ (අලාභ) තුළි හඳුනා ගනී. මෙම මූල්‍ය වත්කම්වලින් පොළි ආදායම එලදායි පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය අදායම තුළ ඇතුළත් කෙරේ. විදේශ

විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කරන අතර හානිකරණ වියදම් ආදායම් ප්‍රකාශනය තුළ වෙනම තීරුවක ඉදිරිපත් කෙරේ.

**ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය:** FVTPL ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය සඳහා නිර්නායක නොසපුරන වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පසුකාලීනව මනින ණය උපකරණයක් මත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර ලාභ/ (අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

### 2.6.3.2 කොටස් හිමිකම් සාධන පත්‍ර

අරමුදල සිය සියලු කොටස් හිමිකම් ආයෝජන සාධාරණ අගයට අනුව පසු කාලීනව මානනය කරයි. අරමුදල් කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් තුළ කොටස් හිමිකම් ආයෝජන මත සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ ඉදිරිපත් කරනු ලැබීමට තෝරා ගනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ ආයෝජනය හඳුනා නොගැනීම මත සිදුවන සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ කරා පසු කාලීනව ප්‍රතිවර්ගීකරණයට යටත් නොවේ. ගෙවීම් ලබා ගැනීම පිළිබඳ වූ අරමුදලට අයත් ස්වකීය අයිතිය තහවුරු වූ කල්හි ලාභ හෝ අලාභ තුළ එම ආයෝජන වෙතින් උත්පාදනය වන ලාභාංශ වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් හඳුනා ගැනීම නොකඩවා සිදු වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම්, අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ලාභ / (අලාභ) යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ මානනය කරන ලද කොටස් හිමිකම් ආයොජන මත සිදුවන අපහායන අලාභ (සහ අපහායන අලාභ වල ප්‍රත්‍යාවර්තනය) සාධාරණ අගය විෂයෙහි සිදුවන වෙනස්කම් වලින් වෙන් කරනු ලැබ වාර්තා නොකෙරේ.

**මූලික මූල්‍ය මෙවලම්**

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනිමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

**ණය සහ ලැබීම් නියමිත**

ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබිම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරුණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබිම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානියට පත් වීම**

මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට කිසියම් ආත්මානුරූපික වූ සාක්ෂි තිබේ ද යනුවෙන් සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදී ම තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට සලකනු ලබන්නේ, අදාළ වත්කම විෂයයෙහි එම දුබලතා මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ එක් සිදුවීමක හෝ ඊට වැඩි සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට ආත්මානුරූපික වූ සාක්ෂි ඇත්නම් සහ එම අලාභ සිදුවීම, විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් ඇති කරන්නේ නම් පමණක් ම වන්නේ ය. ණයගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට හෝ පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම්වලට හෝ ඒවා ගෙවීමෙන් වැළැකී සිටීම්වලට මුහුණ දෙමින් සිටින බවට පිළිබිඹු වන කරුණු ද, ඔවුන් බංකොලොත් භාවයට පත් වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව යන කරුණු ද, හිඟ හිට ඇති මුදල්වල වෙනස්වීම් හෝ මුදල් ගෙවීම් පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ අගයෙහි මැනිය හැකි යම් අඩුවීමක් ඇති බව දත්ත මගින් නිරීක්ෂණය වන කරුණු ද වත්කම් හානියට පත් වීම පිළිබඳව හඟවන සළකුණුවලට අන්තර්ගත විය හැකි ය.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි. ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදී මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හීය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමණාවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 2.7 දේපළ, පිරියත හා උපකරණ

### 2.7.1 හඳුනා ගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාව පවතී නම් හා වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනේ. රුපියල් 10,000 ක් වූ ප්‍රමාණයට වඩා අඩු අයිතමයක ඒකක පිරිවැයක් (උපයෝගී පිරිවැය ද ඇතුළුව) දේපළක්, පිරියතක් සහ උපකරණයක් ලෙස හඳුනා නොගෙන එම අයිතම, වියදමක් ලෙස හඳුනා ගැනීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ ය. කෙසේ වෙතත්, ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල පිරිවැය (උපයෝගී පිරිවැය ද ඇතුළුව), ඒකක සීමාව රුපියල් 10,000 ක් වූ ප්‍රමාණය නොතකා ප්‍රාග්ධනීකරණය කෙරේ.

### 2.7.2 මානනය කිරීමේ පදනම

නිරවුල් ඉඩම් හැර වෙනත් දේපල, පිරියත සහ උපකරණ අයිතම, පිරිවැය ඌණ සමුච්චිත ක්ෂය වීම් එල්ලේ සහ යම් දුබලතා අලාභ කිසිවක් වේ නම් එවා එල්ලේ මනිනු ලැබේ.

ප්‍රති තක්සේරු කිරීමේ සහ ද්‍රව්‍යමය භාවයේ පවත්නා ප්‍රායෝගික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2022 ජනවාරි මස 01 වන දිනට වත්කම්වල මූලික පිරිවැය ලෙස දැනට ඇති වත්කම්වල අගය අඩු කළ වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මිත වත්කම්වල පිරිවැය, ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමයෙන් ද, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් යම් වියදම් වලින් ද, අයිතම වල කොටස් ගැලවීමට හා ඉවත් කිරීමට සහ ඒවා පවතින අඩවිය ප්‍රතිස්ථාපනය කිරීමට දරන්නා වූ පිරිවැයෙන් ද සමන්විත වන අතර සුදුසුකම් සහිත ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලැබ ඇත.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවලට අයත් කොටස්වල විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාල ඇති විට, ඒවා දේපල, පිරියත සහ උපකරණ යන වෙනම අයිතම ලෙස ගිණුම්හි ගණනය කරනු ලැබේ.

### 2.7.3 තදනන්තර පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගල ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණයෙන් හඳුනා ගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණය හඳුනා ගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා කිරීම් සඳහා වන වියදම් එවායේ වැය දැරීමට සිදු වන අවස්ථාවේදී දරනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා වන වියදම, එය දරනු ලබන කල්හි, ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.7.4 ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයක එක් එක් අංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ, සරල මාර්ග පදනමක් මත, ලාභය හෝ අලාභය තුළ ක්ෂය වීම හඳුනා ගැනේ. ඉඩම් ක්ෂය නොකෙරේ. තනි වත්කම්වල සැලකිය යුතු අංග තක්සේරු කරනු ලබන අතර, එම වත්කමේ ඉතිරිව ඇති කොටසට වඩා වෙනස් වූ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් යම් අංගයකට තිබේ නම්, එම අංගය වෙන් වශයෙන් ක්ෂය කරනු ලැබේ.

වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය පිණිස පවත්නා කල්හි වන අතර, එය, අදාළ වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කර ඇති දිනය හෝ වත්කම හඳුනා ගනු නොලබන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වේ.

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය සඳහා පවතින මාසයේ දී වන අතර ඒවා ව්‍යපහරණය කළ මාසයේ දී ක්ෂය නොකෙරේ.

ක්ෂය වීම් ක්‍රම, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ අවශේෂ අගයන් වාර්තා කරන දිනයේ දී තක්සේරු කර, සුදුසු වන්නේ නම්, ඊට ගැළපුම් සිදු කරනු ලැබේ.

| | **වසර ගණන ප්‍රයෝජනවත් ආයු කාලය** | **ක්ෂයවීම් අනුපාතය** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 40 | 2.5% |
| මෝටර් වාහන | වසර 05 | 20% |
| පරිගණක උපකරණ | වසර 05 | 20% |
| ගෘහ භාණ්ඩ | වසර 10 | 10% |
| සවි කිරීම් සහ වැද්දුම් | වසර 10 | 10% |
| වෙනත් උපකරණ | වසර 05 | 20% |

### 2.7.5 දේපල, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් සහ මුලින් හඳුනාගත් කිසියම් සැලකිය යුතු කොටසක් බැහැර කිරීමේ දී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන කල්හි හෝ හඳුනා ගනු නොලැබේ. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම්කිසි ලාභයක් හෝ අලාභයක්, එම වත්කම හඳුනා ගනු නොලබන කල්හි ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල අවශේෂ අගයන්, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය වීමේ ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර, සුදුසු වන්නේ නම්, භවිත්‍ය ලෙස ඊට අවශ්‍ය ගැළපුම් සිදු කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත ඒවා අඩුකරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂයවීම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩුකළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර, පහත දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ ක්ෂය විම් සඳහා එය යොදා ගැනේ.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම් | ... | 2.5% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | |
| - පොම්ප හා උපකරණ | ... | 20% |
| - වෙනත් (මේස ලුණු බලාගාරය, අයඩිකරණ කම්හල, දොඹකර සහ වෙනත් පිරියත) | ... | 10% |
| උපකරණ | ... | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | ... | 10% |
| මොටර් වාහන | | |
| - මහමාර්ග වාහන | ... | 10% |
| - ට්‍රැක්ටර් සහ ට්‍රලර් | ... | 20% |
| සංවර්ධන වැඩ | ... | 20% |
| වැඩුනු වතුවගා - පොල් | ... | 02% |

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණු පිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

- **ජෛවවත්කම්**

ජෛව වත්කම්, පරිණත වූ ජෛව වත්කම් සහ පරිණත නොවූ ජෛව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ ජෛව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ ජෛව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක ජෛව වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොගැනෙන ජෛව වත්කම් ඇතුළත් වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම ජෛව වත්කම් හඳුනා ගනියි. ජෛව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථිර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක ජෛවවත්කම්**

ධාරක ජෛව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, භෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ ඍජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී ඵල දරන ධාරක ජෛව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

## 2.8 ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදී පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනසද සමග විස්තීර්ණ අදායම් ගිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර, එය රජයේ තක්සේරුකරු විසින් 2022 අගෝස්තු මස 24 වන දින තක්සේරු කරන ලදී. එම තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු.4,587,406,450 ක් වූ ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් තිබුණි. 2023 වසරේ අවසන් ගිණුම් සකස් කිරීම සඳහා එම ඉඩම තක්සේරු කිරීම සඳහා ලිපියක් යොමු කරන ලද අතර, එම ලිපියට පිළිතුරු වශයෙන් එම දෙපාර්තමේන්තුව 2023 සැප්තැම්බර් මස 23 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ මෙම දේපල සම්බන්ධයෙන් නිකුත් කර ඇති තක්සේරු වාර්තාව 2018 දෙසැම්බර් මස 31 දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති වත්කම් කලමනාකරණ චක්‍ර ලේඛ අංක 4/2018 දරණ චක්‍ර ලේඛය අනුව වසර 05කට වලංගු බවය.

### 2.8.1 (අ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - ප්‍රමාණය සහ පිහිටි ස්ථානය

| පිහිටි ස්ථානය | ප්‍රමාණය (පර්චස්) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 388 | රු. 4,566,000,000.00 |

| පිහිටි ස්ථානය | ගොඩනැගිලි (වර්ග අඩි) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 19,319 | රු. 21,406,450.00 |

**2.8.2 (ආ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - තක්සේරු**

| වෘත්තීය තක්සේරුකරුගේ නම / පිහිටි ස්ථානය හා ලිපිනය | තක්සේරු කිරීමේ ක්‍රමය සහ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් | නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් සඳහා වන ඇස්තමේන්තු පරාසය රු. | ආයෝජන දේපළෙහි සාධාරණ අගය රු. |
|---|---|---|---|
| රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, "තක්සේරු මන්දිරය", අංක 748, මරදාන පාර, කොළඹ 10. | වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය<br>• පර්චස් එකක මිල<br>• වර්ග අඩියක මිල | පර්චස් එකක් 11,823,212.50 බැගින්<br>වර්ග අඩියක් 625 - 1955 බැගින් | 4,566,000,000.00<br>21,406,450.00 |

**2.8.3 (ඇ) සමූහය සතු ආයෝජන දේපළවල සාධාරණ අගය මානනය කිරීමේ තක්සේරු ශිල්ප ක්‍රම හා එහි සංවේදකතාවය**

| තක්සේරු ශිල්ප ක්‍රමය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන තක්සේරු යෙදවුම් | යෙදවුම් එල්ලේ සාධාරණ අගය මානනය කිරීමේ සංවේදකතාවය |
|---|---|---|
| වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය - ප්‍රතිතක්සේරු කිරීමට භාජනය වන දේපළවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී, ඒ හා සමාන දේපළක යුක්ති සහගත නුදුරු කාල පරිච්ඡේදයක් තුළ පැවති විකුණුම් මිල මෙම ක්‍රමය මගින් සලකා බැලේ. මෙයට සමාන වත්කම්වල පැවති මෑත කාලීන සක්‍රීය වෙළඳපළ මිල තක්සේරු කිරීම මීට අදාළ කර ගනු ලබන අතර එකී නිශ්චිත දේපළෙහි ප්‍රමාණය, ස්වභාවය, ස්ථානීය පිහිටීම සහ තත්ත්වය යනාදියෙහි වෙනස්කම් සඳහා සුදුසු ගැළපීම් කිරීම ද එහි දී සිදු වේ. | • පර්චස් එකක මිල<br>• වර්ග අඩියක මිල | ඇස්තමේන්තුගත සාධාරණ අගය පහත දැක්වෙන තත්වයන් යටතේ වැඩි වනු ඇත./ (අඩු වනු ඇත.)<br>- පර්චස් එකක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්;<br>- වර්ග අඩියක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්. |

## 2.9 අස්පෘශ්‍ය වත්කම්

**2.9.1 බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්**

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේද තක්සේරු කිරීමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේදී,එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.9.2 පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනුලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.10 කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, “කල්බදුකර දේපළ” ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

### 2.10.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදී, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

### 2.11 තොග භාණ්ඩ

භාණ්ඩ තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමාන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ භාණ්ඩ තොගය විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ භාණ්ඩ තොග ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | - පළමුව පැමිණි පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම අනුව |
| නිමි භාණ්ඩ | - සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශීය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව |
| කෙරෙමින් පවත්නා වැඩ | - සනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදී පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසීමේ වියදමින් 25% ක්වූ ප්‍රමාණයට අනුව |
| පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් | - පළමුව පැමිණි පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව |

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිලය.

### 2.12 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

#### 2.12.1 සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනීමේදී තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

#### 2.12.2 නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේදායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරවසියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ.සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

#### 2.12.3 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත. එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකිම උද්ගත වන්නේය. මෙම වගකිම් දැරීම බාහිර වශයෙන් මූල්‍යයනය කෙරෙන්නක් නොවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්ච්ඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනානොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.

ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නාවූ කල්පිරීමේ දිනයන් ඇත්තාවූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත එක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක අනුව නාමනය කරනු ලැබ ඇත්තාවූද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේය. අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකී ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක්වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීවගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම්ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරීමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවීම්වල සරල කිරීම්ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාලද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගී කරගනු ලැබ තිබේ. පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයුගණක වශයෙන් අගයනු ලැබද නොමැත.

### 2.13 සම කොටස් හිමිකම

#### 2.13.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙුවෙන් උපචිත වන්නාවූ පොලි හා ලාභාංශද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේය.

#### 2.13.2 ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනීමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

#### 2.13.3 සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාග ණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයටපත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විතවේ.

### 2.14 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නාවූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මිනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත  වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මිනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

### 2.15 වෙළඳ හා වෙනත් ලැබිම් නියමිත

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබිම් නියමිත තුළ පොලී නොදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබිම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය.  එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදි වෙළඳ හා වෙනත් ලැබිම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

## 2.16 වෙළඳ ගෙවීම් නියමිත

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදැරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

## 2.17 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

## 2.18 ප්‍රදාන සහ සහනාධාර

මණ්ඩලය විසින් වත්කම්වලට අදාළ මූල්‍ය ප්‍රදාන, පිරිවැය ලෙස හඳුනා ගනු ලබන අතර, ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ විලම්බනය කර වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ලද ප්‍රදානය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ක්‍රමක්ෂ කර ඇත්තේ පහත දැක්වෙන පරිදි ය.

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | 33.33% |
| මෝටර් වාහන | 20% |

ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ සියලුම ඒ හා සම්බන්ධ කොන්දේසි වලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ඇති විට ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට, එය, ඒ සඳහා හානි පූරණය කිරීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැළපීමට අවශ්‍ය කාල සීමාව මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, එය අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා විලම්බිත ආදායමක් ලෙස පිහිටුවා ගැනේ. මණ්ඩලයට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම සහ එම ප්‍රදානය නාමික ප්‍රමාණවලින් සටහන් කර පහත සඳහන් පරිදි සමාන වාර්ෂික වාරිකවලින් අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශය වෙත මුදා හරිනු ලැබේ :

ලැබෙන ප්‍රදාන, සංචිත ගිණුමකට බැර කරනු ලැබ පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කෙරේ.

| | |
|---|---|
| අයඩීකරණ යන්ත්‍රාගාරය සඳහා ප්‍රදානය | 10% |
| මෝටර් රථය සඳහා ප්‍රදානය | 10% |
| ගොඩනැගිලි සඳහා ප්‍රදාන | 2.5% |
| පොම්පාගාරය සඳහා ප්‍රදානය | 2.5% |

සේවකයින්ට වන්දි ලබා දීම සඳහා ප්‍රදානය - ගෙවනු ලබන වන්දි මුදලින් අඩු කිරීම.

## 2.19 වත්කම් අපහායනය

### 2.19.1 මූල්‍ය වත්කම් අපහායනය

SLFRS 9 අනුව ණයකර ආයෝජන සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන වෙනත් මූල්‍ය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා මණ්ඩලය ප්‍රතිභාගයන් වාර්තා කරයි.

**ඉදිරි දැක්මක් සහිත අවස්ථා ඇතුළත් කිරීම**

දරණ ලද අලාභ ආකෘතියට ප්‍රති විරුද්ධව, අනාගත අපේක්ෂිත අලාභ SLFRS 9 විසින් හඳුන්වා දෙන ලද අපේක්ෂිත ණය අලාභ ආදර්ශය යටතේ තක්සේරු කිරීමට අවශ්‍යවේ. එයට ඉදිරිය දකින සාර්ව ආර්ථික දත්ත සහ ආයතනයට සෘජුව සම්බන්ධ නොවන උපකල්පන භාවිතය අවශ්‍ය වේ. මෙය ආර්ථික සාධක ගැලපීම හරහා හානිකරණය ගණනය කිරීම තුලට ඇතුළත් කෙරේ.

**ණය සුරැකුම්පත් තුළ අයෝජනය සඳහා අපහායන එළඹුම (FVTPL නොවන)**

බාහිර ණය ශ්‍රේණිගතකරණ දත්ත වෙන්කිරීම් ස්ථාපිත කිරීමට භාවිතා කළ හැකිය. තවද, ණය ශ්‍රේණිගතකරණය පිරිහීම, ප්‍රකාශිත මූල්‍ය සහ වෙනත් තොරතුරු ණය අවාදනම තුළ සැලකියුතු වැඩිකිරීම් තක්සේරු කිරීමට සහ ජීවකාල වෙන්කිරීමක් සිදු කිරීම පිණිස උපකරණ ආයෝජන ශ්‍රේණියක්ද යන්න සමාලෝචනය කළ යුතුව ඇත. බාහිරි ශ්‍රේණිගතකරණ දත්ත නොමැතිකම තුළ, පැහැර හැරී අනුපාත අපේක්ෂිත ණය අලාභ ස්ථාපිත කිරීම පිණිස ව්‍යුහගත ක්‍රම/ ණය විසිරීම්/ ණය ලකුණු භාවිතා කරමින් ස්ථාපිත කළ යුතුව ඇත.

**අපේක්ෂිත ණය පාඩුවල මූලික සංරචක**

- **ගෙවීම් පැහර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම**
  ණයකර, ස්ථාවර තැන්පතු සහ ණය සහ ලැබිය යුතුදේ සඳහා ඓතිහාසික ගෙවීම් පැහැර හැරීමේ දත්ත නොතිබූ හෙයින්, S & P Global Ratings විසින් ප්‍රකාශයට පත්කළ 2018 Annual Gloval Corporate Default Study and Rating Transitionි හි දත්ත භාවිතා කරන ලදි.

- **පාඩු ඇති කරන පැහැරහැරීම (LGD) තක්සේරු කිරීම**
  ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ˜බපසෑ 9 අදාළ කර ගැනිම සම්බන්ධව බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, දත්ත හෝ ආදාන මඳවීම නිසා බලපත්‍රලාභී බැංකුවකට පාඩු ඇති කරන පැහැර හැරීම් ගණනය කරගැනිමට නොහැකිවූ විට, එවැනි බැංකුවක් එවැනි නිරාවරණයක් සඳහා අවම වශයෙන් සියයට 45 ක පාඩු ඇති කරන පැහැර හැරීම් තක්සේරුවක් යොදාගත යුතුය.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2024 අප්‍රේල් 01 දින වනවිට ද 1981 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජක ආයතන 4,526 ක් විසින් මණ්ඩලය වෙත බැර කරන ලද එකතුව රු.මිලියන 516.79 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි. මේ හේතුවෙන් සාමාජික අරමුදල් ශේෂය හා කේවල ගිණුම් ශේෂ එකතුව අතර නොසැසඳීමක් අනාවරණය විය. ඉහත ශේෂය තුල ඇතුලත් වසර 09 ත් 42 ත් අතර කාලයක සිට පැවත එන රු.මිලියන 20 ක ශේෂයක් ද විය.

(ආ) 1982 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවායෝජකයින් හඳුනාගත නොහැකිව 2023 දෙසැම්බර් 31 දිනට V 999 අවිනිශ්චිත ගිණුමෙහි පවතින රු.මිලියන 6.52 ක ශේෂ වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම් දෙකක කරන ලද ආයෝජන සඳහා වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු පොලී ආදායම රු.මිලියන 24.967 ක් හා ඒ සඳහා ප්‍රතිපාදන ගැලපීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 37 ප්‍රකාරව හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැවිලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ පොළී මුදල රු.මිලියන 26.3 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු.මිලියන 9.39 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2022 මාර්තු 15 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද පිරිවැය රු.මිලියන 6.8 ක ලද මෝටර් රථය මණ්ඩලයේ කාර්යයන් සඳහා භාවිතා කර තිබුණද වත්කම තක්සේරු කර ගිණුම්ගත කිරීම 2023 අගෝස්තු මාසයේ දී සිදුකර තිබුණි. ඒ අනුව වත්කම් භාවිතා කල මාස 17 ක් කාලයක් සඳහා ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට

අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 සඳහන් නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල වන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති/රීති විධානයට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත | |
| (i) 08 (එ) වගන්තිය | ගිණුම් වර්ෂයක් අවසානයේ දී සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට ඇති ශේෂය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනට පෙර අරමුදලේ එක් එක් සාමාජිකයා වෙත මණ්ඩලය විසින් නිවේදනය කරනු ලැබිය යුතු වුවත් ස්වයංරැකියා හා සංක්‍රමණික සේවකයන් වෙත 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් ගිණුම් ප්‍රකාශ මෙතෙක් නිකුත් කර නොතිබුණි. |
| (ii) 37 (අ) වගන්තිය | දායක මුදල් වලට අදාල වාර වාර්තාවක් සපයන ලෙස මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝග මත සේවායෝජකයෙකු විසින් නියෝගයේ සඳහන් කාල සීමාව තුල වාර වාර්තා සැපයීම සිදුකල යුතු වුවත් 2015 සිට 2022 වර්ෂයන්ට අදාලව ආයතන 3,810 ක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කරන ලද රු.මිලියන 262.74 ක මුදලකට අදාලව වාර වාර්තා මණ්ඩලය වෙත මෙතෙක් ඉදිරිපත් කර නොතිබීමෙන් සාමාජිකයින් වෙත 2024 මාර්තු 06 දින වන විටත් මුදල් විභජනය කර නොතිබුණි. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය | 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2023 වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සිදුකල යුතු වුවද 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් ඌනතා අයිතම 100 ක් සහ අතිරික්තතා අයිතම 60 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට ලයිස්තුගත සමාගම් 11 ක සිදු කර තිබූ ආයෝජනයන්ගේ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 641 ක් වූ කොටස් වලට අදාලව 2023 වර්ෂයේ ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. 2015 සහ 2019 වර්ෂවල සිට 2023 දක්වා නොකඩවා ලාභාංශ නොලැබූ සමාගම් එක බැගින්ද, 2020 සහ 2021 වර්ෂවල සිට 2023 දක්වා නොකඩවා ලාභාංශ නොලැබූ සමාගම් දෙක බැගින් ඒ තුළ විය.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට ඒකක 4,705,833 ක පිරිවැය රු. මිලියන 142.6 ක් ඒකකභාර අරමුදලේ ආයෝජන සඳහා 2023 වර්ෂයේ ලාභාංශ ලැබී නොතිබුණි. එම ඒකකභාර අතුරින් National Equity Fund හි සිදුකළ ආයෝජන සඳහා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම ලාභාංශ නොලැබීමෙන් එම ලාභාංශ ආදායම් සාමාජිකයා වෙත ලැබී නොතිබුණි.

(ඇ) සේවායෝජක හා සාමාජික ගිණුම්, සාමාජික අරමුදල වඩාත් නිවැරදිව හා විශ්වාසනීයව පවත්වාගෙන යාම, සාමාජිකයින් හා සේවායෝජකයින් සඳහා මාර්ගගත සන්නිවේදන ක්‍රම මගින් පද්ධතිය හා සම්බන්ධ වීමට සැලැස්වීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා මණ්ඩලය 2016 වර්ෂයේ දී අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘති කටයුතු ආරම්භයේ සිට මේ දක්වා මණ්ඩලය විසින් දෘඩාංග මිලදී ගැනීම හා පුහුණු කටයුතු වෙනුවෙන් රු.මිලියන 183.28 ක් වැයකර තිබුණද වර්තමානය වනවිටත් ව්‍යාපෘති අරමුණු සාර්ථක ලෙස නිමකර පද්ධතියේ මෙහෙයුම් ක්‍රියාවලිය තහවුරු කර ගැනීමට හා පද්ධතිය සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 03. වෙනත් කරුණු

(අ) 2022 වර්ෂය අවසානය වනවිට මණ්ඩලයේ ලියාපදිංචි සේවායෝජක සංඛ්‍යාව වූ 189,850 න් සියයට 66 ක් හෙවත් 125,850 ක් අක්‍රිය සේවායෝජකයින් විය. මණ්ඩලය විසින් ලියාපදිංචි සේවායෝජක ආයතන යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල පවතින වසර 20 කට වැඩි ශේෂවල එකතුව රු.මිලියන 3.83 ක් වූ අතර අදාල සාමාජිකයින් හඳුනාගෙන මෙම මුදල නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස ප්‍රතිලාභීන් 1,253 කට අදාලව රු.මිලියන 23.37 ක මුදලක් ගෙවිය යුතුව පැවති අතර 2024 මාර්තු 31 දිනට ප්‍රතිලාභීන් 1,240 කට අදාලව එම ශේෂය රු.මිලියන 23.043 කි. මෙම ශේෂය තුල වසර 07 ත් 28 ත් අතර කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 826 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 9.9 කි. දිගින් දිගටම පවතින මෙම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඈ) කුලියට ලබාගත් ගොඩනැගිලි 05 ක පමණ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමෙන් මණ්ඩලයේ සේවාව ලබාගැනීමට පැමිණෙන සේවක දෙපාර්ශවයටම අපහසුතා පැන නගින බැවින් සේවක අර්ථසාධක අරමුදල සමග එකම ස්ථානයක සේවා සැපයීමේ පහසුව සලකා 2020 සැප්තැම්බර් මස සිට මෙහෙවර පියස ගොඩනැගිල්ලේ මහල් 5 ක මණ්ඩලයේ කාර්යාලයන් ස්ථාපනය කර ඒ සඳහා මසකට කුලී මුදල් ලෙස රු.මිලියන 10.3 ක් ගෙවනු ලැබේ. එසේ වුවද නැවතත් කටුබැද්ද හා මහරගම ප්‍රාදේශීය කාර්යාල 2021 දෙසැම්බර් සිට 2023 නොවැම්බර් දක්වා වර්ෂ 3 ක කාලයකට නැවත කටුබැද්ද හා මහරගම ප්‍රදේශවල කුලී ගොඩනැගිලිවල ස්ථාපනය කර මසකට පිළිවෙලින් රු. 120,000 ක හා රු. 100,000 ක බැගින් කුලී ගෙවමින් පවත්වාගෙන යාමට කළමනාකරණය කටයුතු කර තිබුණි. නමුත්, කටුබැද්ද කාර්යාලය 2023 ඔක්තෝබර් 30 දින සිට හා මහරගම කාර්යාලය 2023 අප්‍රේල් මස සිට එම කුලී ගොඩනැගිලිවලින් ඉවත්කර මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර තිබීමෙන් කටුබැද්ද කාර්යාලයට රු.මිලියන 2.04 ක් හා මහරගම කාර්යාලයට රු.මිලියන 1.7 ක් ද වශයෙන් අතිරේක ලෙස ගෙවීමට මණ්ඩලයට සිදුවී තිබුණි.

(ඉ) ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබාගත් ගොඩනැගිලි 04 ක ගිවිසුම කාල සීමාව දීර්ඝ කර ඇති නමුත් අවශ්‍යතා ප්‍රකාරව ගිවිසුම ලියාපදිංචි කිරීම 2024 මාර්තු මස වනවිටත් සිදුකර නොතිබීමෙන් වලංගු ගිවිසුම රහිතව පවත්වාගෙන යන කාලය වෙනුවෙන් ගෙවූ කුලී මුදල රු.මිලියන 5.26 ක් විය. නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කුලී පදනමින් පවත්වාගෙන යනු ලබන මණ්ඩලයේ ලේඛනාගාරය සඳහා 2022 අප්‍රේල් සිට 2023 දෙසැම්බර් දක්වා විධිමත් කුලී ගිවිසුමකට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතරම, එම කාලයට අදාලව ගෙවිය යුතු හිඟ කුලී මුදල රු.මිලියන 4.06 ක් විය.

(ඊ) මණ්ඩලයට අයත් නවම් මාවතෙහි පිහිටි ඉඩමක පවත්වාගෙන යනු ලබන රථගාලෙහි වාහන නැවතුම් පහසුකම් ලබාගන්නා ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතරම එම ගනුදෙනුකරුවන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.මිලියන 8.096 ක මුදලින් 2024 ජුලි 09 දිනවන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 3.73 ක් විය. මේ තුල 2017 සිට 2022 වර්ෂ වලට අදාලව අයවිය යුතු මුදල රු.මිලියන 1.04 කි. 2016 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාල පරාසයට අදාලව රු. 912,514 ක හිඟහිටි මුදල් පවතින ගනුදෙනුකරුවන් 15 ක් මගින් ආරක්ෂණ තැන්පතු මුදල් අයකරගැනීමට ද කටයුතු කර නොතිබුණු අතර ගනුදෙනුකරුවන් 38 කගෙන් රු.මිලියන 2.4 ක ලැබිය යුතු කුලී මුදල් පැවතුණු අතර එය ලබාගත් ආරක්ෂිත තැන්පතු මුදල ද ඉක්මවා තිබුණි.

(උ) මණ්ඩලයේ සක්‍රීය සාමාජිකයින්ගේ දූදරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා නංවාලීමේ අරමුණින් වාර්ෂිකව සිසුන් 7,000 කට රු. 12,000 බැගින් ශිෂ්‍යත්ව දීමනා ලබාදීමේ යෝජනා ක්‍රමය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 172.6 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ තුල ඇතුලත් 2020, 2021 හා 2022 වර්ෂවල ප්‍රතිලාභ ඉල්ලුම් කල සිසුන් 7,383 කට ගෙවිය යුතු මුදල් මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

(ඌ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා වන වෛද්‍ය සහනාධාර ක්‍රමය යටතේ බිල්පත් ප්‍රතිපූර්ණයේ දී එක් සාමාජිකයෙකුගෙන් මෙම යෝජනා ක්‍රමය සඳහා අයකරන මුදල රු. 30 සිට රු. 150 දක්වා වැඩිකර තිබූ නමුත් 2022 වර්ෂයේ හා 2023 වර්ෂවලදී වෛද්‍ය ප්‍රතිපූර්ණ මුදලින් සියයට 97 ක හා 95 ක දායකත්වයක් මණ්ඩලය විසින් දරා තිබුණි. 2023 වර්ෂයේ දි මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 128.55 ක් වූ අතර, සාමාජික දායකත්වය රු.මිලියන 6.77 ක් විය. 2023 අගෝස්තු 15 දින නිකුත් කරන ලද පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශ චක්‍රලේඛ ලිපි අංක 2013/14 මගින් සාමාන්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදය යටතේ පැවති විශේෂ උපකරණ හා නිවැරදි කිරීමේ

උපකරණ වියදම් රෝහල්ගත වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබාදීමේ දී උපරිමයක් නියම කිරීමට කටයුතු නොකිරීම තුලින් 2023 සැප්තැම්බර් සිට එම උපකරණ සඳහා ඉහළ වටිනාකමක් සහිත බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට සිදුවී තිබුණි.

(එ) සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන නමුත්, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 5 (2 ) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණ ද 2023 වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි.

(ඒ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary Dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(ඔ) 2023 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැව්ලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන් අයවිය යුතු හිඟ පොලී මුදල රු.මිලියන 26.29 ක් විය. මේ සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දින අදාල ආයතන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් වීම මත කරන ලද සාකච්ඡා අනුව හිඟ මුදල ගෙවීමට පියවර ගන්නා ලෙස නියම කර තිබුණද 2024 වර්ෂයේ ජුනි මස විගණන අවස්ථාව වන විටත් මෙම මුදල් මණ්ඩලය වෙත අයවී නොතිබුණි.

(ඕ) 2002 වර්ෂයේ කල්පිරීමට යටත්ව සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17 ක් සඳහා හා 2007 වර්ෂයේ දී කල්පිරීමට යටත්ව ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 සඳහා අයවිය යුතු පොළී මුදල් පිළිවෙලින් රු.මිලියන 15.21 ක් හා රු.මිලියන 0.37 ක් විය. මෙම ආයතනය ඇවර කිරීම සඳහා 2008 ඔක්තෝබර් 03 දින දිසා අධිකරණයේ නියෝග ලබාදී තිබුණ ද 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි. මේ නිසා සාමාජිකයන් වෙත ගෙවිය යුතු ප්‍රතිලාභ අඩුවී තිබුණි.

(ක) සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව පවත්වාගෙන යන ගිණුම් 7,566 කට අදාලව රු.මිලියන 41.22 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට පැවති අතර, 2015 වර්ෂය දක්වා හඳුනාගත නොහැකි එම සාමාජික ගිණුම් පරිගණක පද්ධතියේ අගුළු දැමීමට ක්‍රියාකර ඇති බව 2024 අප්‍රේල් 29 දිනැතිව විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අනාවරණය විය. 2024 මැයි 04 දින වනවිටත් මෙම මුදල් හඳුනාගෙන සාමාජිකයින්ට බැර කර නොතිබුණි.

(ග) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් AX සිට XX දක්වා තාවකාලික ගිණුම (Dummy Accounts) පවත්වාගෙන යන අතර, 2023 දෙසැම්බර් 31 දිනට එවැනි සේවායෝජකයින් 28,994 ක් විසින් එවන ලද දායක මුදල් එකතුව රු.මිලියන 309.97 ක් විය. මේ තුල වසර 8 ත් වසර 41 ත් අතර කාලයට අදාල ශේෂ එකතුව රු.මිලියන 209.95 ක් විය. මෙම තාවකාලික ගිණුම්වල (Dummy Accounts) පවතින දායක මුදල් නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැරකිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් මෙතෙක් හඳුන්වා දී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 2023 විගණකාධිපති වාර්තාව **සම්බන්ධයෙන් කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම**

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

අ) 1981-2014 දක්වා කාලපරිච්ඡේදයට අදාලව විභජනය නොකල දායක මුදල් ශේෂය රු.මිලියන 13.773ක් වූ අතර එම මුදලින් රු.මිලියන 10ට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් එක් සේවායෝජක ආයතනයකට අදාලව විභජනය කළයුතු මුදල් වේ.

තවද, 2015-2022 දක්වා තවදුරටත් විභජනය කළයුතු මුදල් ශේෂය රු.මිලියන 503.018කි. එසේ විභජනය කිරීමට නොහැකිව තවදුරටත් ඉතිරි වී ඇති මුදල් යම් අවස්ථාවක සේවායෝජක විසින් බැර වියයුතු සාමාජිකයන්ගේ විස්තර අපවෙත ඉදිරිපත් කළහොත් අදාල සාමාජිකයන්ගේ ගිණුම්වලට විභජනය කිරීම වර්තමාන ක්‍රමවේදය වේ.

සාමාජිකයන්ගේ නම සහ වලංගු හැඳුනුම්පත් අංකය නොමැතිව ඇති සාමාජික ගිණුම් දැනට පරිගණක පද්ධතියේ අගුලු දමා තිබෙන අතර යම් අවස්ථාවක සේවායෝජක විසින් සාමාජිකයන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවක හෝ අනන්‍යතාවය තහවුරු කරන අවස්ථාවකදී එසේ අගුලු දමා තිබෙන සාමාජික ගිණුම් තොරතුරු ලබාදෙන සාමාජිකයාගේ අගුලු ඉවත් කර නිවැරදි සාමාජිකයාගේ නම, හැඳුනුම්පත් අංකය ඇතුලත් කර ගිණුම් යාවත්කාලීන කිරීමට පියවර ගනු ලැබේ.

ආ) මණ්ඩලයේ දැනුවත් වීමකින් තොරව සේවායෝජකයින් විසින් සිදුකර තිබූ බැරකිරීම් වලට අදාලව අංක V 999 හා V 100 දරන අවිනිශ්චිත ගිණුම් දෙකෙහි රු.6,525,131.00ක් වූ ශේෂයක් 2023.12.31 දිනට පවතී.

එම මුදලින් 1982 සිට 2006 දක්වා කාලය තුල සේවායෝජකයින් විසින් සිදුකර ඇති ගෙවීම්වල ශේෂය වෙනස් කිරීමට නොහැකි වන පරිදි පරිගණක පද්ධතිය තුල (AS 400) අගුලු දමා තිබේ.

එසේම 2020 සිට 2022 දක්වා කොවිඩ් වසංගත තත්වය පැවතීම හේතුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත ලබාගත් සෘජු තැන්පත්කිරීම් හේතුවෙන් හඳුනා නොගත් තැන්පත් දායක මුදල් ශේෂය 2023.12.31 දිනට රු.389,412/-කි. එම ගෙවීම් වලට අදාල විස්තර වරින්වර සේවායෝජකයින් විසින් සපයනු ලබන අතර, නිවැරදි සේවායෝජකයින් හඳුනාගැනීමෙන් පසු නිවැරදි සේවායෝජක ගිණුම්වල ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි.

ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අනෙකුත් වත්කම්වල හිග ආදායම් ශීර්ෂය යටතේ (මූල්‍ය තත්ව ප්‍රකාශනයේ අංක 21.1) ආයෝජනය සඳහා ලැබිය යුතු පොළී ආදායම වූ රු.මිලියන 24.97ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම නිවැරදිව ගලපා තිබේ.

විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| ඇල්කඩුව වැවිලි සමාගම | 9.39 |
| එම්.බී.එස්.එල්.වනික් | 0.21 |
| වනික් ඉන්කෝපරේෂන් | 15.00 |
| රජයේ පොරොන්දු නෝට්ටු | 0.37 |
| **එකතුව** | **24.97** |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව ලැබිය යුතු ආදායම පිළිබඳව හෙළිදරව් කිරීම ගිණුම්කරණ සටහනක් මගින් දැක්වීමට ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට කටයුතු කරනු ලබයි.

ඈ) මෙම සමාගමේ ණයකර වල කරන ලද ආයෝජිත මුදල වෙනුවෙන් 14.48%ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ අර්ධ වාර්ෂිකව ගෙවීමට නියමිතව තිබූ ණයකරවලට අදාල පොළී මුදලින් එක් වාරිකයක් පමණක් ගෙවීමෙන් පසුව එම මුදල් ගෙවීම සමාගම විසින් පැහැර හරින ලදී. ඒ අනුව මෙම හිග පොළී වාරික මුදල අයවිය යුතු පොළී මුදලක් ලෙස ගිණුම්ගත කිරීම 2002.12.31 දින දක්වා රු.17,797,556.16ක් ලෙස සඳහන් කර තිබේ. ඉන්පසුව 2011, 2019 සහ 2020 වර්ෂවලදී සමාගම සමග එකග වූ පසු නැවත ගෙවීමේ සැලසුමකට (Repayment Plan) අනුව පිය වූ මුදල් ප්‍රමාණය අඩු කළ පසු ඉතිරි පොළී ලෙස රු.9,391,556.16ක් වූ මුදලක් මූල්‍ය ප්‍රකාශණවල 2023.12.31 දින වනවිට අයවිය යුතු ලෙස පෙන්වා තිබේ.

එසේ වුවද ආයෝජන අංශයේ මෙම හිග මුදල් පිළිබඳ වාර්තා 2010 වසර දක්වා එනම් ආයෝජිත මූලික ණය ප්‍රාග්ධනයේ අවසාන වාරිකය පියවීම දක්වා වන කාලපරිච්ඡේදය දක්වා ගණනය කර තිබේ. ඒ අනුව නැවත වාරික වශයෙන් ගෙවන ලද මුලු පොළී මුදලද අඩු වූ පසුව ඉතිරි ශේෂය ලෙස රු.26,293,485.00ක මුදලක් ආයෝජන කොට්ඨාශයේ වාර්තාවල ඇතුලත් කර තිබේ. මෙම හිග පොළී මුදල් වෙනුවෙන් සමාගමෙන් අයකර ගතහැකි උපරිම ප්‍රමාණයක් නැවත ලබාගැනීමේ අරමුණින් මෙම ගණනය කිරීම් ආයෝජන කොට්ඨාශය විසින් 2010 වසර දක්වා සිදුකර තිබේ.

මෙම හිග පොළී මුදල් අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරනු ලබන අතර මෙතෙක් ගිණුම්ගත කර ඇති මුදල ඉක්මවා කිසියම් මුදල් ප්‍රමාණයක් ලැබෙන්නේ නම් එයද නියමිත පරිදි ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

ඉ) 2022 මාර්තු 15 දිනැති අංක MF1/03/05/05-01 දරන ලිපිය මගින් මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද මෝටර් රථයේ පිරිවැය රු.මිලියන 6.8කි. මුදල් අමාත්‍යාංශය විසින් මෝටර් රථය පවරන ලද දිනට මෝටර් රථයේ වටිනාකම ගිණුම්වලට ඇතුලත් කිරීම සඳහා තක්සේරු වටිනාකමක් නොමැති වූ අතර, එම වාහනය රක්ෂණය කිරීමේදී ලබා ගන්නා ලද තක්සේරු වටිනාකම පදනම් කරගෙන 2023 අගෝස්තු මාසයේදී මෙම වත්කම ගිණුම්ගත කරන ලදි. වාහනයේ තක්සේරු වටිනාකමක් නොමැති වූ බැවින් ගිණුම්වලට ගැනීමට පෙර භාවිතා කල කාලය වෙනුවෙන් මෙම වත්කම වෙනුවෙන් ක්ෂය ගැලපීම් සිදුකල නොහැකි විය.

2.2.2 අ) i පරිගණක පද්ධතියේ පැවැති දෝෂය නිවැරදි කර 2021, 2022, 2023 වර්ෂ සඳහා පොළී හා ලාභාංශ ඇතුලත් කර අදාල වාර්ෂික ගිණුම් ප්‍රකාශ 2023 වර්ෂයට නිකුත් කිරීමට මේ වනවිට කටයුතු කරමින් පවතී.

ii 1980 අංක 46 දරන පනතේ 37 (අ) වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කිරීමට සේවායෝජකයන් බැඳී සිටී. එසේ වාර වාර්තා ඉදිරිපත් කරන ලෙස සේවායෝජකයන් වෙත ලිපි යොමු කරනු ලබන අතර ඉන්පසු අවසාන සිහිකැදවීම යොමුකර එම අවසාන සිහිකැදවීමේ දිනයේ සිට සති දෙකක් ඇතුලත එම වාර වාර්තා අපවෙත යොමු නොකරන සේවායෝජකයන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට 37 (ඇ) වගන්තිය යටතේ ප්‍රතිපාදන සැලසී තිබේ.

එහෙත් එසේ නඩු පැවරීමෙන් පසු සේවායෝජක වෙත මාස 06ක සිර දඩුවමක් හෝ රු.1000.00ක දඩයක් නියම කරනු ලැබේ. එසේ දඩුවම් නියම කළද, වාර වර්තා නැවත ගෙන්වා ගැනීමට මෙම පනත මගින් ප්‍රතිපාදන සපයා නොමැත.

අප විසින් සේවායෝජකයන් වෙත දුරකතන ඇමතුම් ලබාදීම, ලිපි යොමු කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම, විද්‍යුත් තැපෑල මගින් ලිපි යොමු කිරීම යනාදී ක්‍රමවේද මගින් වාර වාර්තා ලබාගැනීමට කටයුතු කරනු ලබයි.

ආ) 2022 වර්ෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ නිරීක්ෂණද සමග විගණන කමිටුවේ සාකච්ඡාවට භාජනය වූ අතර 2023 වෙනුවෙන් පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හෙළිදරව් වූ කරුණුද සැලකිල්ලට ගෙන මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරමි.

2.2.4 (අ) 2015 හා 2019 වසරේ සිට ලාභාංශ ලැබී නොමැති සමාගම් දෙකම සංචාරක හෝටල් ක්ෂේත්‍රයට අයිති සමාගම් දෙකකි.පසුගිය වර්ෂයන්හිදී පැවැති Covid 19 වසංගතය සහ රටෙහි පැවැති ආර්ථික අර්බුදය හේතුකොටගෙන හෝටල් ව්‍යාපාර ක්ෂේත්‍රය බිඳ වැටුණු අතර, 2023 වසරේ අගභාගයේ සිට නැවතත් සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයේ වර්ධනයක් පෙන්නුම් කරනු ලබන බැවින් හා වර්තමානයේ මෙම සමාගම්වල කොටස් වෙළඳපොළ මිළද ඉහළ අගයක් ගෙන තිබෙන බැවින්ද 2024 වසරේ මෙම සමාගම්වලින් ලාභාංශ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2023 වසරේ ලාභාංශ නොලැබූ සමාගම් අතරින් සමාගම් දෙකක (Dialog හා Aitken Spence) කොටස් විකුණා ප්‍රාග්ධන ලාභ ලෙස රු. මිලියන 16.2ක් උපයාගෙන තිබේ.

එසේම 2024 ජුනි මස වනවිට සමාගම් 3කින් (Dialog" Wind Force" Access) රු.මිලියන 72.8ක් මුදල් ලාභාංශ (Cash Dividends) ලෙසද, තවත් සමාගමක් රු.මිලියන 1.06ක් කොටස් ලාභාංශ (Script Dividends) ලෙසද ප්‍රකාශයට පත්කර තිබුණි.

විස්තර පහත දැක්වේ.

| | සමාගමේ නම | මාසය | එක් කොටසකට ලාභාංශය (රු) | ලාභාංශ මුළු මුදල (රු) |
|---|---|---|---|---|
| Cash Dividends | Dialog | ජූනි | 1.34 | 40,514,373.00<br>25,325,226.00 |
| | Wind Force | පෙබරවාරි | 1 | 6,984,333.00 |
| | Access | පෙබරවාරි | 0.5 | 926,526.50 |
| Scrip Dividends | Peoples Insurance | මැයි | 0.5 | 1,062,601.00 |

මෙකී සමාගම්වල කොටස් වෙළඳපොළ මිළ තත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නා විටකදී ප්‍රාග්ධන ලාභ සහිතව විකුණා ප්‍රාග්ධන ලාභ ලබාගැනීමට කටයුතු කරනු ලබන බවද කාරුණිකව සදහන් කරමි.

(ආ) National Equity Fund ඒකකභාර වෙළඳපොළ මිළ ගණන් 2020.12.31 සිට අඛණ්ඩව ඉහළ අගයක් පෙන්නුම් කර තිබෙන අතර ඉදිරියේදී ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට සහ ලාභාංශ ද ප්‍රකාශයට පත්කරනු ඇතැයි ද අපේක්ෂා කරමු.

National Equity Fund ඒකකභාරවල වෙළඳපොළ මිළ ගණන් (2020 - 2023)

| වර්ෂය | ඒකක මිළ (රු) |
|---|---|
| 2020.12.31 | 31.4972 |
| 2021.12.31 | 39.2032 |
| 2022.12.31 | 32.0678 |
| 2023.12.31 | 34.7683 |

ඇ) 2023 වර්ෂයේ දෙවන භාගය තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට සැලසුම් කල නමුත් පහත සදහන් කරුණු එය ආරම්භ කිරීමට බාධාවක් වී පැවතුණි.

**i ප්‍රධාන වෙනස්කම් තුනක් (03) පද්ධතිය හා සජීවිව යාමට පෙර සම්පූර්ණ කලයුතුව තිබීම**

පද්ධතියට අදාල ව්‍යාපාර අවශ්‍යතා පිළිබද විශ්ලේෂණය 2017 වර්ෂයේ පමණ සිදුකර ඇති බවත් මේ වනවිට ඇති ව්‍යාපාර අවශ්‍යතාවය හා පද්ධතිය අතර පරතරයක් පවතී. මෘදුකාංග අවශ්‍යතා පිරිවිතරද මේ අනුව සැකසීම සිදු වී තිබේ. ඊට අමතරව භාවිතා කරනු ලබන තාක්ෂණය හා ක්‍රමවේද තුලද පැහැදිලි වෙනස්කම් සිදුවී තිබේ. ඊට සමගාමීව දැනට භාවිතා කරන පද්ධතිය තුල යම් යම් වෙනස්කම් සිදුවුවද නව පද්ධතිය තුල එම වෙනස්කම් නොකඩවා සිදුවීමක් වී නොමැත. මේ අනුව හදුනාගත් වෙනස්කම් තුනක් සදහා Change Request නොමැතිව පද්ධතිය හා සජීවී යාම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි විය.

**ii ව්‍යාපාර ක්‍රියාවලි සිතියම්ගත කිරීම සහ මෙහෙයුම් පරිසරය සැකසීම සිදුකළ යුතුව තිබීම**

පද්ධතියේ පරිශීලක පුහුණුව 2023 වර්ෂයේ මුල් භාගය තුල සිදුකිරීමෙන් පසුව පද්ධතිය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබදව අවබෝධය ඒ ඒ ව්‍යාපාර ඒකකවල පරිශීලකයන්ට ලබාදීම සිදුවිය. ඒ අනුව නව පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට පෙර ව්‍යාපාර ක්‍රියාවලින් සිතියම්ගත කිරීම සහ මෙහෙයුම් පරිසරය සකසා අවසන් කිරීම සිදුකළ යුතුව තිබුණි.

මීට අමතරව නව පාරිභෝගික සේවා ඒකකයක් පද්ධතියට අනුකූලව සකස් කර තිබීමද වැදගත් අවශ්‍යතාවයක් වූ අතර ඒ වනවිට එයද සකසා නොතිබුණි.

iii නව පද්ධතිය තුල ඇතිවිය හැකි නීතිමය ගැටලු සහ පනතේ විධිවිධාන හා ඇති අනුකූලතාව පිළිබඳ අධ්‍යනයක් සිදුකළ යුතුව තිබීම

නව පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සිදුවන ක්‍රියාවලින්ගේ වෙනස්කම් හේතුවෙන් මෙම පද්ධතියේ එක් එක් මොඩියුලය තුල පැන නගින නීතිමය ගැටලු නිවැරදිව හදුනාගෙන ඒවාට පිළියම් යෙදිය යුතු බවට තීරණය විය. ඊට අමතරව මෙම නව පද්ධතිය හා ක්‍රියාවලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත හා තිබෙන අනුකූලතාව පිළිබඳව ද මනා අධ්‍යනයක් සිදුකළ යුතුව තිබුණි.

iv පරතර විශ්ලේෂණය සහ මෙහෙයුම් අත්පොත සැකසීමේ අවශ්‍යතාවය

නව පද්ධතිය තුල සියලු වැඩ ප්‍රවාහ ආවරණය වන පරිදි පරික්ෂා කිරීම සඳහා මෙහෙයුම් අවස්ථා සැකසීම සහ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය සාර්ථකව මෙහෙයවීම සඳහා මෙහෙයුම් අත්පොත සැකසීමේ අවශ්‍යතාවය දැඩිව ඇතිවිය. මක්නිසාද යත් මෙහෙයුම් පිළිගැනීමේ පරික්ෂා ලේඛණ අත්සන් කිරීම සඳහා පද්ධතිය 100% දැඩි පරික්ෂාවකට ලක් කිරීම අත්‍යාවශ්‍ය වී තිබුණි.

ඉදිරියේදී පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය හා අනෙකුත් ක්‍රියාවලින් අවසන් කිරීමෙන් පසුව පද්ධතිය සජීවී මෙහෙයුම් ක්‍රියාවලියක් බවට පත්වූ විට මෙම පද්ධතියෙන් අපේක්ෂා කළ සියලු අරමුණු සාර්ථක ලෙස නිමකර සමස්ථ සාමාජිකයන්ට එහි ප්‍රතිලාභ උදාකර ගත හැකිවේ.

03. අ) 2019 සිට 2022 වර්ෂය දක්වා පැවැති Covid 19 තත්වය, ආර්ථික අර්බුදය හේතුකොටගෙන එම වකවානුවේදී ඇතැම් සේවායෝජක ආයතන වසා දමා තිබූ අතරම, ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සේවායෝජක ආයතන පරික්ෂාවද සිදුකළ නොහැකි වී තිබුණි. 2022 ජූලි මාසයේ සිට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු නැවත ආරම්භ කර අක්‍රිය සේවායෝජක ආයතන සක්‍රිය කර ගනිමින් පවති.

2022 වර්ෂයේ සිට 2024.07.31 දින දක්වා වූ කාලපරිච්ඡේදයේදී ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සක්‍රිය තත්වයට පත්කරන ලද සේවායෝජකයින් සංඛ්‍යාව 44,001කි.

ආ) හිමිකම් නොපාන සාමාන්‍ය ප්‍රතිලාභ මුදල් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය මගින් දුරකතන ඇමතුම් ලබාදීම, ලිපි යැවීම සහ ඡන්ද හිමි නාමලේඛණ ඔස්සේ සාමාජිකයන්ගේ ලිපිනයන් තහවුරු කරගෙන එම මුදල් නිරවුල් කිරීමට ගත් උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මේවනවිට එම සංඛ්‍යාව අඩු වී තිබේ.

ඇ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ නිරවුල් කිරීමට ප්‍රධානතම ගැටලුව වී තිබෙනුයේ ඉදිරිපත් කර තිබෙන අයදුම්පත් හා අමුණා තිබෙන ලේඛණ වල අඩුපාඩු වන අතරම ප්‍රතිලාභීන් විසින් ඉල්ලීම් නොකිරීමටද ඊට හේතු වී තිබේ.

ඈ) 2020 වර්ෂයේ ආරම්භ වූ කොරෝනා වසංගතයේ දෙවන අධියර 2021 වර්ෂයේ නැවත හිස එසවීමත් සමග විශාල පිරිසක් ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීම නුසුදුසු වූ බැවින් ඊට විකල්පයක් ලෙස කටුබැද්ද ප්‍රදේශයෙන් හා මහරගම ප්‍රදේශයෙන් ගොඩනැගිලි 2021.12.01 වන දින සිට කුලී පදනම මත ලබාගන්නා ලදි. අවධානම් තත්වය පහව යාමත් සමග එම මහජන සේවාවන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යාමට ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කුලී පදනමින් ලබාගත් ගොඩනැගිලි දෙකෙහි ගෙවීම් කටයුතු නිරවුල් කර හිමිකරුවන් වෙත නැවත භාරදෙන ලදි.

කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිලි 5ක පවත්වාගෙන යනු ලැබූ මණ්ඩලයේ කටයුතු මෙහෙවර පියෙස ගොඩනැගිල්ලට රැගෙන ඒම තුලින් වඩාත් සුහුරු, එකතුකල අගයක් සහිතව කඩිනම් සේවාවක් අරමුදලේ සාමාජිකයන්ට ලබාදීමට හැකි වී තිබේ.

ඉ) ප්‍රාදේශීය කාර්යාලයන් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබාගන්නා ලද,

- ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ බදු ගිවිසුම 2024.05.21 වන දින අත්සන් තබා ලියාපදංචි කර තිබේ.
- 44/5, නාවල කාර්යාලයේ ගිවිසුම 2023.10.13 වන දින අත්සන් තබා ලියාපදංචි කිරීම සඳහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කර තිබේ.

- චෙක්පත් එකතු කිරීමේ කාර්යාලය පිහිටි කොටුව ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම 2023.10.23 වන දින අත්සන් තබන ලද අතර නීතිඥ මහත්මිය විසින් එය ලියාපදිංචිය සදහා යොමුකරන ලදි.

- මාතර ප්‍රාදේශීය කාර්යාලයේ බදු ගිවිසුම 2023.11.13 වන දින අත්සන් තබන ලද අතර එය ලියාපදිංචිය සදහා යොමුකර තිබේ.

තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් යටතේ පැවති නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය 2022 අප්‍රේල් මස සිට නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරා ගන්නා ලද අතර එයට අදාල බදු ගිවිසුම් සකස් කිරීමද නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබයි. අප විසින් 2023.04.10 වන දිනැතිව මේ පිළිබද විමසීම් ලිපි යොමු කරමින් අදාල බදු ගිවිසුම් සකස් කර එවන ලෙස දැනුම් දී තිබේ. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2023.09.21 වන දින එහි සිදුවිය යුතු සංශෝධන කිහිපයක් තිබූ බැවින් ඒ පිළිබදව සදහන් කර අප විසින් ලිපියක් යොමුකර තිබේ. 2024.01.02 වන දින අප මණ්ඩලයේ සභාපති විසින් පළමු ලිපිය නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති වෙත යොමුකරන ලදි. ඒ සදහා ප්‍රතිචාරයක් නොලැබුණු අතර 2024.02.12 වන දිනද නැවත ලිපියක් යොමුකරන ලදි. එම ලිපියට පිළිතුරු ලිපියක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2024.03.07 වන දින අපවෙත යොමුකර තිබූ අතර ඒ මගින් අප විසින් ප්‍රමාද ගාස්තු සදහා දඩ මුදල් අය නොකරන ලෙස කරන ලද ඉල්ලීම ඉහළ කළමනාකාරත්වයට යොමුකර ඇති බවත් අදාල තීරණය ලැබුණු පසුව බදු ගිවිසුම්වලට එළැඹෙන බව දන්වා තිබේ. එහෙත් ඒ පිළිබදව 2024.04.19 වන දින තෙක් පිළිතුරක් නොලැබුණු බැවින් අප විසින් නැවතත් සිහිකැදවීමේ ලිපියක් 2024.04.19 දින යොමුකර තිබේ.

ඊ) නවම් මාවත රථගාල තුල 2024.05.31 දිනට ආයතන 48ක් සදහා වාහන නැවතුම් පහසුකම් ලබාදී තිබූ අතර ෂබාදදර 128 හා ධමචාදදර 229 සදහා පහසුකම් ලබාදී ඇත. තවද රාත්‍රී කාලයේදී නවතනු ලබන මෝටර් රථ 11ක්, ත්‍රීරෝද රථ 2ක් සමග යතුරුපැදි 61ක් සදහාද පහසුකම් ලබාදී තිබුණි.

නවම් මාවත රථගාල භාවිතා කරන ගණුදෙනුකරුවන් සමග වලංගු ලිඛිත ගිවිසුමකට එළැඹී නොමැති අතර ඉදිරියේදී වලංගු ගිවිසුමක් නීති අංශයේද සහයෝගය සහිතව සකසා ප්‍රායෝගික භාවිතයට ගැනීමට අපේක්ෂා කරන්නෙමු.

2023.12.31න් අවසන් වර්ෂය සදහා 2015 සිට අයවිය යුතු මුදල රු.3,726,584.83ක් වන අතර මේ තුල 2017 සිට 2023 වර්ෂයට අදාලව අයවිය යුතු මුදල රු.1,007,624.83කි.

හිග මුදල් අයකර ගැනීම සදහා අදාල ආයතන වෙත දිගින් දිගටම දැනුම් දී තිබූ මුත් මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැති ආයතන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට විශේෂ වැඩපිළිවෙලක් යටතේ අදාල අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදී තිබේ.

උ) උසස්පෙළ සමත් දරුවන් සදහා '**නිපුණතා සවිය**' අධ්‍යාපන වැඩසටහන මගින් වෘත්තීය නිපුණතාවයක් ලබාදීම සදහා මණ්ඩලය කටයුතු කරන ලදි. නිශ්චිත අධ්‍යාපනික කටයුත්තකට හෝ වෘත්තීය පුහුණුවකට යොමු කිරීම පදනම් කොටගෙන මණ්ඩලයේ මුදල් ලබාදීම වඩාත් අර්ථාන්විත බව අපගේ විශ්වාසයයි.

මෙම වැඩසටහනින් පළමු වර්ෂයේදී අඩු අයදුම්පත්‍ර ප්‍රමාණයක් ලැබුණද ඉදිරියේදී මේ සදහා වැඩි අයදුම්පත්‍ර ප්‍රමාණයක් ලැබීම අපේක්ෂා කරමි.

ඌ) 2019-2020 දේශීය ආර්ථික අර්බුදය මත ඇතිවූ උද්ධමනකාරී තත්වය හා Covid 19 තත්වය යටතේ වෛද්‍ය ගාස්තු, ඖෂධ හා උපකරණ වියදම් අසාමාන්‍ය පරිදි වැඩිවීම මත උපරිමය රු.60,000.00ක් වූ සාමාන්‍ය වෛද්‍ය වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට ප්‍රමාණවත් නොවීම මත, විශේෂ උපකරණ හා නිවැරදි කිරීම් උපකරණ වියදම්, රෝහල්ගත වියදම් යටතේ ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබාදෙන ලදි.

සියලුම වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම පූර්ව විගණනයට ලක් කිරීමෙන් අනතුරුව ගෙවීම් කරනු ලබන අතර රු.20,000.00 ඉක්මවූ බිල්පත් පූර්ව විගණනයෙන් අනතුරුව වෛද්‍ය කමිටුවේ අනුමැතියට යොමු කරනු ලැබේ.

ඇස්කණ්ණාඩි සදහා රු.50,000.00 ක උපරිමයකට යටත්ව එක් අයකුට වසර දෙකකට වරක් පමණක් වියදම් ප්‍රතිපූර්ණය කළහැකි අතර, රු.50,000.00 ඉක්ම වූ දන්ත වෛද්‍ය ප්‍රතිකාර සදහා වියදම් දැරීමට පෙර වෛද්‍ය කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.

ඉහළ වටිනාකමක් සහිතව සාවද්‍ය වෛද්‍ය බිල්පත් ඉදිරිපත් කරන ලද පාර්ශවයන්ට විරුද්ධව විනය පියවර ගෙන තිබෙන බවද සඳහන් කරමි.

එ) i ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට අනුව පෙර පැවති තත්වය හා පසුකාලීනව එය සංශෝධනය කිරීම නිසා පවතින තත්වය.

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මුල් පනතේ 5(2) වගන්තියෙහි 'මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය' යනුවෙන් සඳහන් වන අතර එම වගන්තිය 'මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නේය' යනුවෙන් 1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත. ඒ අනුව මෙම සංශෝධනය මගින් සභාපතිධුරය පමණක් දැරූ තැනැත්තාට සභාපතිධුරයට අමතරව ප්‍රධාන විධායක නිලධාරී තනතුරද හිමිවී ඇත.

සස මෙම කාරණය සම්බන්ධයෙන් 2016 අගෝස්තු 26 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී පහත සඳහන් නිර්දේශය කර තිබුණි.

'මූල්‍ය ආයතනයක ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ සභාපති යන තනතුරු දෙකම එකම පුද්ගලයකු විසින් හෙබවීම යෝග්‍ය නොවන බවත් ඒ සම්බන්ධ පනත සංශෝධනය කිරීමකින් මේ තත්වය වෙනස් වියයුතු බවත් කාරක සභාවේ මත විය'

iii පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශයට අදාලව පනත සංශෝධනය කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනාවන්.

මණ්ඩලය විසින් මේ පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කර උක්ත නිර්දේශයට අනුකූලව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5(2) වගන්තිය සංශෝධනය කිරීමට පහත පරිදි යෝජනා ඉදිරිපත් වී තිබුණි.

අ) මණ්ඩලයේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර එකම පුද්ගලයකු විසින් දරනවා වෙනුවට එම තනතුරු සඳහා පුද්ගලයින් දෙදෙනෙකු විසින් දැරිය හැකි පරිදි පනත සංශෝධනය කිරීම.

ආ) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් මේ වනවිට මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීධුරය දරන පුද්ගලයාව පත්කිරීම.

iv පනත සංශෝධනය කිරීම සඳහා මණ්ඩලය විසින් ගෙන ඇති පියවර

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අවසන් වරට 1993 වර්ෂයේදී සංශෝධනය කර තිබෙන අතර, ඒ අනුව පනතේ වගන්ති කිහිපයක්ම සංශෝධනය කිරීම සඳහා 2016 වර්ෂය වනවිට යෝජනා ඉදිරිපත් වී තිබුණි.

යථෝක්ත නිර්දේශය ලැබීමෙන් පසුව 2016 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඇතුලත් වන විෂයභාර අමාත්‍යවරයා හා විෂයභාර අමාත්‍යංශය අවස්ථා ගණනාවකදීම වරින්වර වෙනස් වූ අතර ඒ අතරතුර කාලයේ ධූරවල සිටි අධ්‍යක්ෂකවරුන් හා සභාපතිවරුන්ද අවස්ථා කිහිපයකදීම වෙනස් වී තිබේ.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ නිර්දේශයට අනුකූලව ඉහත ආකාරයෙන් පනතේ 5(2) වගන්තිය සංශෝධනය සඳහා යෝජනාවද ඇතුලත් සංශෝධන සඳහා 2021.07.26 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබුණි. එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ යෝජිත සංශෝධන 2021.08.11 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකරනු ලැබීය.

v මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කැඳවීමක් අනුව මෙම යෝජිත සංශෝධන පිළිබඳව සාකච්ඡාවක් 2021.11.23 දින මුදල් අමාත්‍යාංශයේදී පැවැත්වුණු අතර එහිදී ලැබුණු උපදෙස් හා නිර්දේශ අනුව අදාල යෝජනා නැවත සංශෝධනය කරනු ලැබීය.

vi ඒ අනුව යෝජිත සංශෝධන අනුමැතිය සඳහා 2022.05.30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරනු ලැබීය. එහිදී හදිසි අවශ්‍යතාවයක් සේ සලකා ඉලෙක්ට්‍රොනිකව දායක මුදල් හා මාසිකව වාර්තා ඉදිරිපත්

කිරීමට අදාල යෝජිත සංශෝධන සඳහා රෙගුලාසි සකස් කිරීමට උපදෙස් ලැබුණු අතර ඒ වනවිට රටේ උද්ගතව පැවති තත්වය සැළකිල්ලට ගෙන සෙසු යෝජිත සංශෝධන සලකා බැලීම මාස 06ක කාලයක් දක්වා කල්තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය.

vii 2022.06.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත කී යෝජිත සංශෝධන කිහිපයක් සඳහා රෙගුලාසි සකස් කිරීමට අනුමැතිය ලැබුණු අතර එම තීරණය භාණ්ඩාගාර ලේකම් වෙත යොමුකර රෙගුලාසි සකස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස 2022.08.04 හා 2022.12.14 දිනැති ලිපි මගින් ඉල්ලා සිටිනු ලැබීය. ඒ අනුව 2022.12.22 දින අදාල රෙගුලාසි ගැසට් කරනු ලැබීය.

viii 2022.12.19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මුදල් අමාත්‍යවරයාගේ 2023 අයවැය කථාවේ ඇතුලත්ව තිබූ මණ්ඩලයට අදාල යෝජනාද ඇතුලත් කර නැවත සකස් කරනු ලැබූ පනත සඳහා යෝජිත සංශෝධන සඳහා අධ්‍යක්ෂ අනුමැතිය ලැබුණු අතර පනතේ උක්ත 5(2) වගන්තිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයාගෙන් උපදෙස් ලබාගෙන එම උපදෙස් වලට අනුකූලව අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලැබූ අතර එම තීරණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2022.12.21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබේ. ඒ අනුව මේ වනවිට 2022.12.19 වනදින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කල යෝජිත සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර එම සංශෝධනවලට අදාල මූලික කෙටුම්පත සකස් කර තිබේ.

ix සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධන කිරීමට සමගාමීව පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාව විසින් ලබාදී ඇති උක්ත නිර්දේශයට අනුකූල සංශෝධනද ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2023.04.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කෙරුණු අතර මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් හා උපදෙස් ලිඛිතව ලබාගෙන ඊට අදාල අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට මණ්ඩලය තීරණය කරනු ලැබීය.

x ඒ අනුව 2023.04.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත කාරණය සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය හා යෝජිත සංශෝධන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2023.05.02 දිනැති ලිපිය මගින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමුකරනු ලැබීය.

xi මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මහා භාණ්ඩාගාරයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිට පිටපතක් සහිතව 2023.05.15 දිනැතිව යොමුකරනු ලැබූ ලිපිය අනුව මේ වනවිට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සංශෝධනය සඳහා කෙටුම්පත් කර ඇති මූලික කෙටුම්පතට උක්ත 5(2) වගන්තිය සඳහා යෝජිත සංශෝධනය ඇතුලත් කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස දැනුම් දී තිබේ. ඒ අනුව මේ වනවිට මේ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදුකෙරෙමින් පවතී.

මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව මණ්ඩලය විසින් අඛණ්ඩව පසුවිපරම් කරමින් පවතින බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ඒ) මෙම පහසුකම් ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පවතින දුෂ්කරතා, දැරීමට සිදුවන ප්‍රාග්ධන වියදම් සීමා, නව බඳවා ගැනීමවලට පවතින සීමා, පවතින වැටුප් පරිමාවන් යටතේ එම ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් බඳවා ගැනීම, රඳවා ගැනීම සහ නැවත බඳවා ගැනීමට ඇති අපහසුව සහ මීට අදාල අනිකුත් යටිතල පහසුකම් සපයා ගැනීමේ පවතින ගැටලු වැනි කරුණු සළකා බැලීමේදී මෙම කාර්යය සිදුකිරීම දුෂ්කරව පවතී. ඒ අනුව මෙම පහසුකම වර්තමානයේදී රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයින් යෙදවීමකින් තොරව ලබා ගනු ලබන අතර එම වැඩපිළියෙල තවදුරටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතී.

ඔ) හිග පොළී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සමාගම සමග සාකච්ඡාවක් පැවැති අතර එම සාකච්ඡාවට සහභාගි වූ සමාගමේ නියෝජිතයන් පවසා සිටියේ සමාගමේ වර්තමාන මූල්‍ය තත්වය සැලකීමේදී මෙම පොළී මුදල් පියවීම සඳහා යම්කිසි කාලයක් ගතවිය හැකි බවත් මේ පිළිබඳව අදාල රේඛීය අමාත්‍යාංශය සමග සාකච්ඡා කර සැළැස්මක් ඉදිරිපත් කිරීමට

කටයුතු කරන බවයි. එහෙත් මේ දක්වා මෙම හිඟ මුදල් ගෙවීම පිළිබඳව නව සැළසුමක් සමාගම විසින් ඉදිරිපත් කොට නොමැත.

ඉන්පසුවද, මෙම මුදල් අයකර ගැනීම පිළිබඳව විටින්විට ලිඛිතව හා වාචිකව සමාගම දැනුවත් කර තිබෙන අතර ඉදිරියේදී නැවතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් කර ගනිමින් එම මුදල් අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා සුදුසු පියවරක් ගනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

ඕ) මෙම සමාගම ඈවරකිරීම සඳහා 2008 වසරේදී අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබු මුත් මේ දක්වා ඈවරකරුවකු පත්කොට නොමැත.

පසුකාලීනව මෙම සමාගමේ ණයගැති පාර්ශවයක් විසින් අධිකරණ නියෝගයක් මත රු.මිලියන 42.6ක මුදලක් ඈවරකිරීමේ නඩුවේ බැරට තැන්පත් කර තිබේ. එම මුදලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කිසියම් හිමිකමක් තිබේ නම් එම මුදල අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව 2024.03.12 දිනදී නීතිපති උපදෙස් පතා ලිපියක් යොමුකර තිබේ.

ක) 1.2 (අ) පිළිතුර අදාල වේ.

ග) සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කර නොමැති ආයතන පරීක්ෂා කිරීමෙන් පසුව එම ආයතනවල හිඟ මුදල් අයකර ගැනීම සඳහා 2015ට පෙර XX  හා ZZ නිකුත් කරනු ලැබූ අතර 2015න් පසු AX - WX අංක නිකුත් කිරීම සිදුකරනු ලබන අතර එසේ අයකර ගනු ලබන මුදල් එම ගිණුම් යටතේ පවත්වාගෙන යනු ලබයි. එමෙන්ම එම ආයතන සේ.අ.අ. යටතේ ලියාපදිංචිය සිදුකරන තෙක් සාමාජික ප්‍රතිලාභ ගෙවීම් සිදුකිරීමද එම අංක යටතේම සිදුකරනු ලබයි.

එම ගිණුම් යටතේ අයකර ගනු ලබන සියලුම ගෙවීම් අදාල සාමාජික ගිණුම්වලට බැර කිරීම සිදුකරනු ලබන අතරම සාමාන්‍ය සේවායෝජක ගිණුම් යටතේ ගෙවීම් කර ඇති සාමාජිකයින්ට සැපයෙන සියලුම ප්‍රතිලාභද ලබාදෙන අතර එම සාමාජිකයින්ට හිමි සියලුම වරප්‍රසාද ද හිමිවේ.

එමෙන්ම එම අංක යටතේ ගිණුම්ගත කර ඇති මුදල්වලට අදාල සේ.අ.අ.  හඳුනාගැනීම නිරන්තරයෙන් සිදුවන අතර ඒ සඳහා පහත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

i ආයතන සේ.අ.අ යටතේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව නිවැරදි සේවායෝජක අංකය අප විසින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ලබන අතර ප්‍රාදේශීය කාර්යාල හා සේවායෝජකයින් විසින් නිරන්තරයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් අනුව අදාල අංක යටතේ ගෙවිම් කර ඇති මුදල් පිළිබද තොරතුරු සේ.අ.අ. වෙත යොමුකිරීම සිදුකරනු ලබයි.

ii අදාල අංක යටතේ ගෙවිම් සිදුකරනු ලබන සේවායෝජක ආයතන පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවක් එක් එක් ප්‍රාදේශීය කාර්යාල විසින් එම ප්‍රාදේශීය කාර්යාල බලප්‍රදේශය තුල පිහිටි කම්කරු කාර්යාල වෙත සැපයෙන අතර එම අංක වෙනුවෙන් සේ.අ.අ. අංක ලබාගැනිම එහි අරමුණයි.

**ඩී.එල්.පී. රෝහණ අභයරත්න**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2023

**EMPLOYEES' TRUST FUND BOARD**

19 - 23 Floors, "MEHEWARA PIYESA",
P.O.Box 807, Kirula Road, Narahenpita, Colombo 05.
Tel: 011 7747201 | Fax: 011 2503917
Email: finance@etfb.lk
Web: www.etfb.lk